# එල්ලංගා පැතිකඩ සහා මූලික සංවර්ධණ සැලැස්ම

## පරංගියවාඩිය එල්ලංගාව





පරංගියවාඩිය එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටුව

හොරොව්පොතාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය

**ජනවාරි 2025**

## උපදේශණය

ජ්‍යේෂ්ඨ උපදේශක සරත් වික්‍රමරත්න - ලෝක බැංකුව

උතුරුමැද පලාත් නියෝජ්‍ය අධ්‍යක්ෂ ආර්.පී.එම්. දිසානායක මහතා - CSIAP

## දායකත්වය

ආයතන සංවර්ධණ හා හැකියා වර්ධන විශේෂඥ ඩී.වී.බන්දුලසේන
**CSIAP** - ප්‍රධාන කාර්යාලය

## සංස්කරණ දායකත්වය - උතුරුමැද පලාත් කාර්යාලය - CSIAP

කෘෂිකර්ම විශේෂඥ ජේ.ඒ.එන්.කේ.ජයසිංහ

ව්‍යාපෘති ජ්‍යේෂ්ඨ තාක්ෂණ නිලධාරී අධිකාරී මහතා

සමාජ ආරක්ෂණ හා ස්ත්‍රී පුරුෂ සමාජ භාවය සංවර්ධණ නිලධාරිනී
එම්.එම්.පී.එන්.දිල්රුක්ෂි මහත්මිය

## සහාය

කළමනාකරණ සහකාර නිලූකා නිලානි මුණසිංහ මහත්මිය

කාර්යාල සහායක ඊ.එම්.ජී.ඩී.ඒකනායක

## සම්බන්ධීකරණය, සිතියම් කරණය, සංස්කරණය හා ඉදිරිපත් කිරීම

ආයතන සංවර්ධණ හා හැකියා වර්ධන විශේෂඥ යු.අයි.රත්නායක -
**CSIAP** උතුරු මැද පලාත

## <u>පටුන</u>

**1. හැඳින්වීම** **(4-17)**
1.1. එල්ලංගා කලමණාකරන කමිටුවක අවශ්‍යතාවය
1.2. එල්ලංගා කලමණාකරන කමිටු පිහිටුවීම
1.3. එල්ලංගා පැතිකඩ සකස් කිරීමේ අවශ්‍යතාවය
1.4. එල්ලංගා පැතිකඩ සහ එල්ලංගා කලමණාකරන මූලික සැලැස්ම සැකසීමේ වැදගත්කම
1.5. එල්ලංගා පැතිකඩ සහ එල්ලංගා කලමණාකරන සැලැස්මක් සකස් කිරීමේ අරමුණු
1.6. ප්‍රදේශයේ පවතින එල්ලංගා පිලිබඳ මූලික හැඳින්වීම
1.7. පරංගියවාඩිය එල්ලංගාව
1.8. පරංගියවාඩිය එල්ලංගාව තිරසර ලෙස කලමනාකරණය කිරීමේ වැදගත්කම

**2. පරංගියවාඩිය එල්ලංගා කලමනාකරණ සැලැස්ම සැකසීමේ දී අනුගමනය කරන ලද ක්‍රමවේදය** **(18 - 20)**
2.1. පරංගියවාඩිය එල්ලංගා පැතිකඩ සකස් කිරීම
2.2. හරස්කඩ චාරිකාව

**3.0 පරංගියවාඩිය එල්ලංගා කලමනාකරණ සැලැස්ම සකස්කිරීම** **(21-40)**
3.1. පරංගියවාඩිය එල්ලංගාව මුහුණදෙන මූලික අභියෝග හඳුනා ගැනීම
3.2. පරංගියවාඩිය එල්ලංගාවේ වර්තමාන පැතිකඩ

**4.0 එල්ලංගා පද්ධතිය දැනට මුහුණ දෙන ගැටළු** **(41-44)**
4.1. එල්ලංගාවේ වනාන්තර විනාශය
4.2. වැව් රක්ෂිත වගාබිම් බවට පරිවර්තනය කිරීම
4.3. වනාන්තර ගිනි තැබීම්
4.4. බඩඉරිඟු වගාව හා ඒ හා බැඳුනු පාරිසරික විනාශය
4.5. වන සම්පත් භාවිතය නිසා පාරිසරික ගැටළු වල ප්‍රබලත්වය හා ජන ජීවිතයේ පැවැත්මට එහි ඇති බලපෑම
4.6. සමාජ ආර්ථික ගැටළු (Socio-economic issues.)
4.7. හරස්කඩ සංචාරයේදී හඳුනාගත් උග්‍ර ගැටලු

**5.0 එල්ලංගා පද්ධතිය තුළ දැනටමත් CSIA ව්‍යාපෘතිය මගින් සිදුවන ඉදිකිරීම් කටයුතු සහා ක්‍රියාකාරකම්** **(45-46)**
5.1. ඉදිකිරීම් කටයුතු

**6.0 පරංගියවාඩිය එල්ලංගා කළමනාකරණ සැලැස්ම** **(47-50)**
6.1. මූලික පරමාර්ථ
6.2. එල්ලංගා පද්ධති කළමණාකරණ සැලැස්ම

**7.0 ඇමුණුම්** **(51- 59)**

# පරංගියවාඩිය එල්ලංගා පැතිකඩ හා එල්ලංගා කලමනාකරණ මූලික සැලැස්ම


## 1. හැඳින්වීම

එල්ලංගා පද්ධතියක් යනු ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ ක්ෂුද්‍ර ජල පෝෂක ප්‍රදේශයක් තුළ සංවිධානය කරන ලද සම්බන්ධිත වැව් මාලාවකි. සෘතුමය දිය පහරකින් ජලය ගබඩා කිරීම සඳහා වැව් භාවිතා වේ. ගබඩා කර ඇති ජලය පහළ ඇති අනෙකුත් වැව් වෙත ගෙන යන අතර එම ජලය විවිධ කාර්යයන් සඳහා ඒවා භාවිතා වේ.

වැව් බොහෝ විට හුදකලා වැව් නොවන අතර ඒවා විශාල අන්තර් සම්බන්ධිත වැව් පද්ධතියක කොටසක් වන අතර එය 'වැව් කඳුරැල්ල පද්ධතිය' ලෙස හැඳින්වේ. එය ක්ෂුද්‍ර ජල පෝෂකයක් තුළ සංවිධානය කර ඇති වැව් මාලාවක් සමඟ සම්බන්ධ වී ඇත. ‘එල්ලංගා පද්ධතියක්’ යනු වැව් කළමනාකරණයේදී භාවිත වන සාම්ප්‍රදායික ඒකකයයි. ඈත අතීතයේ සිට එය හැඳින්වෙන්නේ ‘එල්ලංගාව’ යනුවෙනි.

*CM මද්දුම බණ්ඩාර, 1985; පානබොක්කේ (2001)*

**රූපසටහන් : 01සාම්ප්‍රදායික එල්ලංගාවක හරස්කඩක්**




ප්‍රාථමික ජල මාර්ගයක හෝ ප්‍රාථමික ජල මාර්ග ජාලයක පිහිටා ඇති ජල විද්‍යාත්මක ලෙස එකට බැඳුනු කුඩා හා මධ්‍ය පරිමාණයේ වැව් පද්ධති හෝ කුඩා වැව්, මධ්‍ය ප්‍රමාණයේ වැව් සහ අමුණු පද්ධති හා අමුණු වලින් සමන්විත වූ ද්විතිය හා තෘතිය ජල මාර්ගයකට ජලය මුදා හරිනු ලබන මධ්‍ය ජල ධාරා ප්‍රදේශය එල්ලංගාව ලෙස හඳුන්වනු ලබයි. එල්ලංගාව අපගේ වාරි ශිෂ්ඨාචාරයේ විශිෂ්ඨ නිර්මාණයක් වන අතර එමගින් මුලු පරිසර පද්ධතියේම තිරසාර පැවැත්ම තහවුරු කරයි.

වාරි ශිෂ්ඨාචාරයේ ඉතාමත් විශිෂ්ඨ නිර්මාණයක් වන එල්ලංගාව ආරක්ෂා කර සංරක්ෂණය කර මනා කලමණාකරනයක් තුලින් සංවර්ධන කටයුතු තිරසර ලෙස පවත්වා ගෙන යාම සහ එල්ලංගා කලමණාකරනය පහසු කිරීම සඳහා එල්ලංගාවේ ප්‍රතිලාභීන්ගෙන් සහ සියලුම රාජ්‍ය හා පෞද්ගලික ආයතන වලින් සමන්විත එල්ලංගා කලමණාකරන කමිටු පිහිටු වීමට ලෝක බැංකු ආධාර යටතේ කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය

කටයුතු කරනු ලබයි. එල්ලංගාවේ සියලු පාර්ශව එකතු වී සියලු සම්පත් මනාව කලමණාකරනය කිරීම එල්ලංගා කලමණාකරන කමිටුවල මූලික වගකීම වන අතර එම කාර්යය පහසු කිරීම සඳහා අවශ්‍ය සැලසුමක් සැකසීමට අවශ්‍ය තොරතුරු එකතු කිරීම සඳහා එල්ලංගා පැතිකඩක් (Profile) ව්‍යාපෘති බල ප්‍රදේශයේ සෑම එල්ලංගාවක් සඳහාම සකස් කරනු ලබයි. එල්ලංගා පැතිකඩක් සැකසීමේ ප්‍රධාන අපේක්ෂාව වන්නේ එල්ලංගා කලමණාකරන සැලැස්මක් සැකසීමයි. ඒ අනුව එල්ලංගා කලමණාකරන කමිටුව හරහා එල්ලංගාව හා ජලධාරා ප්‍රදේශය ආරක්ෂා කිරීමේ අපේක්ෂාවෙන් සහභාගීත්ව ප්‍රවේශයකින් යුක්තව එල්ලංගා කලමණාකරන සැලැස්මක් සකස් කරනු ලබයි.

### 1.1. එල්ලංගා කලමණාකරන කමිටුවක අවශ්‍යතාවය

එල්ලංගාවක්, ජල පෝෂක ප්‍රදේශයේ මතුපිට මෙන්ම භූගත ජල මට්ටම සුරක්ෂිත කරන අතර එහි ප්‍රතිපලයක් ලෙස ජනතාවට ආහාර පිසීම වැනි ගෘහ කටයුතු සහ වගා කටයුතු වලට ජලය සපයනු ලබයි. රූප සටහන් අංක 1 අනුව රාජ්‍ය,පෞද්ගලික සහ ප්‍රතිලාභී පාර්ශවකාර ආයතන එල්ලංගාව ආරක්ෂා කරනු ලබයි. එසේ වුවද අංක 3 කොටසේ සඳහන් පරිදි නියමිත ලෙස පාර්ශවකරුවන්ගේ අවධානය යොමු නොවීම සහ ස්වාභාවික සහ මානව ක්‍රියාකාරකම් හේතුවෙන් එල්ලංගාව දැඩි ලෙස පරිහානියට පත්ව ඇත. එල්ලංගාව ආරක්ෂාව කිරීම සඳහා පාර්ශවකරුවන් සම්බන්ධ වීමට වඩාත් යෝග්‍ය ආයතන ව්‍යුහයක් නොමැති වීම නිසා එල්ලංගාව තව දුරටත් හානියට ලක් විමේ ප්‍රවනතාවක් පවතී. එම නිසා එල්ලංගා කළමනාකරණ කමිටුව වැනි සම්බන්ධීකරණ ආයතනයක් එල්ලංගාව ආරක්ෂා කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීමට වඩාත් අවශ්‍ය වී ඇත.

### 1.2. එල්ලංගා කලමණාකරන කමිටු පිහිටුවීම

එල්ලංගා පද්ධතියක් යනු අතීතයේ සිට වාරි කලමණාකරනයේදී භාවිතා කරන ලද සාම්ප්‍රදායික ජල කලමණාකරන ක්‍රමවේදයකි. එල්ලංගාව යන වචනය සිංහල භාෂාවේ වචන දෙකක් එනම්, "**එල්ලන්**" සහ "**ගාව**" යන වචන දෙක එකතු වී සකස් වී ඇත. "**එල්ලන්**" යනු එල්ලෙන යන්නයි. "**ගාව**" යනු එකකට පසු අනෙක් ඒවා යන්නයි. එල්ලංගාව යන වචනයේ අදහස වනුයේ ඉහල සිට පහලට එකිනෙකට සම්බන්ධිත ලඟින් පිහිටි වැව් පද්ධතියක් යන්නයි. ශ්‍රී ලංකාවේ මෙම වාරි තාක්ෂණ එක්සත් ජාතීන්ගේ ආහාර සහ කෘෂිකර්ම සංවිධානය (FAO) විසින් ලෝක උරුමයක් ලෙසද නම් කර ඇත. එල්ලංගා කලමණාකරන කමිටු පිහිටුවීමේ අදහස වනුයේ දශක කිහිපයකට පෙර පැවති ලෙස එල්ලංගාව පවත්වාගෙන යාම සඳහා එල්ලංගාවට කලමණාකරන සම්බන්ධිත සියලුම පාර්ශවකරුවන් පොදු සංසදයක් ලෙස වැඩ කර එල්ලංගාව ආරක්ෂා කිරීමට කටයුතු කිරීමයි. එසේම එල්ලංගා කලමණාකරන කමිටු නීතිගත කිරීමටද අවශ්‍ය කටයුතු සිදු කරනු ලබයි. පරිපාලන දිස්ත්‍රික්ක 11 ක අදාල ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටු වල සහාය ඇතිව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අංක 06/2023 දරන චක්‍ර ලේඛය අනුව (ඇමුණුම 01) එල්ලංගා කලමණාකරන කමිටු 53 ක් පිහිටුවීමට ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව බලාපොරොත්තු වේ. ලෝක බැංකු මූල්‍ය ආධාර මත කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව සහ අදාල පාර්ශවකරුවන් සමඟ සමීපව කටයුතු කර එල්ලංගා කලමණාකරන කමිටු 53 පිහිටුවීමේ සමස්ථ ක්‍රියාවලිය සඳහා සහාය ලබාදේ.

එල්ලංගා කලමණාකරන කමිටු සාමාජිකත්වය පහත ආයතන නියෝජිතයින්ගෙන් සමන්විත වේ. ඒවා නම් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව, පළාත් සහ අන්තර් පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ගොවි සංවිධාන, ප්‍රජා මූල සංවිධාන, ජල සම්පත් මණ්ඩලය, ආපදා කලමණාකරන කාර්යාංශය, පොලිස් දෙපාර්තමේන්තුව, ජාතික ජලජ ජීවී සංවර්ධන අධිකාරිය, පරිසර අධිකාරිය, පෞද්ගලික අංශය, ඉඩම් පරිහරණ සැලසුම් දෙපාර්තමේන්තුව යන

ආයතන වේ. එල්ලංගා කලමණාකරන කමිටුවක මූලික වගකීම වනුයේ එල්ලංගාව ආරක්ෂා කිරීම සහ පවත්වාගෙන යාම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීම සඳහා උපාය මාර්ගික මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීමයි. රාජ්‍ය ආයතන,පෞද්ගලික අංශය, ප්‍රජා මූල සංවිධාන ඇතුලු පාර්ශවකරුවන් රාශියකට එල්ලාංගාව ආරක්ෂා කිරීමේ හා කළමනාකරණ කිරීමේ වගකීම පැවරී ඇති අතර ප්‍රධාන පාර්ශවකරුවන් පහත රූප සටහන් 1 මගින් දක්වා ඇත.

***රූපසටහන් 1: එල්ලංගා පද්ධති කලමණාකරනය සඳහා වර්තමානයේ සම්බන්ධිත ප්‍රධාන ආයතන***




## 1.3 එල්ලංගා පැතිකඩ සකස් කිරීමේ අවශ්‍යතාවය

එල්ලංගාව ආරක්ෂා කිරීම සඳහා අතීතයේ පැවති සාම්ප්‍රදායික ග්‍රාමීය ආයතන ව්‍යුහය හා සමාජ ආර්ථික වත් පිලිවෙත්, සම්ප්‍රදායන් හා චාරිත්‍ර වාරිත්‍ර නිසා එල්ලංගාවේ තිරසර පැවැත්ම තහවුරු වූ අතර ක්‍රමානුකූලව මෙම තත්වයන් වෙනස් වීමත් සමග එල්ලංගා පද්ධතිය හායනයට පත් විය. වර්තමානය වන විට එය ඉතාමත් වේගයෙන් හායනයට ලක් වෙමින් පවතී. එල්ලංගා පද්ධති නැවත ප්‍රතිෂ්ඨාපනය

කිරීමේදී, සම්පත් හායනය වලක්වා ගැනීමේදී හා මනා කලමණාකරනයක් කිරීමේදී එල්ලංගාවේ වර්තමාන තත්වය සහ පවතින ගැටළු හා ඒවා අතර ඇති වඩාත් උග්‍ර ගැටළු හඳුනා ගැනීම ඉතාමත් වැදගත් වේ.මේ සඳහා එල්ලංගාවේ භූගෝලීය ගැටළු, ජල විද්‍යාත්මක ගැටළු, පරිසර විද්‍යාත්මක ගැටළු හා සමාජ ආර්ථික ගැටළු හඳුනා ගත යුතු වේ.එසේම එල්ලංගාව තුල වර්තමානයේ සිදුවන මානව ක්‍රියාකාරකම් පිලිබඳව, විවිධ ක්‍රමවේද ඔස්සේ එනම් හරස්කඩ චාරිකා, ද්විතීය දත්ත සහ කුඩා කණ්ඩායම් සාකච්ඡා මගින් තොරතුරු එකතු කර එල්ලංගා පැතිකඩක් සකස් කරනු ලබයි. මෙම එල්ලංගා පැතිකඩ එල්ලංගා පද්ධති කලමණාකරනයේදී මූලික අවශ්‍යතාවයකි.

### 1.4 එල්ලංගා පැතිකඩ සහ එල්ලංගා කලමණාකරන මූලික සැලැස්ම සැකසීමේ වැදගත්කම

එල්ලංගා පැතිකඩ, ස්වාභාවික හා මානව ක්‍රියාකාරකම් නිසා එනම් වර්ෂාව අඩු වීම, අවිධිමත් හේන් වගාව, වනාන්තර එළිපෙහෙලි කිරීම, සත්ව පාලන කටයුතු, කැලි කසල බැහැර කිරීම, පස් කැපීම, පතල් කැපීම සහ වැව් ආශ්‍රිත පරිසර පද්ධතිය විනාශ කිරීම යනාදී හේතු නිසා එල්ලංගාව හානියට පත්වී ඇති ආකාරය, එහිදි පාර්ශවකරුවන් වගකිව යුතු ක්ෂේත්‍ර හා ඔවුන්ගේ වගකීම් පිලිබඳව විවිධ මානයන් ඔස්සේ පාර්ශවකරුවන් හා ගොවි ප්‍රජාව අතර තොරතුරු හුවමාරු කරගැනීම සඳහා බෙහෙවින් ඉවහල් වේ. එල්ලංගා පැතිකඩ ප්‍රතිපත්ති සම්පාදකයින්ට, ප්‍රාදේශීය දේශපාලකයින්ට, පාර්ශවකාර ආයතන වලට සහ ගොවි ප්‍රජාවට එල්ලංගාව පිලිබඳව නිවැරදි අවබෝධයක් ලබා ගැනීමට සහ එල්ලංගාව ආරක්ෂා කර ගැනීම සඳහා නිවැරදි තීරණ ගැනීමට තවදුරටත් වැදගත් වේ. එල්ලංගා පද්ධතිය ආරක්ෂා කර ගැනීමට සාමූහිකව හා සහභාගීත්ව ප්‍රවේශයකින් යුක්තව එල්ලංගා කලමණාකරන මූලික සැලැස්මක් සැකසීම (Cascade Management Plan) සඳහා එල්ලංගා පැතිකඩ විශේෂයෙන්ම වැදගත් වේ. මෙහි සඳහන් මූලික එල්ලංගා කලමණාකරන සැලැස්ම එල්ලංගා කලමණාකරන කමිටුව විසින් සකස් කරන ලද එල්ලංගා පැතිකඩ පදනම් කරගෙන සකස් කරනු ලබයි.

### 1.5 එල්ලංගා පැතිකඩ සහ එල්ලංගා කලමණාකරන සැලැස්මක් සකස් කිරීමේ අරමුණු

එල්ලංගා පද්ධතියේ සම්පත් ආරක්ෂා කිරීම සහ ඒවායේ තිරසර පැවැත්ම තහවුරු කිරීම සඳහා එල්ලංගා කලමණාකරන වැඩසටහනක් දැඩි ලෙස අවශ්‍ය වී ඇත. එසේම එල්ලංගාවේ සියලුම පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය ඇතිව සුදුසු ආයතන ව්‍යුහයක් හරහා ඒකාබද්ධව ප්‍රවේශයකින් යුක්තව එල්ලංගාව කලමණාකරනය කල යුතුවේ. ඒ සඳහා පහත අරමුණු ඉටු කර ගැනීම සඳහා එල්ලංගා පැතිකඩ සහ කලමණාකරන සැලැස්ම සකස් කරනු ලබයි.

1.5.1. ප්‍රධාන වශයෙන් භූගෝල විද්‍යාත්මක, ජල විද්‍යාත්මක, පරිසර විද්‍යාත්මක, බෝග වගා රටාවන් සහ මානව ක්‍රියාකාරකම් නිසා එල්ලංගා පද්ධතියට වන හානි පිලිබඳ තොරතුරු සහ භූගෝලීය තොරතුරු පද්ධතිය (GIS) උපයෝගී කරගෙන සකස් කරන ලද සිතියමක්ද, ඇතුලත් විස්තරාත්මක එල්ලංගා පැතිකඩ (Cascade Profile) පාර්ශවකාර සංවිධාන වල ප්‍රයෝජනය සඳහා සැකසීම මගින් පාර්ශවකාර සංවිධාන වලට එල්ලංගාව සුරැකීමට පහසුකරණය කිරීම .

1.5.2. එල්ලංගා පද්ධතියේ වඩාත් උග්‍ර ගැටළු විසඳීම සඳහා වන උපාය මාර්ගික මැදිහත් වීම්, ඒ සඳහා වන දල වියදම් ඇස්තමේන්තු, ක්‍රියාත්මක කිරීමේ කාල වකවානු සහ සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා මැදිහත්විය යුතු පාර්ශවකාර ආයතන යන මූලිකාංග ඇතුලත් එල්ලංගා පද්ධති කලමණාකරන මූලික සැලැස්මක් (Cascade Management Plan) සැකසීම.


1.5.3. එල්ලංගා පද්ධතියේ වඩාත් උග්‍ර ගැටළු සහ ඒවා මගින් එල්ලංගා පද්ධතියට සිදු වී ඇති සහ සිදුවෙමින් පවතින හානි පිලිබඳව ප්‍රතිපත්ති සම්පාදකයින් හා පාර්ශවකරුවන් දැනුවත් කිරීම.

### 1.6 ප්‍රදේශයේ පවතින එල්ලංගා පිලිබඳ මූලික හැඳින්වීම:

හෙක්ටයාර 2312 ක් පුරා පැතිර ඇති පරංගියවාඩිය එල්ලංගාව ඊට නිරිතදිගින් පිහිටා ඇති හෙක්ටයාර 4708 ක් විශාල නබඩවැව එල්ලංගාවට යාබදව ඇත. හොරොව්පොතාන ප්‍රාදේශීය ලේකම්

කොට්ඨාශයේ පරංගියවාඩිය ග්‍රාම නිලධාරි කොටසේ ආනලොන්දාව වනාංතර වලට මායිම්ව මෙම එල්ලංගාව පිහිටා ඇත. පරංගියවාඩිය එල්ලංගාවේ වැව් 9 ක් ඇත. මධ්‍ය වාරි ජලාශයක් වන පරංගියවාඩිය වැවත්, වැවක සලකුණක් පමණක් ඉතිරිව ඇති වන රක්ෂිතයේ පිහිටි විහාරවැවත්, වන රක්ෂිතයේ පිහිටි දැනට වගාකටයුතු සඳහා භාවිතාවන බ්‍රහ්මනයාගම වැව හා කුඩානිකවැවත් ව්‍යාපෘතිය මගින් පුනරුත්ථාපනය කරන ලද නිකවැව, කුඩාවැව හා වැව උඩහවැවත් ඇලවෙලි පද්ධතියේ කොටසක් පමනක් පුනරුත්ථාපනය කරන ලද කලුවාවල වැවත් වේ. (වැව් බැම්ම ඇතුලු මූලික අයිතමයන් මෑතකදී පලාත් සභාව මගින් පුනරුත්ථාපනය කර තිබුණි) බ්‍රහ්මනයාගම වැව, කුඩානිකවැව, නිකවැව හා වැව උඩහවැව ඔලගම් වේ. මෙම එල්ලංගාවන් 6 ම දැක්වෙන සටහනක් සිතියම් අංක 01 හි දක්වා ඇත.

***සිතියම් 01- පරංගියවාඩිය එල්ලංගාව ආශ්‍රිතව පිහිටා ඇති අනෙකුත් එල්ලංගා***




## 1.7. පරංගියවාඩිය එල්ලංගාව

අනුරාධපුර දිස්ත්‍රික්කයේ හොරොව්පොතාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පරංගියාවාඩිය ග්‍රාමනිලධාරි වසම ආවරණය කරමින් පරංගියවාඩිය එල්ලංගාව පිහිටා ඇත. හෙක්ටයාර 2312 වපසරියක විහිදුනු පරංගියවාඩිය එල්ලංගාවේ වැව් 09ක් පවතින අතර වැව් 8 ක් පමණක් සක්‍රියව පවතී. එල්ලංගාවේ ඉහලම උනන්තාංශය වාර්තා වන්නේ නිකවැව ආසන්නයෙන් ඇති මීටර 100 සමොච්ච රේඛාවය. එමෙම්ම එල්ලංගාවේ අවසාන වැව වන බ්‍රහ්මනයාගම කුඹුරු යායේ මීටර 58 ක ස්ථානීය උසක් මීටරේ සිතියමේ සඳහන් වීම අනුව එල්ලංගාවේ ඉහලම වැව වන නිකවැවේ සිට බ්‍රහ්මනයාගමවැව දක්වා මීටර 42ක ආනතියක් පවතී.

මෙම එල්ලංගාව අධ්‍යනයේදී දර්ශනය වනුයේ කලුවාවලවැව, බ්‍රහ්මනයාගම සහ කුඩානිකවැව හුදකලා වැව් ලෙසය. එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු ගොඩනැගීමේදී මෙම පද්ධතිය තනි එල්ලංගාවක් ලෙස සැලකීමට හේතු වූයේ පරංගියවාඩිය වැවේ කුඹුරු යාය සිට බ්‍රහ්මනයාගම දක්වා වූ කුඹුරු යාය (කලුවාවලවැව කුඹුරු යායද ඇතුලුව) පරංගියවාඩිය වැවේ ජලය තාවකාලික අමුණු කීපයක් මගින් පරිහරණය කරන බැවින් එකකට එකක් බැදී ඇත. මේ

නිසා මෙම වැව් සියල්ල එකම එල්ලංගා පද්ධතියක් ලෙස සැලකීම වාරි ජලය කළමණාකරනය වඩා ඵලදායි කිරීම සඳහා පහසු වනු ඇත.

මෙම එල්ලංගාවේ සියලුම වැව් වලට ස්වභාවික වන ආවරණය සහිත ජල පෝෂක ප්‍රෙද්ශයක් පැවතීම විශේෂිතය. මෙම ඒල්ලංගාවේ පෝෂක ප්‍රදේශය, වර්ග කි.මී. 1200 වඩා විශාල ආනලොන්දාව අධි ආරක්ෂිත වනාන්තර ප්‍රදේශයේ බටහිර බෑවුමේ කොටසක් වීම ජලය ප්‍රමාණවත් පරිදි පැවතීමටත් මාස් මෝසමේදී අධික වැසි අවස්ථාවන් වලදී මෙම එල්ලංගාවේ වී වගාබිම් ගංවතුර තර්ජනයකට මුන දීමටත් හේතු වී ඇත. මෙම ඒල්ලංගාවේ නැගෙනහිර තීරුවේ ආනලොන්දාව අධි ආරක්ෂිත වනාන්තර ප්‍රදේශයේ සිට ආරම්භවන ජලමූලාශ්‍ර 36 ට අධික ප්‍රමාණයක් මෙම ඒල්ලංගාවේ වගාබිම් පෝෂණය කරයි. මෙහි බටහිර තීරුවේ තවත් ජල පෝෂක මාර්ගයන් 4 ක් හඳුනාගත හැකි අතර නබඩවැව ඒල්ලංගාවෙන් පෝෂණය වන වී වගාබිම් වල පහුවතුර අමුණු මගින් මෙම ඒල්ලංගාවට සම්බන්ධ කර ඇත. මෙම ජල මූලාශ්‍ර මගින් මෙම ඒල්ලංගාවේ ඇති මධ්‍ය වාරිමාර්ග ජලාශය වන පරංගියවාඩිය වැවත් කලුවාවල වැවත් ප්‍රධාන කරගත් මෙම ඒල්ලංගාවේ වී වගාබිම් තීරුවේ අවසාන කොටස නබඩවැව ඒල්ලංගාවේ අවසාන වැව වන සියඹලෑව වැවෙන්ද පෝෂණය වේ.

*වගුව 1: නබඩවැව එල්ලංගාව පිලිබඳ පරිපාලන තොරතුරු*


| මූලික තොරතුරු | විස්තර | විශේෂිත කරුණු |
|---|---|---|
| දිස්ත්‍රික්කයේ නම | අනුරාධපුර | – |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නම | හොරොව්පොතාන | – |
| මැතිවරණ කොට්ඨාශයේ නම | හොරොව්පොතාන | – |
| ගංගා දෝණියේ නම | යාංඔය | – |
| එල්ලංගාවේ නම | පරංගියවාඩිය | – |
| **මූලික තොරතුරු** | **විස්තර** | **විශේෂිත කරුණු** |
| ගොවිජන සේවා බල ප්‍රදේශයේ නම | පරංගියවාඩිය | – |
| ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ නම | පරංගියවාඩිය | |
| එල්ලංගාවේ භූමි ප්‍රමාණය | හෙක්.2312 | |
| එල්ලංගාවේ වැව් ප්‍රමාණය | 09 (මධ්‍ය වාරි ඒකක් සහා වනාංතර මායිම් තුල වැව් 2 ක් ඇත) | |
| කෘෂිකාර්මික කටයුතු සඳහා භාවිතා කරන වැව් සංඛ්‍යාව | 07 | මීට අමතරව ප්‍රධාන අමුණු කීපයක්ම ඇත. |
| පැහැදිලිව හඳුනාගත හැකි ජල පෝෂක ප්‍රෙද්ශ | මෙම ඒල්ලංගාවේ ජල මූලාශ්‍ර ආරම්භක ස්ථාන 36 ක් හඳුනාගත හැකි අතර ඉන් 32 ක්ම ආනවිලුන්දාව අධි වන රක්ෂිත කලාපයෙන් පෝෂණය වේ. | |

| | | |
|---|---|---|
| ලඳුකැලෑ | ප්‍රාදේශීය ලේකම් භාරයේ ඇත | |
| එල්ලංගාව තුලින් ජීවනෝපාය සැලසෙන පවුල් සංඛ්‍යාව | 1107 | |

### 1.7.1 පරංගියවාඩිය එල්ලංගා පද්ධතියේ සිතියම

**පරංගියවාඩිය** එල්ලංගා සිතියම වඩාත් නිවැරදි එල්ලංගා සිතියමක් ලෙස යාවත්කාලීන කිරීම සඳහා හරස්කඩ චාරිකාවේදී එකතු කර ගන්නා ලද දත්ත, ගූගල් සිතියම් (Google Base Map), වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ දත්ත හා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ දත්ත භාවිතා කරමින් දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය මගින් සකස් කරන ලද **පරංගියවාඩිය** එල්ලංගා සිතියම, සිතියම් අංක 02 යටතේ පහත දැක්වේ.


***සිතියම් 02- පරංගියවාඩිය එල්ලංගා සිතියම***



### 1.7.2 එල්ලංගාවේ ඉඩම් පරිහරණ රටාව


හෙක්ටයාර 2346 ක ව්‍යාප්තියක් සහිත පරංගියවාඩිය එල්ලංගාව වනාන්තර, කුඹුරු ඉඩම්, ගොඩඉඩම්, වැව්, ලඳුකැලෑ සහා ජනාවාස ලෙස වෙන්කර හඳුනාගත හැකිය. මෙම එල්ලංගාවේ භූමියෙන් හෙක්. 1515 පමන එනම් මුලු බිම් ප්‍රමාණයෙන් 65% කට ආසන්න භූමි ප්‍රමාණයක් වනාන්තර සහා ලඳුකැලෑ වේ. තවත් හෙක්ටයාර 45 ක් පමණ වනාංතර එලිකර අනවසරයෙන් අල්ලාගෙන ඇත. හෙක්ටයාර 110 ක් පමන එනම් 5% ක තරම් සුලු ප්‍රමාණයක් ගොඩබෝග වගාව , ගෙවතු සහ නිවාස සඳහා වෙන් වී ඇත. මෙම එල්ලංගාවේ කෘෂිකර්මාන්තය වී වගාව මත පදනම් වී ඇත. වනාංතර හැර ඉතිරි භූමි ප්‍රමාණය වන හෙක්ටයාර 831 න් 436 ක්ම කුඹුරු ඉඩම්ය (52.5%). එය වනාංතර නොවන භූමියෙන් හරි අඩකටද වැඩිය. එමෙන්ම හෙක්. 240 පමණ දැනට ජලය රැස්කල හැකි වැව් 7 හි ආවරණ භූමියයි. මෙම එල්ලංගා ප්‍රෙද්ශයේ පරංගියවාඩිය මහ විද්‍යාලය හා දේශගුන සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියෙන් ස්,ාපනය කරන ලද යන්ත්‍රෝපකරණ මධ්‍යස්ථානය සහිත ගොවිජන සේවා මධ්‍යස්ථානයත් විහාරස්ථානයත් පොදු පරිහරණ ස්ථාන ලෙස පිහිටා ඇත. මීට අමතරව රු.මී. 60 කට වැඩි වත්කමක් සහිත උපුල් කාන්තා සමිතියේ සහල් සැකසුම් මධ්‍යස්ථානයද මෙම එල්ලංගාවේ ස්ථාපිතය. එල්ලංගාවේ ඉඩම් පරිහරණ රටාව පහත අංක 01 ප්‍රස්ථාර සටහන මඟින් දක්වා ඇත.

***ප්‍රස්ථාර සටහන් 01 - පරංගියවාඩිය එල්ලංගාවේ ඉඩම් පරිහරණ රටාව***




එසේම එල්ලංගාවේ භූමි පරිහරණ රටාව පහත සිතියම් අංක 03හි දැක්වේ.

සිතියම 03 - පරංගියවාඩිය එල්ලංගා සිතියම - ඉඩම් පරිහරණය





මූලාශ්‍රය : ගූගල් සිතියම (Google Base Map), වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ දත්ත, මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ දත්ත හා 2023 දී යාවත් කරන ලද ගූගල් අර්ත් ප්‍රෝ සැටලයිට් සිතියම ඇසුරින් සකස් කරන ලදි.

### 1.7.3 එල්ලංගාවේ ජනගහන විස්තර


හොරොව්පොතාන ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ සම්පත් පැතිකඩේ 2019 දත්තයන් අනුව ගොවි පවුල් 358 පමන මෙම එල්ලංගාවේ ජීවත් වේ. 1149 පමණ ජනගහනයක් ජීවත්වන මෙම එල්ලංගාව පරංගියවාඩිය ග්‍රාම නිලධාරි කොට්ඨාශ පමණක් ආවරණය වන අතර ගම්මාන 02 කින් සමන්විතය. එල්ලංගාවේ ග්‍රාම නිලධාරි කොට්ඨාශ අනුව ජන ව්‍යාප්තිය පහත ප්‍රස්ථාර සටහන් 02 මඟින් දැක්වේ.

*ප්‍රස්ථාර සටහන් 02 සහ වගු අංක 02 - පරංගියවාඩිය එල්ලංගාවේ ජනගහන විස්තර*




එල්ලංගාවේ වයස් කාණ්ඩයන් අනුව ජනගහනය පිළිබඳ තොරතුරු පහත ප්‍රස්ථාර සටහන් අංක 03හි දැක්වේ.

*ප්‍රස්ථාර සටහන් 03 - පරංගියවාඩිය එල්ලංගාවේ ජනගහන සංයුතිය වයස් කාණ්ඩයන් අනුව*




Resource Profile DS/Horowpothana

### 1.7.4 පරංගියවාඩිය එල්ලංගාවේ වැව් පිලිබඳ තොරතුරු

මෙම එල්ලංගාවේ සුලු වාරිමාර්ග වැව් 7ක් ඇති අතර මධ්‍ය වාරි එක් වැවක් ඇත. මීට අමතරව වනාංතරයට වන්නට ඇති විහාරවැව අතහැරදැමූ වැවක්ය. ඉහත වැව් 7න් කුඩා නිකවැව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් භූමියේ පවතින අතර කුඩාවැව හැර සියලුම සුලු හා මධ්‍ය වැව් 6 ම වන රක්ෂිකයට මායිම් ඇත. එල්ලංගාවේ පිහිටි වැව් පිළිබඳ තොරතුරු පහත වගු අංක 03 හි දැක්වේ. දේශගුණික සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ පළමු අදියර යටතේ මෙම එල්ලංගාවේ කුඩාවැව, නිකවැව හා වැව උඩහවැව මුලුමනින්ම ප්‍රතිසංස්කරණය කරන ලද අතර කලුවාවල වැවේ ඇලවේලි ප්‍රතිසංස්කරණය කරන ලදී. ව්‍යාපෘතියේ දෙවන අදියර යටතේ සුලු වාරිමාර්ග අතර ප්‍රතිසංස්කරණයට අවසරය ලැබී ඇති බ්‍රහ්මණයාගමවැව ප්‍රතිසංස්කරණය කිරීමට අදාල කටයුතු සිදුකෙරෙමින් පවතී. පරංගියවාඩිය වැව හා කලුවාවල වැවේ දියබස්නා ඇලවල් හරහා තාවකාලිකව ඉදිකර ඇති අමුණු 3කින් කලුවාවල හා බ්‍රහ්මණයාගමවැව යටතේ ඇති කුඹුරු ඉඩම් හෙක්. 20 ආසන්න ප්‍රමාණයක් වී වගා කරති.

***වගුව 03 : පරංගියවාඩිය එල්ලංගාවේ පිහිටි වැව් වල මූලික තොරතුරු***

පරංගියවාඩිය එල්ලංගාව

| වැවේ නම | වැවේ පැතිරීම හෙක්. | පවුල් ගනන | ජල ධාරිතාව අක්.අඩි | කුඹුරු ප්‍රමාණය හෙක්. |
|---|---|---|---|---|
| පරංගියවාඩිය වැව | 143.2 | | | |
| කුඩාවැව | 1.53 | | | |
| කලුවාවල වැව | 59.99 | | | |
| වැව උඩහවැව | 3.19 | | | |
| විහාරවැව (වනාංතර) | 0 | | | |
| නිකවැව | 24.17 | | | |
| බ්‍රහ්මණයාගමවැව | 5.64 | | | |
| කුඩා නිකවැව | 1.95 | | | |
| | **239.7** | | | |

### 1.8 පරංගියවාඩිය එල්ලංගාව තිරසර ලෙස කලමනාකරණය කිරීමේ වැදගත්කම

මෙම එල්ලංගාව විශාල වනාංතර ප්‍රෙද්ශයකින් පොෂණය වන එල්ලංගාවකි. පරංගියවාඩිය මධ්‍ය වාරි ජලාශය හා කලුවාවල වැව ප්‍රධාන කරගත් තවත් වැව් 4ක් හා අමුණු කිපයක් මගින් ජල පරිහරණය සිදුවේ. මීට අමතරව වනාංතර තුල තවත් වැව් 2 ක් ඇති අතර ඉන් එකක් මුලුමනින්ම විනාශයට පත්ව ඇත.

අනෙකුත් එල්ලංගාවන්ට ශාපේක්ෂව මෙම එල්ලංගාව මිනිස් ක්‍රියාකාරකම් මගින් සිදුකර ඇති පාරිසරික විනාශය අඩුය. එහෙත් නිකවැව දක්වා වැටී ඇති මාර්ගය අද්දර බියර් බෝතල් ටිං ආදී නොදිරන අපද්‍රව්‍ය ගොඩගසා තිබීම හරස්කඩ සංචාරයේදී නිරීක්ෂණය වූ අතර එය අනාගතයේදී මෙම එල්ලංගාවද විනාශයට පත්වීමට ඇති ප්‍රවනතාවයට ශාක්ෂි දරයි. මිනිසුන්ගේ දෛනික අවශ්‍යතා

බොහොමයක් සපුරා දෙන පරංගියවාඩිය වැවට ආසන්න උස් භූමියේ මෙම කසලගොඩ පිහිටා තිබීම සැලකිල්ලට ගත යුතුය.

එමෙන්ම වැවඋඩහවැවට නිරිතදිගින් වනාංතරයේ සිට ගලාඑන උල්පත් ඇල ඉතාම පිරිසිදු මිනිස් ක්‍රියාකාරකම් වලින් දූෂිත නොවූ ජල මූලාශ්‍රයක් වන අතර වනාංතරයෙන් වටවූ වැවඋඩහවැව කේන්ද්‍ර කරගෙන කෘෂිකාර්මික කටයුතු වල නිරත වන ගොවීන්ගේ බීමට ජල අවශ්‍යතාවය සපුරාලන අතරම වගාවන් සඳහාද ජලය සැපයේ. මෙම එල්ලංගාව වන ජීවීන්ගෙන් ගහන ප්‍රෙද්ශයක් වන අතර විශේෂයෙන්ම වන අලි රංචු ලෙස නිතරම ගැවසෙනු දක්නට ඇත. කලුවාවල හා පරංගියවාඩිය වැව් වල කිඹුල් ගහනය අධික වීම මිනිස් පැවැත්මට තර්ජනයක් වීමටද ඉඩ ඇත.

මෙම පාරිසරික හා වනජීවී තත්වයන් මෙන්ම කුඩා භූමියක ජන ඝනත්වය මීට ආසන්න ප්‍රෙද්ශයන්ට ශාපේක්ෂව ඉහල අගයක පැවතීම නිසා මෙම එල්ලංගාවේ පෝෂක ප්‍රෙද්ශයේ වන අධිරක්ෂිත වනාංතර භූමිය විනාශ වීමේ තර්ජනයකට මූන දීමට ඇති ඉඩකඩ වැඩිය. එම නිසා එය ආරක්ෂා කිරීමට අවශ්‍ය පියවර ගැනීම වැදගත්ය. මෙම විශාල වනාංතරය පදනම් කරගෙන මී පැණි නෙලීම, කර්මාණ්තයක් සිදුවන බැවින්ද මෙම වනාංතරයේ පැවැත්ම ජන ජීවිතය සමග ඍජුවම බද්ධ වී ඇත.

මෙම එල්ලංගාවේ වනාංතර ප්‍රෙද්ශයේ පවතින තවත් සුවිශේෂීම වැදගත් කරුණක් වන්නේ පුරාවිද්‍යාත්මක වටිනාකම් සහිත ස්ථාන කීපයක්ම පැවතීමයි.





නිකවැව වැව් බැම්මේ සිට බස්නාහිර දෙසට මීටර 500 පමණ දුරින් වනාංතරය තුල ඇති පුරාණ සුසාන භූමිය මේ අතර සුවිශේෂීය. මෙම එල්ලංගාවේ වනාංතර ප්‍රෙද්ශයේ පවතින තවත් සුවිශේෂීම වැදගත් කරුණක් වන්නේ පුරාවිද්‍යාත්මක වටිනාකම් සහිත ස්ථාන කීපයක්ම පැවතීමයි. ක්‍රි. ව. 3 සියවසට අයත් කොක්කබේ සහ ගුරුගල්හින්න පුරාණ සුසාන භූමියට සැම අතින්ම සමාන විශාල ගල්පතුරු චතුරස්‍රයක්



ලෙස සිරස් අතට සිටුවා තවත් ගල් පතුරකින් ආවරණය කරන ලද සොහොන් 50 ට අධික ප්‍රමාණයක් නිරීක්ෂණය විය. හරස්කඩ සංචාරයට එක්වූ ගොවීන්ගේ තොරතුරු මත එය 100 වද අධික බව කියැවේ. කිසිදු සංරක්ෂණයකට හසු නොවූ හුදකලාව වනාංතරයේ පවතින මෙම සුසාන ශූමිය අපගේ පැරැණි ශිෂ්ඨාචාරයේ ශිශ්ඨත්වය කියාපාන සාධකයකි. එසේම විහාරවැවට උතුරින් පිහිටා ඇති නිධන් සොරුන් විසින් විනාශ කර ඇති

චෛත්‍ය හා ඊට ආසන්න භූමිය පුරා පැතිර ඇති ගොඩනැගිලි වල නටඹුන් කිසිදු සංරක්ෂණයකට ඇස නොගැටී විනාශ වෙමින් පවතී.

බ්‍රහ්මණයාගම වැවට බස්නාහිරින් පිහිටා ඇති ගල්කඳු සහිත කඳුවැටියේ පිහිටා ඇති පුරාණ ගල්ලෙන් සමූහයක් පිළිබඳව ගොවීන් විස්තර කලත් පුරාවිද්‍යා දෙපාර්තමේන්තු නිලධාරියෙකුගේ සහභාගිත්වය නොමැතිව සංචාරය කිරීම නුසුදුසු බැවින් අතහැර දමන ලදී. ගොවීන් ලබාදුන් විස්තර අනුව ලෙන් 30 ට අධික ප්‍රමාණයක් පවතින බව විශ්වාස කෙරේ.

මෙවැනි පාරිසරික හා පුරාවිද්‍යාත්මක වටිනාකම් සහිත පරංගියවාඩිය එල්ලංගාව මෙම ප්‍රදේශයේ බොහොමයක් එල්ලංගාවල පවතින අයුරින්ම අමුණු 4 ක් මගින් ජල පරිහරණය වඩා ඵලදායි කර හෙක්ටයාර 175 අධික වී වගා බිම් ප්‍රමාණයක් පවත්වාගෙන යයි.

එල්ලංගාවේ පිහිටි සක්‍රීය සුලු වාරි වැව් 5න් වැව් 4 ක්ම ව්‍යාපෘතිය මගින් දැනටමත් ප්‍රතිසංස්කරණය කර ඇති අතර ඉතිරි වැව වන බ්‍රය්මණයාගම වැව 2025 වර්ශයේදී ප්‍රතිසංස්කරණය කරණ කරනු ඇත. ඒ අතරම අමුණු, එල්ලංගා සංවර්ධන ප්‍රවේශය (Cascade Development Approach) උපයෝගී කරගනිමින් ව්‍යාපෘතිය මගින් ප්‍රතිසංස්කරණය කරනු ලබන අතර එහිදී මුළු පද්ධතියේ තිරසර පැවැත්ම තහවුරු වන ආකාරයට එල්ලංගාව සංවර්ධනය සඳහා විශේෂ අවධානයක් යොමු කරයි. ඒ අනුව එල්ලංගා කලමණාකරන සැලැස්මක් සකස් කර පරංගියවාඩිය එල්ලංගාව ආරක්ෂා කිරීම සඳහා දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය අවධානය යොමු කර ඇත. එහිදී එල්ලංගා කලමණාකරන කමිටුවට එල්ලංගා පැතිකඩක් හා අවසාන වශයෙන් එල්ලංගා කලමණාකරන සැලැස්මක් සකස් කිරීමට ව්‍යාපෘතිය සහාය ලබාදේ.

## 2.0 පරංගියවාඩිය එල්ලංගා කලමනාකරණ සැලැස්ම සැකසීමේ දී අනුගමනය කරන ලද ක්‍රමවේදය

දේශගුණ සුහුරුවාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය, නබඩවැව එල්ලංගාවේ පවතින තත්වය විශ්ලේෂණය කිරීමෙන් පසුව එල්ලංගාව ආරක්ෂා කිරීම සඳහා සියලු පාර්ශවකාර ආයතන සම්බන්ධිත එල්ලංගා කලමණාකරන කමිටුව වැනි ආයතනයක අවශ්‍යතාවය තහවුරු විය. මෙම අරමුණ ඉටුකර ගැනීමට සඳහා එල්ලංගා කලමණාකරනය සඳහා ප්‍රධාන කාර්යයක් ලෙස විද්‍යානුකූල හා සහභාගීත්ව ප්‍රවේශයකින් යුත් එල්ලංගා කලමණාකරන සැලැස්මක් අවශ්‍ය බවටද දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියට අවබෝධ විය. එල්ලංගා කලමණාකරන කමිටුවට විධිමත් එල්ලංගා පැතිකඩක් සහ එල්ලංගා කලමණාකරන සැලැස්මක් සකස් කිරීමට එය උදව්වක් විය. පිලිවෙලින් එල්ලංගාව අධ්‍යනය කිරීම හා ද්විතීය හා ප්‍රාථමික දත්ත හා තොරතුරු එකතු කිරීම, තොරතුරු ජනනය කිරීම එල්ලංගා පැතිකඩ සකස් කිරීමේ පූර්ව අවශ්‍යතාවයක් විය.

### 2.1 පරංගියවාඩිය එල්ලංගා පැතිකඩ සකස් කිරීම





පරංගියවාඩිය එල්ලංගා පැතිකඩ සකස් කිරීම සඳහා මූලාංශ්‍ර කිහිපයක් ඔස්සේ තොරතුරු ලබා ගන්නා ලදී. හරස්කඩ චාරිකා, ද්විතීය දත්ත, කණ්ඩායම් සාකච්ඡා ඒ අතර ප්‍රධාන වූ අතර ද්විතීය දත්ත ලෙස ව්‍යාපෘතියේ සංවේදී කලාප සඳහා සකස් කරන ලද කෘෂිකාර්මික සංවර්ධන සැලැස්ම, ඉංජිනේරු සමීක්ෂණය, ජල විද්‍යාත්මක තක්සේරුව හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලින් වනජීවී හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තු වලින් ලබා ගත් තොරතුරු භාවිතා කරන ලදී.

ද්විතියික දත්ත රැස් කිරීම සඳහා, "සම්පත් පැතිකඩ" සහ හොරොව්පොතාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අදාළ මූලාශ්‍රයන්, පොහොර ලියාපදිංචි කිරීමේ ලැයිස්තුව සහ පරංගියාවාඩිය ගොවිජන සේවා මධ්‍යස්ථාන බල ප්‍රදේශයේ කෘෂිකර්ම සංවර්ධන සැලැස්ම, ඉංජිනේරු සමීක්ෂණය, ජල විද්‍යා සමීක්ෂණ, චන්ද්‍රිකා ඡායාරූප, GIS තාක්ෂණය සහ අන්තර්ජාලය ද ඩිජිටල් තොරතුරුද භාවිතා කරන ලදී. විශේෂයෙන්ම මෙම එල්ලංගා පැතිකඩේ ඇති තොරතුරු එල්ලංගා කලමණාකරන මූලික සැලැස්ම සැකසීම සඳහා ඉතාමත් වැදගත් වන අතර එල්ලංගාව අධ්‍යනය කරනු ලබන අයට එල්ලංගාව පිලිබඳව තොරතුරු ලබා ගැනීමේදී සහ එල්ලංගාවේ ඉදිරි සංවර්ධන සැලසුම් කිරීමේදී බෙහෙවින් ඉවහල් වනු ඇත. මීට අමතරව ප්‍රාථමික දත්ත ජනනය කිරීම සඳහා හරස්කඩ චාරිකාවක්ද (Transect Walk) සියලු පාර්ශවකාර සංවිධානවල සහභාගීත්වයෙන් සිදුකරන ලදී.

## 2.2 හරස්කඩ චාරිකාව

පරංගියවාඩිය එල්ලංගාවේ හරස්කඩ සංචාරය 2024 මාර්තු 27 හා 28 දෙදින සංවිධානය කරන ලදී. ඒ සඳහා එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු විසින් අදාල රාජ්‍ය නිලධාරීන් ඇතුලු ගොවි සංවිධාන නිලධාරීන්ට, වෙනත් ප්‍රජාමූල සංවිධාන නියෝජිතයින්ට, පොදුවේ ගොවීන් ඇතුලුව සියලුම පාර්ශවකරුවන්ට නබඩවැව එල්ලංගා පද්ධතියේ ඉහළ සිට පහළට නිරීක්ෂණය හා සාකච්ඡා මඟින් දත්ත එකතු කිරීමටත් ඒකාබද්ධ ප්‍රවේශයකින් එල්ලංගා කළමනාකරණය සිදුකිරීම සඳහා සාමූහිකත්ව ප්‍රයත්නයක් දැරීමට ඔවුන් පොළඹවා ගැනීම සඳහා ආරාධනා කරන ලදී. හරස්කඩ සංචාරයේ ගමන් මාර්ගයේ භූගෝලීය තොරතුරු, භූ විද්‍යාත්මක තොරතුරු, ජල විද්‍යාත්මක තොරතුරු, පරිසර විද්‍යාත්මක තොරතුරු, සමාජ ආර්ථික තොරතුරු, සම්පත් භායනය හා සම්පත් භායනයේ බරපතලකම පිළිබඳව නිරීක්ෂණ හා සාකච්ඡා මඟින් තොරතුරු එකතු කර ගන්නා ලදී. හරස්කඩ චාරිකාව සඳහා ප්‍රතිලාභීන් ගොවි සංවිධාන සාමාජිකයින් හා සියලු රාජ්‍ය ආයතන වල නිලධාරීන් සහභාගී වූ අතර චාරිකාවෙන් පසුව ඒ සඳහා සහභාගී වූ සියලු පාර්ශවවල සහභාගීත්වයෙන් වැඩමුළුවක් පවත්වා තොරතුරුවල නිරවද්‍යතාවය තවදුරටත් තහවුරු කරගන්නා ලදී. මෙම සංචාරයේ ප්‍රධාන පරමාර්ථය වූයේ ප්‍රාථමික දත්ත රැස් කිරීම, මුළු එල්ලංගා පද්ධතියම නිරීක්ෂණය කිරීම, එල්ලංගාවේ ගැටළු සහ සම්පත් හඳුනා ගැනීමය.

ඒ අනුව 2024 මාර්තු 27 දින පරංගියවාඩිය ගොවිජන සේවා මධ්‍යස්ථානයේදී එකතුවූ සියලු පාර්ශවකරුවන්හට එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු ලේකම් ලේකම් පරංගියවාඩිය ගොවිජන සේවා මධ්‍යස්ථානයේ ප්‍රාදේශීය නිලධාරි විසින් අවශ්‍ය උපදෙස් ලබාදෙන ලදී. එමෙන්ම හරස්කඩ චාරිකාවේ කාර්යය සහ අරමුණ පිළිබඳව ව්‍යාපෘතියේ ආයතන සංවර්ධන හා හැකියා වර්ධන විශේෂඥ විසින් සියලු දෙනාම දැනුවත් කරන ලදී. එතැන් සිට කණ්ඩායම කුඩාවැවෙන් ආරම්භව හරස්කඩ සංචාරය සිදුකරන ලදී.

මෙහිදී ගමන් විඩාව අවම කිරීමටත් කණ්ඩායමට අවශ්‍ය ආහාර පානාදිය ප්‍රවාහනය සඳහාත් එක් ට්‍රැක්ටරය යොදාගත් අතර මෙම දිනවල දිවා උෂ්ණත්වය සෙල්සියස් අංශක 36 – 39 අතර පැවති බවද සඳහන් කිරීමට කැමැත්තෙමි. දින දෙකේම දවස පුරාම පැවති උනුසුම් තත්ත්වය නොසලකා හරස්කඩ සංචාරයේ වැදගත්කම තේරුම්ගෙන සහභාගි වූ සියලු රාජ්‍ය නිලධාරීන්ගේ හා ගොවීන්ගේ කැපවීමත් ඒ සඳහා සියලු දෙනාම උනන්දු කිරීම සඳහා නිතර සොයා බැලීම් කල එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු සභාපති හොරොව්පොතාන ප්‍රාදේශීය ලේකම් හා එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු ලේකම් පරංගියවාඩිය ගොවිජන සේවා මධ්‍යස්ථානයේ ප්‍රාදේශීය නිලධාරි විසින් ඉටුකල කාර්යභාර්ය ඉතා වැදගත් වේ. හරස්කඩ චාරිකාව සඳහා ගොවි නායකයින් ඇතුලුව ගොවීන් 25 ක් පමණ සහභාගී විය. තවද ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව යන ආයතනවල නියෝජිතයන් සහ සමෘද්ධි නිලධාරීන්, ග්‍රාම නිලධාරී, සංවර්ධන නිලධාරීන් සහභාගි වූහ.

මෙහිදී තොරතුරු එකතු කිරීම සඳහා ආකෘති පත්‍ර කීපයක් (ඇමුණුම් 1 – 4) භාවිතා කල අතර මාර්ග සැලැස්ම, පෝෂණ ස්ථාන ඇතුළු මාර්ග විස්තර සහ ආහාර පැකට් සහ ප්‍රථමාධාර ද්‍රව්‍ය කණ්ඩායම් සාමාජිකයින් අතර බෙදා දෙන ලදී.

මෙම හරස්කඩ චාරිකාව සඳහාද GPS තාක්ෂණය භාවිතා කරන ලදී. CSIAP කාර්ය මණ්ඩලය විසින් සකස් කරන ලද එල්ලංගා සිතියම පදනම් කරගෙන දත්ත එකතු කිරීම සිදු කරන ලදී. GPS Device එකක් පමනක් තිබුන නමුත් “Place” නම් වූ මෝබයිල් ඇප් එක භාවිතයෙන් කණ්ඩාංක (GPS Coordinate) සටහන් කිරීම සිදුකල අතර හරස්කඩ සංචාරය ආරම්භයට පෙර මෙම මෝබයිල් ඇප් එක බාගත කරගැනීමටත් එය භාවිතා කර ආකෘතිපත්‍ර වලට තොරතුරු සටහන් කිරීම පිළිබඳවත් පුහුණුව ලබාදෙන ලදී.

විශේෂයෙන්ම මෙම එල්ලංගා පැතිකඩේ ඇති තොරතුරු එල්ලංගා කලමනාකරණ මූලික සැලැස්ම සැකසීම සඳහා ඉතාමත් වැදගත් වන අතර එල්ලංගාව අධ්‍යයනය කරනු ලබන අයට එල්ලංගාව පිලිබඳව තොරතුරු ලබා ගැනීමේදී සහ එල්ලංගාවේ ඉදිරි සංවර්ධන කටයුතු සැලසුම් කිරීමේදී බෙහෙවින් ඉවහල් වනු ඇත. හරස්කඩ චාරිකාවේ ගමන් මාර්ග පහත සිතියම් අංක 05හි දැක්වේ.

***සිතියම 04: හරස්කඩ සංචාරයේ ගමන් මග දැක්වෙන සිතියම***




*මූලාශ්‍රය : ගූගල් සිතියම් (Google Base Map) හා GPS දත්ත ඇසුරින් සකස් කරන ලදී.*

## 3.0 පරංගියවාඩිය එල්ලංගා කලමනාකරණ සැලැස්ම සකස්කිරීම

එල්ලංගා කලමනාකරණ සැලැස්ම සැකසීම ක්ෂේත්‍ර මූලික ක්‍රියාකාරකම් ඇතුලත් බහුවිධ කාර්යයකි. ඒ සඳහා එල්ලංගා කලමනාකරණ සැලැස්ම සැකසීමට පෙර එල්ලංගා පැතිකඩ සකස් කල යුතු අතර එහිදී එල්ලංගාවේ භූ විද්‍යාත්මක, පරිසර විද්‍යාත්මක, ජල විද්‍යාත්මක, සිතියම් විද්‍යාත්මක හා සමාජ පැතිකඩ තක්සේරු කිරීම සඳහා සහභාගීත්ව හා බහු පාර්ශවීය ක්‍රමවේද භාවිතා කරනු ලබයි. දත්ත උත්පාදනය, ත්‍රිමානකරණය, දත්ත විශ්ලේෂණය, වාර්තා ලිවීම, සැලැස්ම සැකසීම සහ පාර්ශවකරුවන්ගෙන් ඒවායේ නිවැරදිභාවය තහවුරු කර ගැනීම සඳහා බහුවිධ දක්ෂතා ඇති පුද්ගලයින් අවශ්‍ය වේ. මෙම සියලුම කාර්යයන් ලෝක බැංකු කාර්ය මණ්ඩලයේ උපදෙස් ඇතිව දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ නිලධාරීන් විසින් ඉටුකරනු ලැබීය. එල්ලංගා කලමනාකරණ සැලැස්ම සැකසිම සඳහා දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය සහ හවුල්කාර ආයතන එකතු වී පහත ක්‍රියාමාර්ග අනුගමනය කරන ලදී.(i) රැස්වීම් පැවැත්වීම (ii) ද්විතීය දත්ත එකතු කිරීම (iii) හරස්කඩ වාරිකාව වැනි සහභාගීත්ව තාක්ෂණික ක්‍රම භාවිතා කර ප්‍රාථමික දත්ත උත්පාදනය කිරීම (iv) එල්ලංගාව මුහුණ දෙන අභියෝග හඳුනා ගැනීම (v) එකතු කරන ලද හා උත්පාදනය කරන ලද දත්ත හා තොරතුරු මත පුරෝකථන කිරීම (vi) එල්ලංගා පැතිකඩ සැකසීම (vii) ගැටළු ගස වැනි සහභාගීත්ව තාක්ෂණික ක්‍රම භාවිතා කර උග්‍ර ගැටළු හඳුනා ගැනීම, යුගල සැසඳීම වැනි සහභාගීත්ව තාක්ෂණික ක්‍රම භාවිතා කර කඩිනමින් අවධානය යොමු කල යුතු උග්‍ර ගැටළු හඳුනා ගැනීම (viii) එල්ලංගා සැලැස්ම සැකසීම (ix) පාර්ශවකරුවන්ගේ සහභාගිත්වයෙන් එල්ලංගා කලමනාකරණ සැලැස්මේ නිවැරදිතාවය තහවුරු කර ගැනීම (x) එල්ලංගා කලමනාකරණ කමිටුවේ විශේෂ රැස්වීමකදී උග්‍ර ගැටළු විසඳීම හෝ අවම කිරීම සඳහා අවශ්‍ය උපායමාර්ගික සැලසුම් සකස් කිරීම (xi) යෝජිත උපායමාර්ගික මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීම සඳහා කෙටිකාලීන (Short Term), මධ්‍යකාලීන (Medium Term) හා දීර්ගකාලීන (Long Term) වශයෙන් බෙදා වෙන් කරන ලද ප්‍රායෝගික කාලවකවානු තීරණය කිරීම, දළ ඇස්තමේන්තුවක් සකස් කිරීම ආදිය එල්ලංගා කලමනාකරණ කමිටුවට පහසුවෙන් ක්‍රියාත්මක කිරීමට හැකිවන ලෙස එල්ලංගා කලමනාකරණ සැලැස්මට ඇතුලත් කරන ලදී.

### 3.1 පරංගියවාඩිය එල්ලංගාව මුහුණදෙන මූලික අභියෝග හඳුනා ගැනීම

පරංගියවාඩිය එල්ලංගාව මුහුණදෙන ප්‍රධාන අභියෝග හඳුනා ගැනීම එල්ලංගා පැතිකඩ හා එල්ලංගා කලමනාකරණ සැලැස්ම සැකසීමේ ක්‍රියාවලියේ එක් ප්‍රධාන කාර්යයකි. දේශගුණික සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන පළාත් 6 ක දිස්ත්‍රික්ක 11 ක එල්ලංගා පද්ධති **57** ආවරණය වන පරිදි එල්ලංගා කලමනාකරණ කමිටු 53 ක් පිහිටුවීමට පහසුකරනය කිරීමෙන් පසුව, ව්‍යාපෘතියේ ඊළඟ කාර්යය වී ඇත්තේ සෑම එල්ලංගා කලමනාකරණ කමිටුවක් සඳහාම එල්ලංගා පැතිකඩක් සහ එල්ලංගා කලමනාකරණ සැලැස්මක් සකස් කර දීමට එල්ලංගා කළමනාකරණ කමිටුවට සහාය වීමයි. එල්ලංගාව සහ එල්ලංගාව මුහුණ දෙන ගැටළු හඳුනා ගැනීමට එල්ලංගා පැතිකඩ සැකසීම අතිශයින් වැදගත් වන අතර එල්ලංගාව ආරක්ෂා කිරීම සඳහා ප්‍රායෝගික එල්ලංගා කලමනාකරණ සැලැස්මක් සැකසීමට එල්ලංගා පැතිකඩ ඉතා වැදගත් වේ. ඒ අනුව අභියෝග හඳුනා ගත යුතු ප්‍රධාන ක්ෂේත්‍ර තීරණය කිරීම, දත්ත එකතු කිරීම හා උත්පාදනය කිරීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රමවේද තීරණය කිරීම, එල්ලංගා පැතිකඩේ හා එල්ලංගා කලමනාකරණ සැලැස්මේ දත්ත හා තොරතුරු ජනනය කිරීම සඳහා ආකෘති සැකසීම සම්බන්ධයෙන් දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ නිලධාරීන් හා ලෝක බැංකු නිලධාරීන් එක්ව උපදේශන මට්ටමේ රැස්වීම් කීපයක්ම පවත්වන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ලේඛණ පරිශීලනය කිරීමට අමතරව සහභාගීත්ව ක්‍රමවේදයක් වන හරස්කඩ වාරිකා ක්‍රමවේදය එල්ලංගාව

අධ්‍යයනය කිරීම සඳහා ප්‍රධාන ක්‍රමවේදයක් ලෙස භාවිතා කරන ලදී. එහිදී එල්ලංගාව හරහා චාරිකා කරමින් එල්ලංගාවේ ස්වභාවය සහ මෙහි 4 වන කොටස යටතේ දක්වා ඇති ප්‍රධාන අභියෝග හඳුනා ගන්නා ලදී. අභියෝග ප්‍රධාන වශයෙන් කොටස් කිහිපයකට වර්ගීකරණය කරන ලදී. ඒවා නම් 1. **භූගෝල විද්‍යාත්මක** 2. **භූ විද්‍යාත්මක** 3. **ජල විද්‍යාත්මක** 4. **පාරිසරික විද්‍යාත්මක** 5. **මානව හැසිරීම්** 6. **සමාජ ආර්ථික** 7. **කෘෂිකාර්මික** 8. **වාරිමාර්ග කලමනාකරණ** 9. **පෝෂිත ප්‍රදේශයේ තත්ත්වය** යන ආදියයි. මේවා එල්ලංගා කලමනාකරණ සැලැස්ම සකස් කිරීමේදී භාවිතා කිරීම සඳහා එල්ලංගා පැතිකඩේ සවිස්තරාත්මකව දක්වා ඇත. මෙම අභියෝග තව දුරටත් විග්‍රහ කර උග්‍ර ගැටලු හඳුනා ගෙන ඒවායේ නිවැරදිතාවය තහවුරු කර ගෙන ඒවා පිළිබඳව ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ, පාර්ශවකරුවන්ගේ සහ ආධාරකරුවන්ගේ කඩිනම් අවධානය යොමු කරවීමට එල්ලංගා කළමනාකරණ සැලැස්මට ඇතුලත් කර ඇත.

## 3.2 පරංගියවාඩිය එල්ලංගාවේ වර්තමාන පැතිකඩ


### 3.2.1 භූගෝලීය (Geographical ) තොරතුරු

පරංගියවාඩිය එල්ලංගාවේ නැගෙනහිර මායිම මුලුමනින්ම ආනඋලුන්දෑව අධිරක්ෂිත වනාංතරයට මායිම්ව ඇත. මෙම එල්ලංගාවේ තුනෙන් දෙකක්ම ආවරණය වන්නේ වනාංතර හා ලඳුකැලෑ වලින්ය. මිනිසුන් ජනාවාස වීම එක් ප්‍රෙද්ශයකට කේන්ද්‍රගත වී තිබීම අනෙකුත් එල්ලංගාවන්ට ශාපේක්ෂව වෙනස් වූ තත්වයකි. විහාරස්ථානය, පැසැල, ගොවිජනසේවා මධ්‍යස්ථානය, බීමට ජලය සකස්කරන පිරිපහදුව හා ප්‍රජාශාලාව යනාදි පොදු ගොඩනැගිලි මෙම ජනාවාස ප්‍රෙද්ශය තුල ස්ථාපිත වී ඇත.

හොරොව්පොතාන සිට වලහවිද්දවැව හරහා දෙමටවැව දක්වා දිවෙන මාර්ගය මෙම එල්ලංගාවේ බටහිර මායිමෙන් වැටී ඇති අතර එල්ලංගාව ආසන්නයේ පවතින ප්‍රධාන නගරට වන හොරොව්පොතාන සම්බන්ධ කරයි.

එල්ලංගාවේ භූමියෙන් 65% පමන ස්වභාවික නකාංතර වන අතර (වනාංතර 60.48% හා ලඳුකැලෑ 4.11%) ඉතිරි 35% න් 19%ක්ම වී වගාබිම් වේ. එල්ලංගාවේ තවත් 10% ක් වැව් 7ක ජලය විසින් ආවරණය කර ඇත. මේ අනුව 6% පමණ කුඩා බිම් තීරුවක පොදු ගොඩනැගිලිද සහිතව ජනාවාසය හා ගොඩ බෝග වගා බිම් පිහිටා ඇත. මෙම 6% න් 2% පමන (හෙක්ටයාර 44) අනීතිකව වනාංතර විනාශකර ගොවිබිම් වලට එකතු කරගෙන ඇත.මෙම එල්ලංගාවේ

***වගු අංක 04 සහා ප්‍රස්ථාර සටහන් 04 - නබඩවැව එල්ලංගාවේ ඉඩම් පරිහරණ රටාව***




| ඉඩම් පරිහරණය | හෙක්. | % |
|---|---|---|
| වනාංතර අල්ලාගැනීම් | 44.6 | 1.90% |
| ලඳු කැලෑ | 96.45 | 4.11% |
| වනාංතර | 1418.78 | 60.48% |
| ගොඩ ඉඩම් | 16.37 | 0.70% |
| ගෙවතු | 94.49 | 4.03% |
| වී වගා බිම් | 435.64 | 18.57% |
| වැව් | 239.73 | 10.22% |
| **එල්ලංගාවේ වපසරිය** | **2346.06** | **100.00%** |

### 3.2.2 භූ විද්‍යාත්මක (Geological) තොරතුරු

කලුවාවල වැවට වම්පසින් රතු දුඹුරු පසක් සහිත (RBE) භූමි කොටස සහා ජනාවාස ප්‍රෙද්ශය හැරුනු විට අනෙකුත් සියලු ප්‍රෙද්ශ වනාංතර හෝ වී වගාවට සුදුසු ජලය රදන බිම් මෙම එල්ලංගාවේ දැකිය හැක. පරංගියවාඩිය වැව යටතේ වම් ඉවුරට වන්නට හා කලුවාවල වැව දකුණු ඉවුර වනාං.ර වලට මායිම් බිම් තීරුව වැලි මිශ්‍ර පසක් වන නිසා යල කන්නයේදී අතිරේක බෝග වගාවන්ට ඉතාම උචිතය. CSIA ව්‍යාපෘති ආරම්භයත් සමග 2020 යල කන්නය මෙම භූමි කොටසේ සෝයා සහ මුං ඇට වගාවෙන් සාර්ථක අස්වැන්නක් ගොවීන් ලබාගන්නා ලදී. මෙම එල්ලංගාවේ වැව උඩහවැව හා නිකවැව වනාංතර වලට වටවී තිබීමත්, බ්‍රහ්මණයාගමවැව හා කුඩාවැව වනාංතර මායිම් වල පිහිටා තිබීම නිසා සතුන්ගෙන් වගා හානි වීමට ඇති දැඩි අවධානම හේතුවෙන් අතිරේක බෝග වගාවට වඩා ජලය පවතී නම් වී වගාව සඳහා යොමු වීම දකින්නට ඇත. වැව උඩහවැව හා නිකවැව යල කන්නයේදී බොහෝ අවස්ථා වල වගාවන් සිදු නොකරන අතර ජලය සුලු වශයෙන් හෝ තිබුනොත් ගොවීන් කීපදෙනෙකු පමනක් වී වගාවේ යෙදීම සාමාන්‍ය තත්වයයි.

එල්ලංගාවේ නිකවැවට ඉහලින් වැවට දකුණට වන්නට මීටර 103 උස්බිමක් මීටරේ සිතියම සලකුණු කර ඇති අතර ඊට ආසන්නයෙන් මීටර 100 සමෝච්ච රේඛාව නිරීක්ෂණය කල හැකි අතර කුඩා නිකවැවට බස්නාහිරින් මීටර 58 ක ස්ථානීය උසක් දැක්වෙන අතර ඒ අනුව මෙම එල්ලංගාව මීටර 100 සිට මීටර 58 දක්වා වූ දකුණේ සිට උතුරට බෑවුම් වන මීටර 42 ක පමණ ආනතියකින් යුක්තය. උතුරු මැදට ආවේනික ශාකයන් සියල්ලම පාහේ එල්ලංගාවේ නැගෙනහිරට මායිම්ව ඇති වනාන්තර වල ඇති අතර මී පැණි එක්කාසු කිරීම මෙම එල්ලංගාවේ මිනිසුන්ගේ ජීවිකාවට අත්උදව්වක් වී ඇත. නිතරම වන අලින්ගෙන් සිදුවන දේපල හානි හා ජීවිත හානි සිදුවීම සාමාන්‍ය තත්ත්වයකි.

### 3.2.3 ජල විද්‍යාත්මක (Hydrological) තොරතුරු

එල්ලංගාවට නැගෙනහිර මායිමේ ඇති අධි ආරක්ෂිත වනාංතරයෙන් ආරම්භවන 36 ට අධික ජල මූලාශ්‍රයන් මෙම එල්ලංගාව ජලයෙන් පෝෂණය කරනු ඇත. මෙම එල්ලංගාවේ පවතින පරංගියවාඩිය මධ්‍ය වාරි ජලාශය ජල පෝෂක මාර්ග 25 කින් පමණ පෝෂණය වන විශාල වැව් තාවුල්ලකින් සමන්විතය. සිතියම් අංක 05 නිරීක්ෂණයේදී විශාල ජල මූලාශ්‍රයන් හඳුනා ගත හැකිය.

**සිතියම 05- පරංගියවාඩිය එල්ලංගාව ආශ්‍රිතව පිහිටා ඇති ජලමූලාශ්‍ර දැක්වෙන සිතියම**




*මූලාශ්‍රය : ගූගල් සිතියම (Google Base Map), මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ දත්ත හා GPS දත්ත ඇසුරින් සකස් කරන ලදී.*

මෙම විශාල පෝෂක ප්‍රදේශය නිසාවෙන් පරංගියවාඩිය ජලාශයේ වාන ස්වභාවික ජල මාර්ගයකයට යොමු නොකර කලුවාවල වැවට හරවා තිබීම අඩු ජල පෝෂක ප්‍රදේශයක් සහිත කලුවාවල වැවට වාසිදායක වී ඇත.

මෙම අතිරේක ජලධාරාව හේතුවෙන් මෑතකදී ඉදිකරන ලද මීටර 50 පමන දිගින් යුක්ත කලුවාවල වාන මගින් පිටකරන විශාල ජලස්කන්ධය හේතුවෙන් පහල වගාබිම් සහ ඇලවේලි බරපතල හානියකට ලක්වීම මාස් කන්නයේදී දැකිය හැකිය. හරස්කඩ සංචාරයේදී මේ පිළිබඳව දීර්ග ලෙස සාකච්චා

කෙරුනු අතර මෙම වානට මීටර 300 පහන ඊසාන දිගට වන්නට වත්මන් වානට මීටර 1.5 පමන පහතින් ඇල මාර්ගයක් සකස් කර කලුවාවල වැව වාන් යාමට පෙර හානිය අවම කරගැනීමට යම් ජල ප්‍රමාණයක් බ්‍රහ්මණයාගමවැව දෙසට නිදහස් කිරීමට යෝජනා විය. මෙම වැව් දෙකේම ප්‍රතිලාභීන් එකම ගොවීන් කණ්ඩායමක් වීම නිසා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබුනොත් මෙම නිර්මිතය ඉදිකිරීම වෙනත් පාර්ශවයකට අගතියක් සිදු නොවන බව ඔවුනගේ අදහසයි. ඒ අනුව සිතියමේ

සත්‍ය වශයෙන්ම බොහොමයක් එල්ලංගාවන් මෙවැනි මානව අවශ්‍යතාවයන් වෙනුවෙන් ස්වාභාවික තත්වයන් වෙනස් කිරීම බහුලව දක්නට ඇත. මහවැලි ගංගා ද්‍රෝණයේ සිට කුඩා එල්ලංගාවන් දක්වා මෙම වෙනස් කිරීම් ඉතිහාසය පුරාවට සිදුව ඇති අතර ඒවා මානව පැවැත්මට සාධනීය සාධක එකතු කර ඇත.

ඉහත සිතියම් අංක 5 හි අංක 7 ලෙස ලකුණු කර ඇති ස්ථානයට දකුණින් පරංගියවාඩිය වැව තුලට වන්නට සකස් කල පරංගියවාඩිය වාන මගින් ජල මට්ටම ඉහලට ඔසවා අංක 7 ස්ථානයෙන් කලුවාවල වැවේ පෝෂක ප්‍රෙද්ශයට එහි වාන් වතුර නිදහස් කිරීම සිදු කර ඇත.

***වගුව 5 - පරංගියවාඩිය එල්ලංගා පද්ධතියේ මූලිකාංග***

| ජල විද්‍යාත්මක ලක්ෂණ | වර්තමාන තත්ත්වය |
|---|---|
| මහ වැව හෝ පහල වැව | පරංගියවාඩිය වැව මෙම එල්ලංගාවේ පහල වැව වේ. ඒ ආශ්‍රිතව ජනතාව පදිංචිව ඇති අතර සංස්කෘතික ලක්ෂණය වන පන්සලද ඇත. |
| කුළු වැව් | විහාරවැව ලෙස හඳුන්වන වනාංතරයේ ඇති අතහැර දමා ඇති වැව කුළු වැව වේ. |
| කයාන් වැව | නොමැත. |
| ඔලගම් වැව | වැව උඩහවැව සහා නිකවැව ඔලගම් වේ. ව්‍යාපෘතිය යටතේ මෙම වැව් දෙක හා කුඩාවැවත් එමෙන්ම කලුවාවල වැව ඇලවේලි පද්ධතියත් පුනරුත්ථාපනය කල අතර කලුවාවල වැව් බැම්මට පහලින් පාර අද්දර වර්ග මීටර 1200 ක කොන්ක්‍රීට් කමතක් ද ඉදිකර ඇත. |
| ඉහල වැව | නොමැත |
| ගොඩ වල | නොමැත |
| ඉස්වැටිය | නොමැත |

**මූලාශ්‍රය – එල්ලංගා කලමණාකරන කමිටුව විසින් පවත්වන ලද හරස්කඩ චාරිකාවේදී මෙම තොරතුරු එකතු කර ඇත.**

එසේම සාම්ප්‍රදායික එල්ලංගාවේ පිහිටි කට්ටකඩුව දකින්නට නොලැබෙන අතර ගස්ගොම්මන කුඩාවැව හැර සෑම වැවකම ඇත. ඊට හේතුව වන්නේ කුඩාවැව හැර සියලුම වැව් වන රක්ෂිතය තුල හෝ ඊට මායිම්ව පිහිටා තිබීමයි.

පාංශු ඛාදනය හේතුවෙන් වැව් වල රොන්මඩ තැන්පත් වීම ගැටලුවක් ලෙස වර්තමානයේ දක්නට නැතත් කලුවාවල වැවට ඉහලින් උස්බිමේ වනය එළිකර පවත්වාගෙන යන ගොවිපල වැනි තත්වයන් වැඩිකල් නොගොස් ව්‍යාප්ත වීමට ඇති ප්‍රවනතාවය නිසා එල්ලංගා කළමනාකරණ කමිටුව ලෙස අවශ්‍ය නියාමනයන් සඳහා ප්‍රෙවිශ විය යුතු බවට අවධානය යොමුව ඇත.


### 3.2.4.පාරිසරික විද්‍යාත්මක තොරතුරු (Environmental information )

එල්ලංගාව තුල ප්‍රධාන ඉඩම් පරිහරණ රටාවන් ලෙස ඝන වනාන්තර, ලඳු කැලෑ, උස් බිම් වගා ඉඩම්, වැව්, කුඹුරු යායවල්, නිවාස සහ ගෙවතු වගාවන් දැක්විය හැකිය. එක් එක් ඉඩම් පරිහරණ රටාවන් අනුව පැහැදිලිව හඳුනාගත හැකි ස්භාවික පරිසර පද්ධතීන් හා මිනිසා විසින් කෘතිමව සකස් කරණ ලද

පරිසර පද්ධතීන් රාශියක් දැක ගත හැකිය. වනාන්තර පරිසර පද්ධතිය, වැව් (මතුපිට ජල මූලාශ්‍ර) ආශ්‍රිත පරිසර පද්ධතිය, වර්ෂාපෝශිත ගොඩ බෝග වගා පද්ධති ආශ්‍රිත පරිසර පද්ධතිය, කුඹුරු ආශ්‍රිත වගා පරිසර පද්ධතිය, කෘෂි ළිං ආශ්‍රිත බෝග වගා පරිසර පද්ධතිය, ගෙවතු ආශ්‍රිත පරිසර පද්ධතිය ආදිය ප්‍රධාන වේ. එල්ලංගාවේ තිරසර පැවැත්ම සහතික වීම සඳහා ඉහත ස්වාභාවික පරිසර පද්ධති සංරක්ෂණයත්, මිනිසා විසින් කෘතිමව සකස් කරණ ලද පරිසර පද්ධතීන් නිසා සිදුවිය හැකි පරිසර හානිය අවම කරමින් ස්වාභාවික සම්පත් ධරණීය ලෙස උපයෝජනය කිරීමත් කළමනාකරණයත් අත්‍යවශ්‍ය වේ. පරංගියවාඩිය එල්ලංගාව තුල සම්පත් භාවිතා කරන ප්‍රජාව දැනුවත්ව හෝ නොදැනුවත්ව සිදු කරණු ලබන ක්‍රියාකාරකම් නිසා එල්ලංගාවේ පස, ජලය, වාතය, ශාක හා සත්ව හැසිරීම් රටාවන් දැඩි තර්ජනයකට ලක් වෙමින් පවතී. එබැවින් පරංගියවාඩිය එල්ලංගා පද්ධතියේ හරස්කඩ චාරිකාවේ දී හා වෙනත් මූලාශ්‍ර හරහා හඳුනාගත් පාරිසරික ගැටලු සවිස්තරාත්මකව පැහැදිලි කිරීම පහතින් ඉදිරිපත් කරමි.

### 3.2.4.1 වනාන්තර ආශ්‍රිත පරිසර පද්ධතිය

එල්ලංගාව තුල හෙක්ටයාර් 1400 කට වැඩි වපසරියක, එල්ලංගාවේ නැගෙනහිර හා දකුණු දිශාවන්ට මායිම්ව ඝන වනාන්තර ව්‍යාප්තව පවතී. මේවා ආනඋලුන්දාව වන රක්ෂිතයන්ට අයත් වේ. ඊට අමතරව හෙක්ටයාර් 100 ආසන්න ප්‍රමාණයක ලඳු කැලෑ ප්‍රදේශයන් එල්ලංගාවේ තැනින් තැන ව්‍යාප්තව පවතී. වියලි මිශ්‍ර සදාහරිත වනාන්තර හා කටු පඳුරු සහිත ලඳු කැලෑ එල්ලංගාවේ දැකිය හැකි වනාන්තර වර්ග වන අතර ඒවායේ වියළි කලාපීය මිශ්‍ර සදාහරිත වනාන්තරවල සුලබව දැකිය හැකි පලු, වීර, බුරුත, වෙලං, මොර, කලුවර, මයිල, මිල්ල, දඹ වැනි ශාක ඝන වනාන්තරවල ප්‍රමුඛ වන අතර සේරු, එරමිනියා, කටුපිල, දෙමට, කැලිය, දිවුල් වැනි ශාක ලඳු කැලෑවල ප්‍රමුඛ ශාක විශේෂ ලෙස හඳුනාගත හැකිය. එමෙන්ම වන අලි, ඌරන්, ඉත්තෑවන්, මීමින්නන්, ගෝනුන්, මුවන්, රිලවුන් හා වඳුරන් වැනි සිවුපාවුන්ද, තලගොයා, කබරගොයා, සර්පයින්, මැඩියන් වැනි උරගයන් හා උභය ජීවීන්ද වලි කුකුළන්, මයිනන්, කොක්කු, මොනරුන් කොබෙයියන්, කොණ්ඩ කුරුල්ලන් ආදි පක්ෂි විශේෂ එල්ලංගාවේ ප්‍රමුඛ සතත්ව විශේෂ වේ. මීට අමතරව වලසුන් හා දිවියන් වැනි සතුන්ද සිටින බවට ගම්මුන් පවසයි. මෙම වනාන්තර ප්‍රදේශ වලට යාබදව පරංගියවාඩිය හා කලුවාවල ගම්මාන ආශ්‍රිතව ජීවත් වන ප්‍රජාව පාරිසරික සේවාවන් රාශියක් වනාන්තර පරිසර පද්ධතියෙන් ලබා ගනී එනම් පළතුරු හා වෙනත් ආහාරයට ගත හැකි ශාකමය ද්‍රව්‍ය, ඖෂද වර්ග, මී පැණි, වගා කටයුතු සඳහා අවශ්‍ය කුඩා ලී, දර හා ගවයින් සඳහා ආහාර සපයා ගැනීම ආදී සේවාවන් වේ.




2010 වසරට සාපේක්ෂව 2024 වන විට එල්ලංගාව තුල වන ගහනය 3% කින් පමණ අඩු වී ඇති බව වන සංරක්ෂණ දෙපාර්තමේන්තු දත්ත 2023 අගෝස්තු ගූගල් චන්ද්‍රකා සිතියම් සංසන්දනයේදී තයවුරු කර ගත හැකිය. වසර 15 ට ආසන්න කාලය තුල හෙක්ටයාර 45 පමණ වන විනාශයක් සිදුව තිබීම අනෙකුත් එල්ලංගාවන්ට ශාපේක්ෂව අඩු බලපෑමක් වුවත් එය නොසලකා සිටීම වන විනාශයේ තීව්‍රතාවය වැඩිවීමට හේතු විය

හැක. ආනඋලුන්දෑව අධිරක්ෂිතය එල්ලංගාවේ වන ආවරණය වීම නිසා අදාල නිලධාරීන්ගේ අවධානය වැඩිවීම නිසාවෙන් අනවසර කැලෑ හෙලි කිරීම්, ඉඩම් අත්පත් කර ගැනීමට උත්සාහ කිරීම් යම් පාලනයක තිබුනත් අනාගතයේදී එය පාලනය කිරීම අසීරුවන වන තරමේ එල්ලංගා පද්ධතියට තර්ජනයක් වීමේ සම්භාවිතාවක් පවතී.
වන සතුන් දඩයම් කිරීම හා මස් සඳහා අලෙවි කිරීම එල්ලංගාව තුල ඉතා රහසිගතව සිදුවන ජාවාරමක් බව හඳුනා ගත හැකිය.

### 3.2.4.2 වැව් ආශ්‍රිත පරිසර පද්ධතිය



මෙම ඡායාරූපය පරංගියවාඩිය වැවේ බටහිර දිශාවේ උස්බිම් හරහා වැටී ඇති නිකවැව ප්‍රෙවිශ මාර්ගය අසල නොදිරන අපද්‍රව්‍ය ගොඩගසා තිබූ අයුරුය. මෙම අපද්‍රව්‍ය වර්ශාපතනය සමග හා වන සතුන් මගින් මීට යාබද පරංගියවාඩිය වැවට එකතු වීමට වැඩි ඉඩක් පවතී. මීටත් වඩා තර්ජනය වන්නේ වන සතුන් බහුලව ගැවසෙන ස්ථානයක මෙම අපද්‍රව්‍ය ගොඩගසා තිබීමයි. මෙමගින් ජලය, පරිසරය පරිහානිය හා වන ජීවින්ටද තර්ජනයන් සිදු වේ.
මීට අමතරව පරංගියවාඩිටය ඉහලින් වැව උඩහවැව වැවේ කුඹුරු යාය අතර ගස් ගොම්මන මගින් සකස්ව තිබූ ස්වභාවික පෙරහණය විනාශ වී තිබීම රොන්මඩ සෘජුව පරංගියවාඩිය වැවට ගලා ඒම පහසු කර ඇත. මීට අමතරව කලුවාවල වැවට ඉහලින් පවතින උස්බිම එළි පෙහෙලි කර වගා කටයුතු සිදු කරමින් පවතී.
පුරාණ වැවක දැකගත හැකි ප්‍රධාන අංග ලෙස ගස්ගොම්මන, කට්ටකාඩුව, පෙරහන, ඉස්වැටිය, තිස්බඹේ, කිවුල් ඇළ, පිටවාන ආදිය වේ. මෙම එක් එක් අංග මඟින් වැවේ ජල සංරක්ෂණය හා තිරසාර පැවැත්ම සහතික කිරිම සඳහා සුවිශේෂී කාරයභාරයක් ඉටු කරන අතර වැව් බැම්ම හරහා හරස් ජල කාන්දුව අවම කිරීම, වාෂ්පීකරනය අවම කිරිම, පාංශු ඛාදනය අවම විම, බැර ලෝහ රඳවා ගැනීම, ලවනීකරණය වැළැක්වීම වැනි පරිසර හිතකාමී කාර්යයන් රැසක් ඉටු කරනු ලබයි.. නමුත් මෑත අතීතයේ සිදුකල හා වර්තමානයේ දී සිදු කරන්නා වූ විවිධ වූ මානව ක්‍රියාකාරකම් හේතුවෙන් එල්ලංගාව තුළ පිහිටි වැව් පරිසර පද්ධතින් බොහොමයක් මේ වන විට පරිහානියට පත් වී ඇති බව දැකගත හැකිය. මේ නිසා එල්ලංගාවේ තිරසාර පැවැත්මට, පාරිසරික සේවාවන් දුර්වල වීමට, ජීවනෝපායන් අවහිර වීම වැනි පාරිසරික, සමාජීය හා ආර්ථික විපර්යාසයන්ට ජන ජීවිතය භාජනය වෙමින් පවතී. වැවේ ක්ෂුද්‍ර පරිසර පද්ධතිය හොඳින් පැවතීම, වැවේ හා පෝෂක ප්‍රදේශයේ ඵලදායිතාව හා තිරසාරත්වය කෙරෙහි සෘජුවම බලපායි.



මෙම එල්ලංගා වැව් ආශ්‍රිතව කුඹුක්, නඹඩ, තිඹිරි, කරඳ, මී, මයිල, කඳුරු, කැලිය, දෙඹට, කැප්පිටියා හා ඕලු, නෙළුම්, මානෙල්, කෙකටිය, පන් වර්ග වැනි දේශීය ජලජ ශාකද ජපන් ජබර, සැල්විනියා වැනි ආක්‍රමණශීලි ශාක ඇතුලුව විශාල පරාසයක ශාක විශේෂ දැකිය

හැකිය. එමෙන්ම කබර ගොයන්, කිඹුලන්, සර්පයින් වැනි උරගයින්, ගෙම්බන් වැනි උභය ජීවීන්, මත්ස්‍ය විශේෂ (ලූලා, තෙප්පිලියා, පෙතියා, කාවයියා වැනි ආවේණික මත්ස්‍යයින් හා තිලාපියා, මෙරිගෝල්ඩ් වැනි හඳුන්වා දුන් මත්ස්‍යයින්) හා පක්ෂීන් (කොක්කු, දියකාවන්, පිළිහුඩුවන් ආදි) ඇතුලු සත්ත්ව විශේෂ විශාල ප්‍රමාණයක් මෙම එල්ලංගාවේ වැව් ආශ්‍රිත පරිසර පද්ධතිය වාසස්ථාන ලෙස යොදාගෙන ඇත. විශේෂයෙන් කුඩාවැව හැරුනු විට එල්ලංගාවේ සියලුම වැව් ආශ්‍රිතව නිතර වන අලි ගැවසෙනු ඇත. හරස්කඩ සංචාරයේදී පරංගියවාඩිව වැව් තාවුල්ලේ දී අපට ඇස ගැටුනු දර්ශණයක් කැමරා කාචයේ සටහන් විම ඉහත ඡායාරූපයේ දැක්වේ.

### 3.2.4. 3 කෘෂිකාර්මික බෝග වගා පද්ධති ආශ්‍රිත පරිසර ගැටලු

එල්ලංගා පද්ධතිය තුල පහත සඳහන් කෘෂි බෝග වගා පද්ධති හඳුනා ගැනිමට හැකි විය.

- වර්ෂාපෝෂිත උස්බිම් වගාව - ප්‍රධාන වශයෙන් මාස් කන්නයේ බඩඉරිඟු වගාව ප්‍රමුඛව අතිරේක ආහාර බෝග වගාව
- කෘෂි ළිං ආශ්‍රිත බෝග වගාව- වර්ෂය පුරා එළවළු, පලතුරු හා අතිරේක ආහාර බෝග වගා කිරීම
- කුඹුරු ආශ්‍රිත බෝග වගාව - වැව් යටතේ හා වර්ෂාපෝෂිතව මාස් කන්නයේ වී වගාව හා යල කන්නයේ වී හෝ අතිරේක අහාර බෝග වගාව

එල්ලංගාවේ පරංගියවාඩිය ගම්මානයේ සිට කලුවාවල දෙසට වන්නට ඇති භූමි තීරුව හැරෙන්නට එළවළු, පලතුරු හා අතිරේක ආහාර බෝග වගා කරන ප්‍රෙද්ශ මෙම එල්ලංගාවේ ව්‍යාප්තව නැත. මෙම එල්ලංගාවේ ගොවිජන සේවා මධ්‍යස්ථානය හා පාසැල වටා ජනාකීර්ණ වූ ප්‍රෙද්ශයේ ශශ්ශ්‍රීකව වැඩුනු පොල් අඹ වැනි ස්ථිර බෝග වගාවන් සහිත ගෙවතු වගාවන් දකින්නට ඇති අතර මුලු භූමියෙන් 60% ක් පමණ වනාංතර වන අතර ඉතිරි භූමියෙන් අඩක්ම එනම් 19% යල මහා දෙකම වී වගා කරණ බිමය. 1% පමණ කුඩා බිම් ප්‍රමාණයක් අතිරේක බෝග වගාවන් සිදු කරන අතර ගෙවතුද ඇතුලුව 5% පමණ සුලු භූමි ප්‍රමාණයක් ගොඩ ඉඩම් වේ.

නමුත් පරංගියවාඩිය කුඹුරු යායේන් අඩක් පමණ වන පහල කොටස හා කලුවාවල වැවෙන් පෝෂණය වන පහත් බිම් යල කන්නයේදී අතිරේක බෝග වගාවන් සඳහා යෝග්‍ය ඉඩම්ය. 2020 යල කන්නය කොවිඩ් වසංගතය නිසාවෙන් රටම අක්‍රීය වූ අවස්ථවේ එමෙන්ම එම වසරේ යල කන්නයේ වගාවන් සඳහා වැව් වල ජලය ප්‍රමාණවත් නොවුනු තත්වය යටතේ පරංගියවාඩිය අතහරින ලද පහල කොටසේ කුඹුරු ඉඩම් හා කලුවාවල යාය සෝයා සහ මුං ඇට වගාකර ඉහල ආදායම් ගොවීන් ලබාගන්නා ලදී. මේ අනුව භෝග විවිධාංගිකරණය යටතේ යල කන්නය අතිරේක බෝග වගාවන් සඳහා යොදාගත හැකි යෝග්‍ය ඉඩම් ඇතත් වන අලි උවදුර බාධකයක්ව ඇත. මෙම එල්ලංගාවේ ජනාවාස වී ඇති පරංගියවාඩිය ගම්මානය ආශ්‍රත කුඹුරු පමණක් යල කන්නයේදී ව වගාකර එය වන අලින්ගෙන් ආරක්ෂා කර ගනීමට ගොවීන් හුරු වී ඇත.

පාංශු සංරක්ෂණ ක්‍රම අනුගමනය නොකරමින් වගා කටයුතු සිදු කරනු ලබන අතර එම නිසා පාංශු ඛාදනය සිදු වී ජලයත් සමඟ ගලාගොස් වැව් හා වෙනත් ඇළ මාර්ගවල රැදීම නිසා ඒවායේ ධාරිතාවයට හා යහපැවැත්මට තර්ජන ඇති කරයි. දිගින් දිගටම සිදුවන පාංශු ඛාදනය පාංශු හායන තත්ත්වයට පත් වී මෙම ඉඩම් ආන්තික ඉඩම් තත්ත්වයට පත් වීමේ විභවතාවයක්ද ඇත. එමෙන්ම, මතුපිට පස නොමැතිවීම නිසා පස තුලට ජල ක්ෂරණය හා කාන්දුව (Infiltration & Percolation) දුර්වල වීම නිසා මතුපිට අපදාවය (Run-off) වැඩිවීම නිසා පාංශු ඛාදනය ත්වර වී ඇත. කලුවාවල ගම්මානය හරහා වැටී ඇති මාර්ගය පාංශු ඛාදනයේ තීව්ර තාවය මනාවට පැහැදිලි කරයි.

මෙම එල්ලංගා පද්ධතියේ සියලු වැව් වල ආක්‍රමණශීලි ජලජ ශාක හා වෙනත් ජලජ ශාක දකින්නට නැත.

වන සතුන්ගෙන් එල්ලංගාව තුල බෝග වගාවන්ට හා බෝග වගා නිෂ්පාදනයන්ට සිදු කරණු ලබන හානිය 30% සිට 40% පමණ දක්වා පරාසයක විහිදී ඇති බව හරස්කඩ වාරිකාවේදී දැන ගත හැකි විය. වන අලි, රිළව්, මොනරුන්, දඬු ලේනුන් හා සමහර පක්ෂීන් විවිධ ආකාරයෙන් විවිධ අවස්ථාවන්හි දී බෝගයන්ට හා අස්වැන්නට හානි කරයි. මෙම සතුන්ගේ හානිය වසර පුරා එල්ලංගාව පුරාම සිදු කරණු ලබයි. වන අලින් විසින් බෝග විනාශයට අමතරව දේපල වලට හානි කිරීම, නිවෙස් වල ගබඩා කර ඇති අස්වැන්න හානි කිරීම, පහරදීම් නිසා ජීවිත හානි වීම් ද වාර්තා වෙයි. වන අලි මෙම එල්ලංගාවේ වැව් බැමි හරහා හා ඇළ වේලි පද්ධතීන් හරහා ගමන් කිරීම නිසා ඒවාට හානි වීම සිදු වෙයි. එමෙන්ම මිනිසුන්ගේ ක්‍රියාකාරකම් නිසා වන අලින්ට සිදුවන හිරිහැරද වැඩි වී ඇත. එනම් විවිධ පුපුරණ ද්‍රව්‍ය ආහාර තුළට ඇතුළ් කිරීම, වෙඩි තැබීම, ආහාර සමඟ වස මිශ්‍ර කිරීම හා තුවක්කු බැඳීම ආදි ක්‍රියා නිසා තුවාල ලබන හා මිය යන අලි ප්‍රමාණය ද ක්‍රමිකව ඉහළ ගොස් ඇති බව වන ජීවි නිළධාරීන් සමඟ සිදු කල සාකච්චාවන් හි දී හඳුනාගන්නා ලදි. මෙම අලි මිනිස් ගැටුම හා අනෙකුත් සතුන්ගේ ක්‍රියා නිසා කෘෂිකාර්මික බෝග අස්වැන්නෙන් සැලකිය යුතු කොටසක් (30% - 40%) එල්ලංගා ප්‍රජාවට අහිමි කරනු ලබයි. පදිංචි හැරයාම්, රාත්‍රී කාලයේ ගමනාගමනයට ඇති බිය, පිරිමි පුද්ගලයින් රාත්‍රී පැල් රැකීමට යාම නිසා කාන්තාවන් නිවෙස් වල තනිවීම වැනි සමාජීය ගැටලු ඇති වීමට ද වන අලි ගැටලුව බලපා ඇත.

වැව් රක්ෂිත වල අනවසරයෙන් වගා කිරීම්, කැලේ කැපීම වැනි අවස්ථා කීපයක් ම එල්ලංගා පද්ධති හරස්කඩ වාරිකාවේ දී නිරීක්ෂණය විය. විශේෂයෙන් වැව උඩහවැව කුඹුරු යාය පරංගියවාඩිය වැව් තාවුල්ල ආක්‍රමණය කර ඇත. මෙම එල්ලංගාවේ සියලුම වැව් ආනැඋලුන්දාව විශාල වන රක්ෂිතයන්ට මායිම්ව තිබීම නිසා සහා වන අලින්ගේ ගැවසීම නිරන්තරයෙන්ම සිදුවීම නිසා වනාංතර විනාශය මේ ආශ්‍රිතව පවතින අනෙකුත් එල්ලංගාවන් වල පවතින වනවිනාශයට ශාපේක්ෂව අඩු බලපෑමක පවතී.

### 3.2.5. රජයේ සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ තොරතුරු.

පසුගිය වසර 45 රජයේ සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක නොවූ අතර මෙම ප්‍රදේශය සිවිල් යුද්ධයෙන් පීඩාවට පත් විය. 2019 සිට ක්‍රියාත්මක දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය මඟින් මෙම එල්ලංගාවේ වැව් 04 ප්‍රතිසංස්කරණය කර ඇති අතර ඒ සඳහා රු.මිලියන 174 ක පමණ මුදලක් ආයෝජනය කර ඇත. එසේම ව්‍යාපෘතියේ දෙවන අදියර යටතේ තවත් වැව් 01 ක පුනුරුත්තාපන කටයුතු ආරම්භ කිරීමට යෝජිතය. මෙම එල්ලංගාවේ විශාලම වැව වන පරංගියවාඩිය වැව මධ්‍යම රජයේ වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් පාලනය කරන අතර දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය මඟින් ප්‍රතිසංස්කරණය කටයුතු සඳහා දායක නොවීය.

### 3.2.6. සමාජ ආරක්ෂණ තොරතුරු

පරංගියාවාඩිය එල්ලංගා පද්ධතිය තුල ගොවි පවුල් 290 ක් ජීවත් වන අතර ඔවුන්ගේ ප්‍රධාන ජීවනෝපාය වී ඇත්තේ කෘෂිකර්මාන්තයයි. සමාජ ආරක්ෂණ තක්සේරුවට අනුව පරංගියාවාඩිය එල්ලංගා පද්ධතියේ පවුල් 133 අවදානම් සහගත පවුල් වන අතර මෙම අවදානම් සහගත පුද්ගලයන් අතර වැඩිහිටියන්, අබාධිත පුද්ගලයන්, වැන්දඹු කාන්තාවන් දක්නට ලැබේ. බොහොමයක් පිරිස නබඩ වැව එල්ලංගාව යටතේ පදිංචිකරුවන් වන අතර පවුල් කිහිපයක් එල්ලංගාව පදිංචි කරුවන් නොවුණද, ඔවුන් එම ප්‍රදේශය තුළ කෘෂිකාර්මික කටයුතු වල නිරත වෙයි. සියලුම ගොවීන් කුඹුරු හා ගොඩ ඉඩම් භාවිතා කරමින් වගා කටයුතු වල නිරත වේ. කෘෂිකාර්මික කටයුතු කරන කාල සීමාවලදී, තාවකාලික පැල්පත් සාදා ගෙන ගොවීන් රාත්‍රී කාලයේදී තමන්ගේ වගා බිම් ආරක්ෂා කිරීමට ඇප කැප වී ඇත්තේ වන සතුන්ගෙන් තම වගාවන් ආරක්ෂා කිරීම සඳහාය. ඇත්තෙන්ම පරංගියාවාඩිය එල්ලංගා පද්ධතිය තුල ජීවත් වන සියලුම ගොවීන් වන අලි තර්ජනයට ඉතාමත් දරුණු ලෙස මුහුණ දෙන අතර ඒ හේතු නිසා අවස්ථා ගණනාවකදී, විශාල ගොවීන් පිරිසකගේ වගා බිම් විනාශ වී ඇත. ඒ හේතුව නිසාවෙන්

අස්වනු නෙළා ගැනීම වන තෙක් ඔවුන් තම වගා බිම් ආරක්ෂා කරන අතර ඉන් පසු වගා බිම් වල පැල්පත් ආදියෙන් ඉවත් වී යයි.

බොහෝ විට වැව් ජලය තිබෙන කාල වලදී එනම්, යල කන්නයේදී සහ මාස් කන්නයේදී වී ගොවිතැන මූලික කරගනිමින් කෘෂිකාර්මික කටයුතුවල නිරත වන අතර අතරමැදි කන්නයේදී මුං වගාව මූලික කරගනිමින් උඳු, තල, රටකජු වැනි වගාවන් වල නිරත වෙයි. ඒ සඳහා ගොවීන් වගා ළිං භාවිතා කරමින් ජලය ප්‍රයෝජනයට ගනු ලබන අතර එම කන්නයන් වලදී සැලකිය යුතු නිෂ්පාදනයක් සහ ආදායමක් ලබා ගැනීමට හැකි වී ඇත. මෙම ප්‍රදේශයට ආවේණික වූ ස්වභාවික විපත් දක්නට ලැබෙන අතර පරංගියාවාඩිය අශ්‍රිතව වැසි කාලයේදී ගං වතුර තර්ජනයක් දැකිය හැකි අතර අනෙකුත් කාල වලදී දරුණු ලෙස නියඟය දක්නට ලැබේ.

එමෙන්ම මෙම එල්ලංගාවට අදාලව විශාල ගොවීන් පිරිසක් හේන් ගොවිතැන සිදු කරන අතර හේන් ගොවිතැන තුල විවිධ බෝග වගා කරමින් වගා කටයුතු සිදු කිරීමට පෙළඹී ඇත. දීර්ඝ කාලයක් එකම බෝගය වගා කිරීම වෙනුවට බෝග විවිධාංගීකරණයට හුරු වී ඇත. නමුත් කෘෂිකාර්මික වශයෙන් තාක්ෂණික ක්‍රම භාවිතා කරමින් වගා කිරීමට අවශ්‍ය දැනුම, අවබෝධය, සහ කුසලතා ගොවීන් සතු නොවීම කෘෂිකර්මාන්තයේදී දක්නට ලැබෙන අඩුපාඩුවකි.

පරංගියාවාඩිය එල්ලංගාව තුල මත්ද්‍රව්‍ය සහ මත්පැන් භාවිතය පිලිබඳ සලකා බලන විට ඉතාමත් සීමිත පිරිසක් මත්ද්‍රව්‍ය භාවිතයට පුරුදු වී සිටී. දෛනික ජීවිතයේ ගොවිතැන රැකියාව කරගත් මිනිසුන් තම එදිනෙදා කටයුතු අවසානයේ මත් පැන් භාවිතයට හුරු වී සිටී. නමුත් එය සමාජයේ ජීවත් වන අනෙක් පුද්ගලයන්ට බාධාවක් සහ හිරිහැරයක් නොවන පරිදි සිදු කරනු ලබයි. නමුත් මෙමඟින් දරුවන් මත්පැන් වලට ඇබ්බැහි වීමේ ප්‍රවණතාවයක් දක්නට ලැබෙන අතර එය සමාජයට අහිතකර තත්ත්වයකි. තරුණ දරුවන් මත්පැන් වලට ඇබ්බැහි වීම වැලැක්වීම සඳහා ගොවි පවුල්වල දෙමව්පියන් මැදිහත් වන අතර දරුවන් යහමඟට ගැනීම සඳහා ඔවුන් මහත් වෙහෙසක් දරයි. එමෙන්ම පාසල් යන වයසේ දරුවන්ට විශේෂ රැකවරණයක් පාසලෙන් සහ පවුල තුලින් අපේක්ෂා කෙරේ. ඒ සඳහා ගම් මට්ටමින් දැනුවත් කිරීම් වැඩසටහන් සිදු කරනු ලබන අතර පාසැල තුලින්ද අවශ්‍ය දැනුම දරුවන්ට ලබා දෙයි.

පරංගියාවාඩිය එල්ලංගාව තුල ජීවත් වන ගොවි ප්‍රජාවගේ අධ්‍යාපන මට්ටම පිලිබඳ සලකා බලන විට ඔවුන් අතරින් සැලකිය යුතු ප්‍රමාණයක් අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිට ඇති අතර කිහිප දෙනෙකු එයින් සමත් වී ඇත. නමුත් අ.පො.ස උසස් පෙළ විභාගය සඳහා බොහෝ දෙනෙක් පෙනී සිට නැත. එසේ වීමට හේතු වී ඇත්තේ, කුඩා කාලයේදීම ඔවුන් කෘෂිකර්මාන්තය වැළඳ ගැනීමයි.

දැනට පරංගියාවාඩිය එල්ලංගා පද්ධතියේ දරුවන්ගේ අධ්‍යාපන මට්ටම පිලිබඳ සලකා බලන විට පෙර තිබූ තත්ත්වයට වඩා බොහෝ සෙයින් වෙනස් වී ඇත.මෙකල දරුවන් ඉතාමත් උද්යෝගීමත්ව සහ දැඩි උනන්දුවෙන් යුක්තව අධ්‍යාපන කටයුතු වල නිරත වීමට පෙළඹී ඇත. නිවෙස් වල පාසල් යන වයසේ සිටින දරුවන් සියල්ලම පාසල් යන අතර පාසල් ගොස් අවසන් වී ඇති දරුවන් බොහෝ දෙනෙක් වෘත්තීමය අධ්‍යාපනයට සහ වෙනත් උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ රැකියා අවස්ථාවන් වලට යොමු වී ඇත. මේ වන විට කෘෂිකර්මාන්තයට යොමු වන තරුණ ප්‍රජාවද මෙම එල්ලංගා පද්ධතිය ආශ්‍රිතව දක්නට ලැබෙන සාධනීය ලක්ෂණයකි. බොහෝ විට මෙම තරුණ ප්‍රජාව නවීන තාක්ෂණය භාවිතා කරමින් කෘෂිකර්මාන්ත කටයුතුවල නිරත වේ. බොහෝ ගොවි පවුල් තුල ආර්ථික අපහසුතා දක්නට ලැබෙන අතර ඒ හේතුවෙන් දරුවන්ට පාසල් යාමේ දුෂ්කරතා පවතී. නමුත් දරුවන් පාසල් අතහැර යාම පිලිබඳ කිසිවක් වාර්තා වී නොමැත.

මීට අමතරව පරංගියාවාඩිය එල්ලංගාවට අදාලව මිනිසුන් සමාජ ප්‍රශ්න වලට බොහෝ සෙයින් මුහුණ නොපාන අතර සමාජමය වශයෙන් පිරිස එකතු වී කතා බහ කර අන්‍යෝන්‍ය සම්බන්ධතාවය වර්ධනය කර ගෙන එල්ලංගාවේ වැව්වලට අදාල නඩත්තු කටයුතු සිදු කරගෙන කෘෂිකාර්මික ක්‍රියාකාරකම් සංවර්ධනය කිරීමට මහත් වෙහෙසක් දරයි. එහෙත් සාමාන්‍යයෙන් ගම්වල සමාජමය වශයෙන් එකතු නොවන පිරිසක්ද දක්නට ලැබේ. නබඩවැව එල්ලංගා පද්ධතිය තුලද එවැනි කොටසක් ජීවත් වන අතර ඔවුන්ට සමඟිව එක්ව සමඟිව රැස්ව එල්ලංගා පද්ධතිය සංවර්ධනය කරමින් කෘෂිකර්මාන්තය සංවර්ධනය කරලීමට අපේක්ෂාවක් නොමැත. එවැනි කොටස් ගම්වල ජීවත්වීම සාමාන්‍ය තත්ත්වයකි. වැව් නඩත්තු කටයුතු හා ජල කළමනාකරණ කටයුතු පිලිබඳ යම් දැනුමක් පවතින අතර ඒ ඔස්සේ එම

කටයුතු සිදු කරයි. නමුත් ජල කළමනාකරණ ක්‍රියාවලියේදී තාක්ෂණික ක්‍රම ශිල්ප හා දැනුම භාවිතා කරමින් එම කටයුතුවල නිරතවීම පිළිබඳ අවබෝධය ඉතාමත් අවම මට්ටමක පවතී.

පරංගියාවාඩිය එල්ලංගාවල ප්‍රදේශය තුල ගොවි සංවිධාන, නිෂ්පාදන සමිති මූලික වේ. කාන්තා සමිති, ජල සමිති, මරණාධාර සමිති වැනි ප්‍රජා මූලික සංවිධාන හා සමාජ සංවිධාන පවතින අතර එම සංවිධාන සහ සංඛ්‍යාව පහත පරිදි වේ.

| සංවිධානය | සංඛ්‍යාව | සාමාජික සංඛ්‍යාව |
|---|---|---|
| නිෂ්පාදන සමිති | 2 | 180 |
| ගොවි සංවිධාන | 2 | 392 |
| කාන්තා සමිති | 4 | 190 |
| මරණාධාර සමිති | 1 | 247 |
| ජල සමිති | 1 | 210 |

**<u>සමාජීය පරිවර්තනය හා කෘෂිකාර්මික පැවැත්ම</u>**

පරංගියවාඩිය ජනතාව බහුතරයක් යල කන්නයේ වගාවන්ගෙන් බැහැරව කොළඹ ප්‍රෙද්ශයට සංක්‍රමණය වීමේ මෙම පුදේශයේ ජීවන චරියාවේ කොටස් කරුවන්ය. ප්‍රමානවත් ජලය නොමැතිවීම, වන ලි උවදුර හා කාලයක් තිස්සේ ඔවුනගේ චර්යාව හැඩගැසී තිබූ ආකාරය අනුව ආර්ථින අවදානම අවම ක්‍රියාකාරිත්වය ලෙස කොළඹට සංක්‍රමණය වීම ශවුන් තෝරාගෙන තිබුණි. CSIA ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීමත් සමග වැව් ප්‍රතිසංස්කරණය, ජල කළමනාකරණය විධිමත් කිරීම හා වර්ෂාව සමඟ වගා කටයුතු ආරම්භ කිරීමට ගොවීන් උනන්දු කිරීම මෙන්ම වගා ලිං සංවර්ධනයට සහාය වීම නිසා අමතරවඅතරමැදි කන්න වගාවට සහ යල කන්නයේ මූලකව වී වගාවත් එසේම අතිරේක බෝග වගාව සඳහා ගොවීන් පෙළඹී ඇත. මේ අනුව වගා තීව්රතාවය 200% ඉක්මවා තිබීම ව්‍යාපෘතියේ මැදිහත් වීමෙන් සිදුවූ බව සතුටින් සඳහන් කරමු.
මෙම පරිවර්තණය කෙටි කලකින් සිදුකිරීමට හැකි වූ ප්‍රධාන සාධකය වන්නේ 2020 යල කන්නය ආරම්භක වකවානුවේ කොවිඩ් වසංගතය නිසාවෙන් රටම වසා තිබූ සංක්‍රමන තහංචි රටතුල ක්‍රයාත්මකව පැවතී වටපිටාවක වීම හා ඒ සමග වසරකට අධික කාලයක් රට මුනදුන් දරුණු ආර්ථික අවපාතය හේතුවෙන් කොළඹ ආශ්‍රිතව රැකියා අවස්ථාවන් නොමැති වීමත්ය. මෙම සාධක 2020 යල කන්නය ඔවුනගේ ජීවන රටාව යහපත් දිසාවකට වෙනස් කිරීමේ හැරවුම් ලක්ෂය විය. මේ හේතුවෙන් ප්‍රදේශයෙන් බැහැර වීමේ ජීවන චර්යාව නතර විය. මෙම තත්වය උද්ගත වීම හා CSIA ව්‍යාපෘති ක්‍රියාකාරකම් ගොවීන් අතරට ගෙනයන පලමු වගා කන්නය 2020 යල කන්නය වීම මගින් මෙම යහපත් පරිසරය නිර්මානය කරන ලදී. රටම වසා තිබියදී ව්‍යාපෘතිය ගම්වලට ගොස් යල කන්නය සඳහා බීජ කොම්ලේ ලබාදීම හා ගොවීන්ට කෘෂිකර්මයේ යෙදෙවෙනවා විනා වෙනත් විකල්පයක් නොතිබීමත් ආනයන සීමා වීම හා කෘෂිකාර්මික නිෂ්පාදන වල හිගයක් ඇතිවීම යන සාධක නිසාවෙන් ඉහල ආදායම් ගොවීන් ලබාගැනීම නිසා යල කන්නයන් වල අතිරේක බෝග වගාව සඳහා ගොවීන් පෙළඹවීමේ ව්‍යාපෘති අරමුණ ශාක්ශාත් කිරීමට පසුබිම සකස් විය. 2020 යල කන්නයේ ලබාගත් ප්‍රතිලාභ නිසාවෙන් හා ව්‍යාපෘතිය ලබාදුන් යෙදවුම් සහාය හා පුහුණු වැඩසටහන් මගින් ලබාදුන් තාක්ෂණික සහාය, ඉන් පසු කන්න වලදී මෙම තත්වය තිරසාර කිරීමට පසුබිම සකස් විය.

## වාරිත්‍ර සහ විශ්වාස

පරංගියවාඩිය එල්ලංගාවද මෙම ප්‍රෙද්ශයේ පාරම්පරික ඇදහිලි හා විශ්වාසයන් සමග බැඳී පවතී. පුල්ලයාර් දෙවියන් මූලික කරගෙන පුද පූජා පවත්වන අතර වැව්වල යම් කටයුත්තක් වේද, ඒ සඳහා දෙවියන්ගෙන් අවසර ගැනීම සිදු වේ. ඊට අමතරව අස්වනු නෙලීමෙන් පසු ලබා ගන්නා අස්වැන්නෙන් කිරි ඉතිරීමේ මංගල්‍ය සිදු කරන අතර ඒ සඳහා ගමේ සියලුම ප්‍රජාව සම්බන්ධ වේ. මීට අමතරව වසර කීපයකට වතාවක් සිදුකරන වන්නියට ආවේණික මුට්ටි නැමීමේ මංගල්‍යක් පවත්වා දෙවියන් පුදා තම කෘෂිකාර්මික කටයුතු සශ්‍රීක කර දෙන ලෙස ඉල්ලීම සිදු කරයි.

## කාන්තා සංවර්ධනය

පරංගියවාඩිය එල්ලංගා පද්ධතියේ කාන්තාවන්ද විවිධ අභියෝග වලට මුහුණ දෙයි. නමුත් මොවුන්ගේ විශේෂත්වය වන්නේ එම අභියෝගයන් ජය ගැන්මට රටටම ආදර්ශය සපයන උපුල් කාන්තා සමිතිය ගොඩනගාගෙන රුපියල් මිලියන 70 ට අධික ප්‍රාග්ධනයක් දක්වා ගොඩනගාගෙන තිබීමයි.

වසර 40 අධික දුෂ්කර වැයමක් මගින් විවිධ ආර්ථික කටයුතු වල නියැලෙමින් මුලු එල්ලංගා ප්‍රෙද්ශයම ආවරණය වන ණය ලබාදීම, වී මිලදී ගැනීම හා සහල් සැකසීම මූලිකව විවිධ ව්‍යාපාරික කටයුතු වල නියැලෙමින් සෑම සාමාජිකයෙක්ම රු. ලක්ෂ 5 ට වැඩි ප්‍රාග්ධන හිමිකාරිත්වයක් ගොඩනගාගෙන ඇත. මෙම ප්‍රදේශවලට අනගි සම්පතක් වන වැව ආශ්‍රිත පරිසරය ආරක්ෂා කරමින් තම පවුල ආර්ථිකමය වශයෙන් ඉහළ මට්ටමකට ගෙන ඒමට දායක වෙමින් රටේ දළ ජාතික නිෂ්පාදන ක්‍රියාවලියට ඵලදායී දායකත්වයක් ලබාදීමට ඔවුන් සමත්ව ඇත.

එල්ලංගාවට අදාළ කාන්තාවන් පිළිබඳ සලකා බලන විට බොහොමයක් කාන්තාවන් තම ස්වාමිපුරුෂයන් සමඟ එක් වී කෘෂිකාර්මික කටයුතුවල නිරත වෙයි. ඊට අමතරව පවුල තුල දරුවන් රැක බලා ගැනීම, දරුවන් පෝෂණය කිරීම වැනි කාර්යයන්වලදී ඉහළ වගකීමක් දරයි. මුල් කාලීනව කාන්තාවන් පවුල තුලට පමණක් සීමා වෙන අතර ගෙදර දොර වැඩ සිදු කලද, පසු කාලීනව පවුල තුල ඇති වන ආර්ථික ගැටළු හමුවේ කෘෂිකාර්මික ක්‍රියාකාරකම් වලට නැඹුරු වී ඇති බව නිරීක්ෂණය වුවත් මෙම එල්ලංගාවේ කාන්තාවන් ඊට එහා ඵලදායි ආර්ථික ක්‍රියාවලියකට දායක වූ ආදර්ශමත් හා සවිබල ගැන්වුන කාන්තා ප්‍රජාවක් නියෝජනය කරයි.

බොහොමයක් පවුල් වල සිටින කාන්තාවන්ගේ අධ්‍යාපන මට්ටම යම් පමණකට හොඳ මට්ටමක පවතින අතර එල්ලංගාවට අදාලව පවත්වන සමිති සමාගම්වල කටයුතු අවබෝධයකින් සහ පිළිවෙලකින් යුතුව සිදු කිරීමට හැකි වී ඇත.

එල්ලංගාව තුල වැන්දඹු කාන්තාවන්, කාන්තා මූලික පවුල් දක්නට ලැබේ. ඔවුන් තම එදිනෙදා ජීවිතයේ කාර්යයන් හා කෘෂිකාර්මික කටයුතු තනිවම සිදු කරගන්නා අතර දරුවන් සිටින පවුල්වල දරුවන්ගේ රැකවරණ කටයුතු පිළිබඳවද අවධානය යොමු කරයි. එල්ලංගාව තුල වැන්දඹු කාන්තාවන් 18 දෙනෙකු පමණ සිටින අතර 38 දෙනෙකු පමණ කාන්තා මූලික පවුල් වේ. ඉහත කාන්තා සමිතියේ සාමාජිකයන් හා සැලකිය යුතු කාන්තාවන් ප්‍රමාණයක් ස්වයං රැකියා කටයුතුවල නිරත වෙමින් පරංගියවාඩිය ගොවිජන සේවා මධ්‍යස්ථානටය් වැව් ගම් පුබුදුව ව්‍යාපෘතිය මගින් සකස් කල සති පොලද ඵලදායි ලෙස කාන්තාවන් පරිහරණය කරයි. ඔවුන් සිදු කරනු ලබන ස්වයං රැකියා අතර සහල් නිෂ්පාදනය, තුනපහ කුඩු සැකසීම, ඇඳුම් මැසීම, පොල් තෙල් නිෂ්පාදනය කිරීම, බ්ලොක් ගල් නිෂ්පාදනය සහ උපුල් කාන්තා සමිතියේ වී මෝල පවත්වාගෙන යාම ප්‍රධාන තැනක් ගනී.

මෙම එල්ලංගාවට අයිති ගම්මාන වල හරස්කඩ සංචාරයේදී ප්‍රජාව සමඟ කරන ලද සාකච්ඡාවලින් සහ අනෙකුත් මූලාශ්‍රවලින් ලබා ගත් තොරතුරු අනුව මෙම එල්ලංගාව ආශ්‍රිතව ජීවත්වන සියලුම පවුල්වල ප්‍රධානතම ජීවනෝපාය වනුයේ කෘෂිකර්මාන්තයයි . කාන්තාව පවුලේ ප්‍රබලම භූමිකාව නිරූපණය

කරයි. පවුල් පෝෂණය, සෞඛ්‍ය වගේම අනොන්‍ය සම්බන්ධතා රැක ගැනීම යනාදී වගකීම් ගෘහණියගේ ප්‍රබලතම කාර්යයන් වී ඇත.

### 3.2.7. එල්ලංගා පද්ධතියේ කෘෂි කාර්මික බෝග වගා රටා (Cropping Patterns) පිළිබඳ තොරතුරු

හෙක්. 2346 පමණ ආවරණය වන පරංගියාවාඩිය එල්ලංගාව වැව් 6 කින් සමන්විතය. දල වශයෙන් හෙක්. 436 පමණ වී වගා බිම් ඇති අතර වැව් වලින් පෝෂණය වන අතර ඉතිරිය වර්ෂා පෝෂක වගා බිම්ය. මහ කන්නයේ වර්ෂාව සමග හෙක්. 61ක් පමන ගොඩ බෝග වගාව කෙරෙන අතර 80කට අධික වගාළිං භාවිතා කරමින් හෙක්. 105 අධික අතිරේක බෝග, එළවලු වගාවන් සිදු කෙරේ. මෙම වගා ළිංවලින් 70 ක් ව්‍යාපෘතිය මගින් සංවර්ධනය කර ඇත.

පරංගියාවාඩිය එල්ලංගාව පද්ධතිය තුල වැව්වල සහ අමුණු වැව් යටතේ ගොවි පවුල් සංඛ්‍යාව 427 ක් පමණ කෘෂිකාර්මික කටයුතු කරනු ලබයි. මීට අමතරව හේන් වගා හා බහු වාර්ෂික බෝග වගා කරන ගොවීන් සංඛ්‍යාව 64 ක් පමණ වේ. බහු වාර්ෂික බෝග ලෙස හෙක්ටයාර 95 ක පමන ගෙවතු ආශ්‍රිතව කෙසෙල්, පේර, පොල් හා අඹ වගාවන් වේ. එල්ලංගාවේ ප්‍රධාන පාංශු කාණ්ඩය රතු දුඹුරු පස වන අතර ඊට අමතරව ලොම් හියුමික් අලු පස් හා බොරළු හා ගල් සහිත ප්‍රදේශයන්ද දැකිය හැක. මුළු පද්ධතියට අයත් භූමි ප්‍රමාණයෙන් 25% ක් පමණ වගා කටයුතු සඳහා යොදා ගෙන ඇති අතර 64.5% ක් පමණ කැලෑ හා ලඳු කැලෑ වේ.

එල්ලංගාවේ වාර්ෂික සාමාන්‍ය වර්ෂාපතනය මිලි මීටර 750 ක් වන අතර පසුගිය වසර 10 ක වර්ෂාපතන රටාව සැලකූ විට යල කන්නයට අඩු වර්ෂාපතනයකුත් මහ කන්නයට සාපේක්ෂව වැඩි වර්ෂාපතනයක්ද බොහෝ ප්‍රදේශවලට ලැබී ඇත. එල්ලංගා පද්ධතිය තුල වගා කටයුතු සිදු කරනු ලබන ප්‍රධාන වැව් 9 ක් ඇති අතර සියළුම වැව් යටතේ මහ කන්නයේ ප්‍රමාණවත් වර්ෂාපතනයක් ලැබුනු පසු වී වගාවන් කිරීමත්, ගොඩ ඉඩම් ප්‍රදේශවල හෙක් 61 ක් පමණ හේන් වගාවත් බහු වාර්ෂික බෝග වගාවන් සිදු කරනු ලබයි. හේන් වල ප්‍රධාන වශයෙන් කුරක්කන්, මුං, කව්පි, රටකජු, තල වැනි බෝග වගා කරන අතර මීට අමතරව මිරිස් හා එළවළු වර්ගද හේන් තුල වගා කරනු ලබයි. මහ කන්නය තුල වගා කරන භූමියෙන් 99% ක් ම වී වගාකරනු අතර බඩ ඉරිගු 96% ක් පමණ හේන් තුල වගා කරනු ලබන අතර 4% ක් පමණ රටකජු සහ එලවලු වගා කරනු ලබයි. ජලය ප්‍රමාණවත් නොවීම නිසා යල කන්නයේදී එල්ලංගාවේ වැව් යටතේ වී වගාව කරනු ලබන බිම් ප්‍රමාණය අඩුවන අතර එම කුඹුරු ඉඩම්වල මුං ඇට , රටකජු, කව්පි වැනි අතිරේඛ ආහාර බෝග සාමාන්‍යයෙන් වගා කෙරේ. එසේම වගා ළිං ආශ්‍රිතව හෙක්ටයාර් 105 ක් පමණ රටකජු, මුං, කව්පි, බඩඉරිගු ඇතුලු අතිරේඛ ආහාර බෝග සහ එලවලු වගා කරයි. එසේම ජල පහසුව නිසා මහ කන්නයේ වැඩිපුර කුඹුරු ඉඩම් වල වි වගා කිරීමට හැකි වී ඇති අතර පසුගිය කන්න 5 ක බෝග වගා රටාව පහත වගු අංක 7 හි දක්වා ඇත.

*වගුව 7- පසුගිය කන්න 5 හි එල්ලංගාව තුල පිහිටි වැව් වල බෝග වගා රටාව(ව්‍යාපෘති මැදිහත්වීම)*

| අනු අංක | වැව | 2023 යල (හෙක්ටයාර) | | 2022/23 මහ (හෙක්ටයාර) | | 2022 යල (හෙක්ටයාර) | | 2021/22 මහ (හෙක්ටයාර) | | 2021 යල (හෙක්ටයාර) | | 2020/21 මහ (හෙක්ටයාර) | | 2020 යල (හෙක්ටයාර) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | වී | අතිරේක බෝග | වී | අතිරේක බෝග | වී | අතිරේක බෝග | වී | අතිරේක බෝග | අතිරේක බෝග | වී | අතිරේක බෝග | වි | වී | අතිරේක බෝග |
| 1 | පරංගියාවාඩිය වැව | | 60 | 300 | | 7 | 63 | 300 | | 70 | 5 | | 300 | 5 | 55 |
| 2 | වැව උඩහවැව | | | 38 | | | | 18 | | 5 | | | 18 | | |
| 3 | බ්‍රහමමනවැව | | | 20 | | | | 18 | | | | | 20 | | |
| 4 | නිකවැව | | | 40 | | | | 40 | | | | | 40 | | |
| 5 | කලුවාවලවැව | | 70 | 72 | | 10 | 60 | 72 | | 62 | 8 | | 72 | 4 | 50 |
| 6 | නව කුඩාවැව | | 3 | 3.2 | | | 3 | 3.2 | | 3 | | | 3.2 | | 3 |
| | එකතුව | 0 | 133 | 473.2 | 0 | 17 | 126 | 451.2 | 0 | 140 | 13 | 0 | 453.2 | 9 | 108 |

*මූලාශ්‍රය - ගොවි සංවිධාන/පරංගියාවාඩිය ගොවිජන සේවා මධ්‍යස්ථානය*

ඉහත වගුව පසුගිය වසර 4 තුල සියලුම වැව් යටතේ මහ කන්නයේ වගා කර ඇත්තේ 2020/2021, 2021/2022, /2022/2023 මහ කන්නවල පමණි. එසේම යල කන්නයේ අතිරේක ආහාර බෝග වගාවක් සිදු කර ඇති අතර අතිරේක බෝග වගාවද මුලු වගා බිම් ප්‍රමාණයේම සිදු කර නැත. තවද වර්ෂාව ප්‍රමාණවත් නොවීම, මනා ජල කලමනාකරණයක් නොමැතිවීම සහ එල්ලංගාවේ ජල පාරිභෝගිකයින් විශාල සංඛ්‍යාවක් සිටීම යනාදී හේතු නිසා සෑම කන්නයක්ම අඛණ්ඩව වගා කිරීමට නොහැකි වී ඇත.

එසේ වුවද වාරිමාර්ග පුනරුත්ථාපනය, ජල කලමනාකරණය, දේශගුණ සුහුරු කෘෂිකාර්මික තාක්ෂණික ක්‍රම හඳුන්වාදීම සහ ගොවි සංවිධාන ශක්තිමත් කිරීම මගින් ඉහත බෝග වගා රටාව වෙනස් කිරීමට දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය අපේක්ෂා කරන අතර යෝජිත බෝග වගා රටාව පහත වගු අංක 9 හි දැක්වේ.

යල කන්නය සඳහා බෝග රටාවන් තෝරාගැනීමේදී ජල කලමනාකරණයේදී භාවිතා කරන සංකල්ප සහ මුලධර්ම පදනම් කර ගෙන පහත සඳහන් දත්තයන් භාවිතාකර එනම්,

- මාසික සමාන්‍ය වර්ෂාපතනය
- අදාල ජලදහරා ප්‍රදේශයේ මාසික ජල අපදාවය(Monthly waste of water)
- වැවට අදාල ප්‍රධාන ජල ධාරාව
  WEAP Schematic and Scenario Analysis මගින් පහත අගයන් ගණනය කරනු ලබයි
- අදාල වැවේ පුනුරුත්තාපනයට පෙර ජල ධාරිතාව
- අදාල වැවේ පුනුරුත්තාපනයෙන් පසු ධාරිතාව සහ ජල සැපයුම
- ජල ඉල්ලුම
- බෝග වගා ප්‍රතිශතය
- ජල සැපයුම් විශ්වාශනියත්ව ප්‍රතිශතය
- ආර්ථික ඵලදායිතා ප්‍රතිශතය
- වැවෙන් බලාපොරොත්තු වියහැකි සැපයුම් ප්‍රතිශතය

ඉහත අගයන් පදනම් කරගෙන ආර්ථික ඵලදායි සහ ජල ඵලදායි බෝග රටාව තිරණය කරනු ලැබේ.

1.මහ කන්නයේ වී වගාව, මාස 3-3 1/2 ප්‍රභේද

2.යල කන්නය - වී වගාව මාස 3 ප්‍රභේද

3.යල කන්නය -මුං ,කව්පි,රටකජු, එලවලු

4.යල කන්නය-මුං, කව්පි,සෝයා ,මිරිස්

5. යල කන්නය-මුං, කව්පි,බඩ ඉරිගු,රටකජු

6. යල කන්නය-මුං, කව්පි,සෝයා,රටකජු ,

බෝග ජල අවශ්‍යතාවය පහත වගු 8 හි දක්වා ඇති අතර එය පදනම් කරගෙන වැවේ තිබෙන ජල ප්‍රමාණය අනුව වගා කරනු ලබන බෝග වර්ග නිර්දේශ කර ඇත.

*වගුව 08 - බෝග ජල අවශ්‍යතාවය ( අක්කර 1ක භූමි ප්‍රමාණයක් සඳහා )*

| බෝගය | කන්න අනුව අක්කර 1 සඳහා සාමාන්‍ය ජල අවශ්‍යතාවය ( මිලි.ලී.) | |
|---|---|---|
| | යල | මහ |
| වී ( මාස 3 ½) | 1250 | 910 |
| මිරිස් | 920 | 590 |
| රටකජු | 735 | 395 |
| බඩඉරිඟු | 825 | 460 |
| ලොකු ළූණු | 700 | - |
| මුං | 460 | 245 |
| කව්පි | 770 | 370 |
| සෝයා | 710 | 390 |

බෝග ජල අවශ්‍යතාවය පදනම් කරගෙන එල්ලංගාව සඳහා යෝජිත බෝග වගා මෙම පහත වගු අංක 09හි දැක්වේ.

*වගුව 09- දේශගුණික සුහුරු වාරි කෘෂි ව්‍යාපාතිය මගින් වැව් පුනුරුත්තාපනය කල පසු යෝජිත බෝග රටාව*

| අනු අංක | වැව | කුඹුරු වගා බිම් ප්‍රමාණය (හෙක්) | ගොවි පවුල් ගණන | යල කන්නයේ බෝගවිවිධාංගිකරණය කිරීමට යෝජිත බෝග වර්ග සහ බිම් ප්‍රමානය (හෙක්) | | | | | | | | මහ කන්නයේ යෝජිත බෝග සහ බිම් ප්‍රමානය (හෙක්) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | මුං | බඩ ඉරිගු | ක ව්පි | රට කජු | සෝ යා | මිරිස් | එලවලු | යල වි | වී |
| 1 | **පරංගියාවාඩිය වැව** | 300 | 315 | 20 | 10 | 10 | 10 | 10 | 5 | 5 | 10 | 300 |
| 2 | වැව උඩහවැව | 18 | 10 | | | | | | | | | |
| 3 | බ්‍රහමමනවැව | 35 | 15 | | | | | | | | | |
| 4 | නිකවැව | 40 | 15 | | | | | | | | | |
| 5 | කලුවාවලවැව | 72 | 70 | 10 | 5 | 10 | 5 | 5 | 2 | 5 | 12 | 72 |
| 6 | කුඩාවැව | 3.2 | 2 | 2 | 1.2 | | | | | | | |
| | | 468.2 | 427 | 32 | 16.2 | 20 | 15 | 15 | 7 | 10 | 22 | 372 |

*මූලාශ්‍රය - දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය මගින් සිදුකරන ලද ජල විද්‍යාත්මක තක්සේරු වාර්ථාව*

ව්‍යාපෘතිය ආරම්භයේදී සිදුකරන ලද මූලික සමීක්ෂණයේදී (සංවේදි කලාප සඳහා වන කෘෂි තාර්මික සැලැස්ම) හඳුනාගත් පරිදි කුඹුරු අක්කරයක වී අස්වැන්න බුසල් 81.5 ට පහල මට්ටමක පැවතුණි. හරස්කඩ චාරිකාවේදී හඳුනාගත් පරිදි හොඳ බීජ වී පරිහරණය නොකිරීම අස්වැන්න අඩුවිමට ප්‍රධාන හේතුවකි. යල කන්නයේදීද වී වගාකල හැකි වැව් කීපයක්ම තිබුණද ඒවා සමග බීජ වී නිෂ්පාදනයට ගොවීන් යොමු වී නොමැත. යල කන්නයේදී මහ කන්නයේ වි වගාව සඳහා අවශ්‍ය බීජ වී නිෂ්පාදනය කල යුතුවේ.

මහ කන්නයේ වි වගාව ගොවියාගේ ආර්ථිකයේ ප්‍රධාන තැනක් ගන්නා බැවින් මෙහිදී වැඩි ඵලදායිතාවයක් ලබා ගැනිම සඳහා යෝජිත දේශගුණ සුහුරු කෘෂි ක්‍රියාකාරකම් යටතේ යෝජිත බිම් ප්‍රමාණයන් පහත වගු අංක 10හි දැක්වේ.

**වගුව 10 - යෝජිත දේශගුණ සුහුරු කෘෂි ක්‍රියාකාරකම් යටතේ යෝජිත බිම් ප්‍රමාණයන්**

| අනු අංක | වැව | කුඹුරු වගා බිම් ප්‍රමාණය (හෙක් | ඒකාන්තර ජල පාලනය ඒකක | මහ කන්නයේ වී වගාව සඳහා ක්‍රියාකාරකම් වපසරිය (හෙක්) | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | බීජ වප්කරය භාවිතය | පැල සිටුවීමේ යන්ත්‍රය | පැරෂුට් ක්‍රමය | පෙර වැස්ස සමග බිම් සැකසීම | කාබනික ද්‍රව්‍ය එක් කිරීම | පත්‍ර වර්ණ දර්ශක භාවිතය |
| 1 | පරංගියාවාඩිය වැව | 300 | 300 | 100 | 10 | 20 | 300 | 200 | 300 |
| 2 | වැව උඩහවැව | 18 | 18 | 10 | | 8 | 18 | 18 | 18 |
| 3 | බ්‍රහමමනවැව | 35 | 35 | 30 | 5 | | 35 | 30 | 35 |
| 4 | නිකවැව | 40 | 40 | 40 | | | 40 | 20 | 40 |
| 5 | කලුවාවලවැව | 72 | 72 | 40 | 10 | 22 | 72 | 60 | 72 |
| 6 | කුඩාවැව | 3.2 | 3.2 | | | 3.2 | 3.2 | 3.2 | 3.2 |
| | | 468.2 | 468.2 | 220 | 25 | 53.2 | 468.2 | 331.2 | 468.2 |

*මූලාශ්‍රය - දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය උතුරු මැද පළාත් කාර්යාලය*

යල කන්නයේදි එල්ලංගාවේ පිහිටි කුඹුරු හා ගොඩ ඉඩම් සඳහා යෝජිත බෝග වගා රටාව පහත වගු අංක 11හි දැක්වේ.

**වගුව 11- යල කන්නයේ එල්ලංගාවේ කුඹුරු හා ගොඩ ඉඩම් වගාව සඳහා යෝජිත බෝග වගා රටාව**

| අනු අංක | වැව | කුඹුරු වගා බිම් ප්‍රමාණය (හෙක්) | යල කන්නය සඳහා යෝජිත බෝග වගා රටා සහ ක්‍රියා (හෙක්) | | උස්බිම් වගාව (ගෙවතු වගා සංවර්ධන) ඒකක | කුඹුරු ඉඩම් අතරමැදි කන්න වගාව |
|---|---|---|---|---|---|---|
| | | | අතිරේබ ආහාර බෝග | වී වගාව | | |
| 1 | පරංගියාවාඩිය වැව | 300 | 120 | 120 | 30 | 100 |
| 2 | වැව උඩහවැව | 18 | 10 | 5 | 3 | |
| 3 | බ්‍රහමමනවැව | 35 | 20 | 5 | 4 | |
| 4 | නිකවැව | 40 | 20 | 20 | 2 | |
| 5 | කලුවාවලවැව | 72 | 40 | 30 | 8 | 40 |
| 6 | කුඩාවැව | 3.2 | 3.2 | 0 | 2 | |
| | | 468.2 | 213.2 | 150 | 49 | 140 |

*මූලාශ්‍ර - මූලාශ්‍රය - දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය උතුරු මැද පළාත් කාර්යාලය*

**විශේෂිත කරුණු**

- යල කන්නයේ කුඹුරු ඉඩම් තුල අතිරේක අහාර බෝග වගාව අතරින් රටකජු ප්‍රධාන වන අතර සහ අතරමැදි කන්නයේ මුං වගාව ප්‍රධාන තැනක් ගනි. මෙහිදි නියං ප්‍රතිරෝධි, කෙටිකාලින ප්‍රභේද, රෝග ප්‍රතිරෝධී ප්‍රභේද ප්‍රධාන වේ.
- විශේෂයෙන් ගොඩ සහ මඩ ඉඩම් සඳහා කාබනික ද්‍රව්‍ය කොල පොහොර බෝග අවශේෂ වසුන්ලෙස යොදා ගැනිම, සන්හෙම්ප් වැනි රනිල බෝග වගා කර පසට යෙදීම වැනි ක්‍රියාකාරකම් සිදුකල යුතුවේ.

- වී වගාව සඳහා බිජ මාස 3-3 ½ සහ වැඩි දියුණු කල බිජ ලබා ගැනිම උනන්දු කරවීම සහ සුහරු කෘෂි ක්‍රියාකාරකම් කිරිම ප්‍රචලිත කලයුතු වේ.
- ගෙවතු සඳහා වැඩි හරිත අවරණයක් සහිත, වැඩි ආර්ථික ප්‍රතිලාභ අත්කර ගත හැකි පළතුරු බෝග සහ පොල් වැනි අත්‍යාවශ්‍ය බෝග පැල ලබාදිම මගින් කෘෂි වනාන්තර (Agro forestry) සංකල්පය ක්‍රියාවට යෙදවිය යුතුය.
- පස සෝදා යාම වලක්වා ගැනිමට පාශු සංරක්ෂණ වැටි යෙදීම, අගල් කානු කැපිම, පසට වසුන් යෙදිම සහ අවම බිම් සැකැස්ම වැනි ක්‍රම ප්‍රචලිත කිරිම එල්ලංගාවේ තිරසාර පැවැත්මට බෙහෙවින් ඉවහල් වේ.
- මෙම කියාකාරකම් ප්‍රවර්ධනය සහ තාක්ෂණික දැනුම ලබා දිම සඳහා පුහුනු වැඩසටහන් පැවැත්විය යුතු වේ.

### 3.2.8 එල්ලංගාවේ වාරිමාර්ග කලමනාකරණය (Irrigation Management) පිලිබඳ තොරතුරු

එල්ලංගා පද්ධතිය තුල පිහිටි සක්‍රීය සුලු වාරි වැව් 5 යටතේ වර්ෂාව ආරම්භයත් සමග මහ කන්නයේ වගාවන් ආරම්භ කරන අතර පරංගියවාඩිය මධ්‍ය වාරි ජලාශයේ වගාවන් තරමක ප්‍රමාදයක් දක්නට ඇත. මෙම ඒල්ලංගාවේ බොහොමයක් ගොවීන්ට අඩු වැඩි මට්ටමින් සෑම වැවක් යටතේම කුඹුරු ඉඩම් ඇති නිසා පරංගියවාඩිය වැවේ ජල සුරක්ෂිතතාවය ශාපේක්ෂව වැඩි නිසා අවධානම වැඩි වැව් යටතේ වගාවන් මුලින්ම ආරම්භ කිරීමට පෙළඹී ඇත. මාස් කන්නයේදී සියලුම වැව් යටතේ වී වගාවන් සිදුකල හැකි මට්ටමේ ජල ප්‍රභවයන් මෙම ඒල්ලංගාවේ ඇත. නමුත් යල කන්නය පරංගියවාඩිය වැව යටතේ වගාවන් සිදු වුවත් අනෙකුත් වැව් වල වගාවන් අවිනිශ්චිතය. විශේෂයෙන් මෙම සියලුම වැව් ආනඋලුන්දාව විශාල වනාංතරයට මායිම් වී තිබීම නිසා නිතරම වන අලි තර්ජනයට මුන දෙන නිසා සියලුම ගොවීන්ට වගා කිරීමට තරම් ජල ප්‍රමාණයක් ඇත්නම් පමනක් වගාවන් සිදුකරන අතර වී වගාවන් හෝ වෙනත් අතිරේක බෝග වගාවන්ට ගොවීන් නොපෙළඹීමට හේතුව වන්නේ හුදකලාව වගාවන් වන අලින්ගෙන් ආරක්ෂා කිරීමේ දුෂ්කරතාවය නිසාවෙන්ය. මෙම ඒල්ලංගාවේ ප්‍රසස්ථ මට්ටමින් ජල ප්‍රභවයන් පැවතීම නිසා ජල කළමනාකරණය යහපත් මට්ටමින් සිදු වන්නේ නම් අවම වශයෙන් කලුවාවල වැව යටතේ හෝ යල කන්නය වගා කිරීමට හැකිය. පරංගියවාඩිය වැව යටතේ සිදුවන ජල හානිය අමුණු කීපයක් මගින් කළමනාකරණය කර කලුවාවල හා බ්‍රහ්මණයාගම ගොවීන් යල කන්නයේ කොටසක වී හෝ අතිරේක බෝග වගාවන් යල කන්නයේදී වගාකොර්.

### 3.2.9 පෝෂක ප්‍රදේශයේ (Command Area) වර්තමාන තත්වය පිලිබඳ තොරතුරු

එල්ලංගාවේ මායිම් ජනාවාසයකට හා අධිරක්ෂිත වනාංතරයකට මායිම්ව තිබීම නිසා සහා කුඹුරු ඉඩම් වැව් දෙකක් අතරමැද පැවතීම නිසා වැව් ප්‍රතිසංස්කරණයෙන් පසුව කුඹුරු ඉඩම් වල ප්‍රමාණාත්මක වැඩිවීමක් සිදු කිරීමට නොහැකිය. ඉහළින් ඇති වැවෙහි වැව් බැම්ම අසලින් ආරම්භ වන කුඹුරු ඉඩම් එම වැවට පහළින් ඇති වැවෙහි වාන් මට්ටම් උසට ජලය පිරෙන ප්‍රෙද්ශය දක්වාම, සමහර විට වැව් රක්ෂිතයද ආක්‍රමණය කර ඇත. මීන් (වැව උඩහවැව කුඹුරු අවසන් වන්නේ පරංගියවාඩිය වැව් රක්ෂිතයද ආක්‍රමණය කරමින්ය)

කෙසේ වෙතත් වැව හා ඇලවේලි පද්ධතිය ප්‍රතිසංස්කරණය කලාට පසුව ජල කළමනාකරණය පිළිබඳව ගොවීන් දැනුවත් කර ඔවුන් ඒ සඳහා හුරු පුරුදු කර ගැනීමෙන් සහා බෝග විවිධාංගිකරණය සඳහා ඔවුන් පොළඹවා ගතහැකි නම් යල කන්නයේද වගා කිරීමට හැකිවනු ඇත. ඒ අනුව පෝෂක ප්‍රදේශය ප්‍රමාණාත්මකව වර්ධණය නොවුනත් ඇලවේලි පද්ධතියේ වැඩි දියුණු කිරීම හා ගොවින්ගේ දැනුම හා ආකල්පමය වෙනස් කිරීම මගින් ජල කළමනාකඑරණය සඳහා ඔවුන් දායක කරගෙන වගා තීව්රතාවය වැඩිකිරීම මගින් ජාතික ආදායමට අතිරේක නිෂ්පාදනයක් ඒක්කාසු කල හැකිය.

### 3.2.10 එල්ලංගාව තුල ක්‍රියාත්මක වන කෘෂිකර්මය හා බැඳුණු සංවිධාන

දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය යටතේ ප්‍රතිලාභීන් සංවිධාන ගත කොට ව්‍යාපෘති කටයුතු වලට දායක කර ගැනීමේ හා රාජ්‍ය ආයතන ක්‍රියාකාරී ලෙස ව්‍යාපෘති කටයුතු වලට දායක කරගැනීම සඳහා සංවිධාන ව්‍යුහයන් කීපයක් ගොඩ නගා ඇති අතර ඒ පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

### 3.2.10.1 නිෂ්පාදන සමිති

දේශගුණික සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ප්‍රදේශ වල ගොඩ ඉඩම් හා කුඹුරු ඉඩම් මූලික කරගත් කෘෂිකාර්මික කටයුතු සිදුකරන ගොවීන් සංවිධානගත කර, ඔවුන්ගේ ක්‍රියාකාරී දායකත්වය ව්‍යාපෘති කටයුතු වලට ලබාගැනීම සඳහා නිෂ්පාදන සමිති ගොඩනගන ලදී. ගොවීන් 50-60 කණ්ඩායමක් හා යම් නිශ්චිත භූගෝලීය වශයෙන් මායිම් වූ භූමියක් සඳහා ව්‍යාපෘතියේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සහාය ලබාගැනීම සඳහා මෙම සංවිධාන ව්‍යුහය ගොඩනගන ලදී. ඒ අනුව මෙම එල්ලංගාවේ පහත නිෂ්පාදන සමිති ක්‍රියාත්මක වන අතර නාම්බාකඩ හා නබඩවැව ගම්මාන මූලික කරගෙන ස්ථාපිත නිෂ්පාදන සමිති වඩාත් ක්‍රියාකාරී නිෂ්පාදන සමිති වේ.

***වගුව 03 : එල්ලංගාවේ ක්‍රියාත්මක නිෂ්පාදන සමිති පිළිබඳ මූලික තොරතුරු***

| අං | නිෂ්පාදන සමිතියේ නම | ගම්මානය | පුරුෂ සාමාජික | ස්ත්‍රී සාමාජික | මුලු සාමාජික |
|---|---|---|---|---|---|
| | නිල් මානෙල් නිෂ්පාදන ගොවි සංවිධානය | පරංගියවාඩිය | 25 | 35 | 60 |
| | උපුල් නිෂ්පාදන ගොවි සංවිධානය | කලුවාවල | 38 | 42 | 80 |

***මූලාශ්‍රය : දේශගුණික සුහුරු ව්‍යාපෘතියේ නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලය-උතුරුමැද පළාත***

මෙම නිෂ්පාදන සමිති මගින් දේශගුණ සුහුරු ක්‍රියාකාරකම් ව්‍යාප්ත කිරීම සඳහා සුදුසු ගොවීන් හඳුනාගැනීම, ව්‍යාපෘති කටයුතු පිළිබඳ තොරතුරු ව්‍යාපෘතියට ලබාදීම, 25% ගොවි දායකත්වය එකතු කර ව්‍යාපෘතියට ලබාදීම. උපකරණ ගොවීන් වෙත බෙදාදීම, ගොවීන් හා ව්‍යාපෘතිය අතර සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම කරනු ලබයි. එසේම ඉහත සමිති ශක්තිමත් කිරීම සඳහා ගිණුම් කරණ පුහුණුව, නායකත්ව ගති ලක්ෂණ වැඩිදියුණු කිරීම හා කණ්ඩායම් වැඩ, ව්‍යාවසායකත්ව සංවර්ධන පුහුණුව ලබා දී ඇත.

### 3.2.10.2 නිෂ්පාදන සංගම්

දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය මගින් ගොඩනගන ලද නිෂ්පාදන සමිති ඒකරාශී කර ගොවිජන සේවා මධ්‍යස්ථාන මට්ටමින් අලෙවිකරණය හා වෙළඳපොල සම්බන්ධීකරණය සඳහා නිෂ්පාදන සංගම් පිහිටුවන ලදී. ඒ අනුව පරංගියවාඩිය හා හොරොව්පොතාන ගොවිජන සේවා බල ප්‍රෙද්ශය පදනම් කරගෙන ගොඩනගන ලද පරංගියවාඩිය නිෂ්පාදන සංගමය එල්ලංගා පද්ධති 5ක් ආවරණය වන ලෙස පිහිටුවා ඇත. පරංගියාවාඩිය නිෂ්පාදන සංගමය වෙළඳපල සම්බන්ධතා ගොඩනැගීම, කෘෂි යෙදවුම් සම්බන්ධීකරණය සඳහා විවිධ වැඩසටහන් සිදුකර ඇත.

### 3.2.10.3 ගොවි සංවිධාන

ව්‍යාපෘතියේ වාරිමාර්ග පුනරුත්ථාපනයේදී සහ මෙහෙයුම් නඩත්තු කටයුතුවලදී ගොවි සංවිධාන විසින් සුවිශේෂී කාර්යභාරයක් ඉටුකරනු ලබයි. ගොවි සංවිධාන ශක්තිමත් කිරීම සඳහා ගිණුම් පවත්වාගෙනයාම, නායකත්ව ගුණාංග වර්ධනය හා ජල කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩ සටහන් පැවැත්වීමට නියමිතය. මෙම එල්ලංගාවේ තිබෙන සක්‍රීය වැව් 06 සහ අමුණු කීපයෙන් වගාකටයුතු කරන ගොවීන්, ගොවි සංවිධාන 2 ක් වටා ඒකරාශී වී ඇත. පහත වගුවේ ඒම ගොවි සංවිධාන පිළිබඳ විස්තර දැක්වේ.

වගුව 4 : එල්ලංගාවේ ගොවි සංවිධාන වල මූලික තොරතුරු

| අංකය | වැව | ග්‍රා.නි. කොට්ඨාශය | ගොවි සංවිධානයේ නම | සාමාජිකත්වය | | | ලි.ප.අංකය |
|---|---|---|---|---|---|---|---|
| | | | | පිරිමි | ගැහැණු | එකතුව | |
| **1** | කුඩාවැව | **පරංගියවාඩිය** | පරංගියවාඩිය ගො.සං. . | 4 | 2 | 6 | DAD/19/612/ 29 |
| **2** | නිකවැව | | | 9 | 3 | 12 | |
| **3** | වැව උඩහවැව | | | 10 | 2 | 12 | |
| **4** | පරංගියවාඩිය | | | 180 | 58 | 238 | |
| **5** | කලුවාවල වැව | | **පැරකුම් ගො.ස.** | 71 | 7 | 78 | DAD/19/612/ 13 |
| **6** | බ්‍රහ්මණයාගම වැව | | | 11 | 7 | 18 | |

***මූලාශ්‍රය : පරංගියාවාඩිය ගොවිජන සේවා මධ්‍යස්ථානය***

### 3.2.10.4. සමාජ විගණන කමිටු

ලෝක බැංකු සංකල්පයක් අනුව ව්‍යාපෘති ක්‍රියාකාරකම් එහි ප්‍රතිලාභීන් විසින් සුපරීක්ෂණය කිරීම සඳහා සමාජ විගණන කමිටු හඳුන්වාදෙන ලදී. 2021 හා 2023 වර්ෂ වල ඉදිකල කොන්ක්‍රීට් කමත හා කලුවාවල වැව සඳහා ඒක් කමිටුවකුත් කුඩාවැව, නිකවැව හා වැව උඩහවැව යන වැව් වල පුනරුත්ථාපන කටයුතු සිදුවන අවස්ථාවේදී කමිටු 3 කුත් 2025 ජනවාරි මසදී බ්‍රහ්මණයාගම වැව පුනරුත්ථාපණය වෙනුවෙන් අභිනවයෙන් ස්ථාපිත කමිටුවත් වශයෙන් සමාජ විගණන කමිටු 5 ක් ස්ථාපිත කර ඇත. මෙම සමාජ විගනන කමිටු සාමාජිකයින්ට පුහුණුව ලබාදී ඔවුන් වෙත පැවරෙන වගකීම ඉටුකිරීමට ඔවුන් සවිබල ගැන්වීම ව්‍යාපෘතිය මගින් සිදු කරන ලදී.


# 4. එල්ලංගා පද්ධතිය දැනට මුහුණ දෙන ගැටළු


## 4.1 එල්ලංගාවේ වනාන්තර විනාශය


2010 දී පැවති වනාංතර වපසරිය හා 2024 ගූගල් චන්ද්‍රිකා සිතියම් අධ්‍යනයේදී මෙම එල්ලංගා ප්‍රෙද්ශයේදී සිදුව ඇති වන විනාශය අනෙකුත් ඒල්ලංගාවන් සමග සැසඳීමේදී අවම මට්ටමක පවතී. මෙම ඒල්ලංගාවේ හෙක්ටයාර 1560 ක් පමණ වූ වනාංතර ප්‍රමාණය හෙක්ටයාර 45 ක් පමණ විනාශ කර ඇත. ඒය 3% ආසන්න ප්‍රතිශතයකි. මෙම ඒල්ලංගාවේ නැගෙනහිර මායිම ආනඋලුන්දාව අධිරක්ෂිත වනාන්තරය වීම නිසා වනාංතර ඒලිපෙහෙලිකර ගොවිබිම් බවට පත්කර ගැනීම සීමා වී ඇත. අධිරක්ෂිතයකට මායිම් නීම නිසා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිරන්තර සොයාබැලීම වනය ආරක්ෂා වීමට ප්‍රධාන කාරණය වී ඇති අතර හබරණ, කන්තලේ හා මොරවැව යනාදි විශාල ප්‍රදේශයක විහිදුනු වනාංතරය වීම නිසා වන අලින්ගේ නිජභූමියක් වී ඇත. මෙම වන අලි තර්ජනයද වන විනාශය සීමා වීමට බලපා ඇති බව විශ්වාස කරති.

නමුත් ඉඩම් හිගය නිසාවෙන් අනාගතයේදී මෙම තත්වය වෙනස්වීමට ඇති ඉඩකඩ බොහෝය. නමුත් කලුවාවල වැව ඉස්මත්ත ඇතුලුව සුලුවට හෝ වනය විනාශ කිරීම දකින්නට ඇති තත්වය හමුවේ වන විනාශය අවසන්ව නැති බවට සාධක සපයයි. එල්ලංගා කළමනාකණ කමිටුවක අවශ්‍යතාවය මතුවනුයේ පරිසර පද්ධතියේ විනාශයන් පාලනය කිරීම, එම පද්ධතිය නැවත ප්‍රතිශ්ඨාපනය කිරීම හා එල්ලංගාවේ තිරසාර පැවැත්ම සහතික කිරීම සඳහා රාජ්‍ය ආයතන හා ප්‍රජාවගේ ඒකාබද්ධ ප්‍රවේශයක් ලබාගැනීමට සංවිධාන ව්‍යුහයක අවශ්‍යතාවය හේතුවෙන්ය.

සිතියම 10 : : එල්ලංගාවේ වනාන්තර විනාශ කිරීම්



### 4.5 වන සම්පත් භාවිතය නිසා පාරිසරික ගැටළු වල ප්‍රබලත්වය හා ජන ජීවිතයේ පැවැත්මට එහි ඇති බලපෑම

වන අලින්ගේ නිජභූමි හා ඔවුන් නිතර සැරිසැරූ වැව් තාවුලු සහා සතුන් එහාමෙහා සංක්‍රමණය වූ කොරිඩෝවන් වගා බිම් හෝ මිනිස් වාසස්තාන ලෙස පරිවර්තනය වීම නිසා වසරකට දළ වශයෙන් මිනිස් ජීවිත 3ක් අලි 4-5 පමණ අහිමි වීම දකින්නට ඇත. එමෙන්ම වගාවන් සතුන්ගෙන් ආරක්ෂා කර ගැනීමට විශාල මිනිස් ශ්‍රමයක් හා බල ශක්ති ප්‍රමාණයක් නාස්ති වීම යනාදි ගැටලුද නිර්මාණය වී ඇත. වන විනාශය සමග මොනරු ගහනය විශාල ලෙස වැඩවීම කෘෂිකර්මාන්තයට විශාල සෘණාත්මක බලපෑමක් සිදුකර ඇත. ප්‍රදේශවාසීන්ගේ විශ්වාසය අනුව වන විනාශය හේතුවෙන් නරින්ගේ වාසභූමි අහිමිවීමෙන් මොනර බිත්තර විනාශවීමේ ස්වභාවික සමතුලිතභාවය බිඳ දමා තිබීම හා විශාල ලෙස වැඩුණු ආක්‍රමණශීලී තෘණ විශේෂයක් වන මානා කැලෑව මොනරු බිත්තර ආරක්ෂාව සඳහා පරිසරය සකස් වීම මොනරු ගහනය වැඩි වීමට හේතු වී ඇති බවයි.

### 4.6 සමාජ ආර්ථික ගැටළු Socio-economic issues.

වසර 30 ක ජනවාර්ගික යුද්ධයේ ගොදුරක් වූ මේ ප්‍රදේශයේ ජනතාව වසර 20 ට අධික කාලයක් ප්‍රදේශය අතහැර ගොස් සිට ඇත. එහි අතුරු ඵලයක් ලෙස සමහර ඉඩම් වන සංරක්ෂණ ඉඩම් ලෙස ගැසට් කර ඇත. මේ සම්බන්ධයෙන් පරිපාලනමය ගැටලු පැන නැගී ඇත.

එමෙන්ම යුද්ධයේ අතුරුඵල ලෙස පවුල් වලින් 15% ක් පමන ගෘහ මූලිකයා ආබාධිත හෝ වැන්දඹු කාන්තා මූලික පවුල් දක්නට ඇත. එමෙන්ම විශ්‍රාමික හමුදා සෙබලුන් විශාල ප්‍රමාණයක් කෘෂිකාර්මික කටයුතුවල නියැලී තිබීම සාධනීය ලක්ෂණයකි. බොහෝමයක් එවැනි ගොවීන් ඵලදායි ලෙස කෘෂිකාර්මික කටයුතුවල නියැලී ඇත.

කෘෂි නිෂ්පාදන සෘජු වෙළඳපොලවල් සමග සම්බන්ධ නොවීම ගැටලුවක්ව පවතී. මාර්ග පද්ධතියේ පවතින දුෂ්කරතාවයන් හා වෙළෙඳ පොලවල් සම්බන්ධීකරණය සඳහා සංවිධාන ව්‍යුහයක් ගොඩනැගී නොමැති වීම ගැටලුවක්ව පවතී.

මෙම වනාන්තර කොටස ආනලොන්දාව රක්ෂිතය දක්වා දිවෙයි. නමුත් මෙම රක්ෂිතයන් පවා තැනින් තැන එලිපෙහෙලි කිරීම නිසා වන සතුන්ගේ සම්ප්‍රදායික මාර්ගයන් අහුරා ඇත. මෙම තත්වය නිරන්තර අලි මිනිස් ගැටුමක් දක්වාම මෙම එල්ලංගාව ඇතුලුව මුලු ප්‍රදේශයම මුහුණ දී ඇත. එමෙන්ම මී පැණි කර්මාන්තයද බොහෝ දෙනෙකුගේ ජීවන උපායමාර්ගය වී ඇත. ගඩොල් කර්මාන්තයත් අනවසර වැලි ගොඩදැමීමත් තවත් ජීවන උපාය මාර්ගයකි. එහෙත් මේ හරහා වන විනාශයත් වැව් පිටි අක්‍රමවත්ව පස් කැපීමට ගොදුරු වීම එල්ලංගා පද්ධතියේ පැවැත්මට හානිදායක වී ඇත.

## 4.7 හරස්කඩ සංචාරයේදී හඳුනාගත් උග්‍ර ගැටලු

### 4.7.1. පාරිසරික පද්ධතියේ සිදුව ඇති හානිය

පරංගියවාඩිය එල්ලංගාවේ වැව් ආශ්‍රිතව පරිසර පද්ධතීය අනෙකුත් ඒල්ලංගාවන්ට ශාපේක්ෂව විනාශ වී නොමැත. මෙම ඒල්ලංගාවේ සියලුම වැව් රක්ෂිත වනාංතරයකට මායිම්ව පිහිටීම නිසා වැවට ඉහලින් ඇති පාරිසරික පද්ධතිය ආරක්ෂිතව පවතී. ඒහෙත් වැවඋඩහවැව, නිකවැව හා කුඩාවැවේ කට්ටකඩුව, කිවුල්ඇල යනාදි පරිසර පද්ධතීන් ප්‍රසස්ත මට්ටමින් නොපවතී. මේ නිසා වැව ආශ්‍රිත පරිසර පද්ධතිය ප්‍රකෘති තත්වයට ගෙන ඒමට අවධානය යොමුකල යුතුය.

### 4.7.2. වැව් රක්ෂිත අනවසරයෙන් අත්පත් කරගෙන තිබීම

**වැව් රක්ෂිත අනවසරයෙන් අත්පත් කරගෙන තිබීම කලුවාවල වැව ඉස්මත්තේදී නිරීක්ෂණය වන අතර** වැවඋඩහවැව හා නිකවැව වී වගාබිම් පරංගියවාඩිය මධ්‍ය වාරි ජලාශයේ වැව් රක්ෂිතය දක්වාම ව්‍යාප්ත වීම සිදුව ඇත. පරංගියවාඩිය වැව ඉස්මත්තේ ගස් ගොම්මන තැනින් තැන හානි වී ඇතත් තවමත් සැලකිය යුතු ප්‍රසස්ත මට්ටමක් පැවතීම අගය කල යුතුය. නමුත් අනාගතයේදි ඇතිවන ඉඩම් හිඟය සමඟ පරිසර පද්ධතියේ පැවැත්මට තර්ජනයන් ඒල්ල විය හැකි බැවින් ඒය ආරක්ෂා කිරීමට අවශ්‍ය අවධානය පවත්වා ගෙන යාම ඒල්ලංගා කළමනාකරණ කමිටුව විසින් කළ යුතුය.

#### 4.7.3. පාංශු ඛාදනය

වන රක්ෂිතවලට මායිම් වීම නිසා මෙම ඒල්ලංගාවේ පාංශු ඛාදනය පාලනය වී ඇතත් වැවඋඩහවැව හා නිකවැව ගොවීන්ගේ අවධානය මේ පිළිබඳව යොමු කිරීම ඒල්ලංගාවේ තිරසාර පැවැත්මට සාධනීය වනු ඇත.

#### 4.7.4. වන අලි උවදුර

මෙම එල්ලංගාව අනුඋලන්දාව අධි ආරක්ෂිත වන රක්ෂිතයට මායිම්ව පැවතිම නිසා වන අලි උවදුරෙන් මුළු එල්ලංගාවෙම ගොවීන් බරපතල තර්ජනයකට මුහුණ දී ඇත.2024 වර්ෂයේ මේ වන විටත් ජීවිත 02ක් වන අලි පහරදිමෙන් අහිමි වී ඇති අතර වගා විනාශයන් නිරතුරුවම සිදුවේ. බොහෝ කාලවලදී දිනයේ පස්වරු 3 පමණ වනවිට වන අලින් ගම්වලට හා ගොවිබිම් වලට කඩාවැදීම නිරන්තරයෙන්ම සිදු වේ. වී අස්වනු නෙළිමෙන් පසුව ගොවීන් හැකි ඉක්මනින් අස්වැන්න අලෙවි කිරිමට පෙළඹී ඇත්තේ වී ගබඩා කර තබා ගැනිම වන අලි නිවස වෙත කැඳවාගැනිමට උත්තේජනයක් විම නිසාවෙනි.

#### 4.7.5. පශ්චාත් අස්වනු සකස් කිරිම පිලිබඳව පවතින ගැටළු

මෙම එල්ලංගාවේ පවතින සීමිත උස්බිම් මහ කන්නයේදි බඩ ඉරිඟු වගාව සිදු කරන අතර මෙම අස්වනු ප්‍රමිතියෙන් යුක්තව සකස් නොවනු ඇත. විශේෂයෙන්ම බඩඉරිඟු අස්වනු 100% වගේම අලෙවි වන්නේ සත්ව ආහාර සඳහාය. ඊට හේතුව වී ඇත්තේ ඇප්ලටොක්ෂින් බැක්ටීරියාව පවතින ප්‍රතිශතය ඉහළ අගයක් තිබිම නිසා මිනිස් ආහාර සඳහා ප්‍රතික්ෂේප විමයි. මේ සඳහා මූලිකම කරුණ වී ඇත්තේ බඩඉරිඟු කරල පැසුණු පසු ඒය ගසේ පොලොව දෙසට හරවා වියළිමට තබාගත යුතු කාලය එලෙස තබා නොගැනිමයි. ප්‍රදේශයේ පවතින වන අලි තර්ජන නිසාවෙන් ගොවීන්ට මෙම ක්‍රමවේදයන් අනුගමනය කිරිම දුෂ්කර වන අතර එය අවධානමකි. සියළුම ගොවීන් උත්සහ කරන්නේ හැකි ඉක්මනින් අස්වනු ගොවිපලින් ඉවත් කර ගැනිමටයි. මුළු වගා කාලයම වන අලින්ගෙන් ආරක්ෂා කර ගැනිමේ බරපතල තර්ජනයකට මුහුණදෙන ගොවීන්ට පසු අස්වනු තාක්ෂණයන් අනුගමනය කිරිම යථාර්තවාදී වී නොමැත.

#### 4.7.6. ජල කලමනාකරණය සිදුනොවිම

වසර 30කට අධික ජනවාර්ගික අර්බුධය හේතුවෙන් සිවිල් යුද්ධයක් මායිම් ගම්මානව පැවතිම නිසා මෙම එල්ලංගාවේ පමණක් නොව මෙම ප්‍රදේශයේම ජල කලමනාකරණ විධික්‍රම අනුගමනය කිරිම සිදු නොවේ. පරංගියවාඩිය මධ්‍යවාරි ජලාශයේ ජල කළමනාකරණය සඳහා ප්‍රවේශයන් ගෙන ඇතත් වාරි පද්ධතිය හානි වී ඇති නිසාවෙන් ඒහි සාර්ථකත්වය අවමය. පුනරුත්ථාපනය කරන ලද වැව් කීපයේ වුවද සවස් වන විට වන අලි සමග කරන ලද අරගලය හා ඒම සතුන් නිසාවෙන් ඇලවේලි නිතර විනාශ වීම නිසා ජල කලමනාකරණ ප්‍රවේශයකට ගොවීන් හුරු කිරීම අසාර්ථක වී ඇත. නිකවැව හා වැව උඩහවැවට සවස 3 – 4 පසුව වන අලි තර්ජනය නිසාවෙන් ප්‍රවේශවීම පවා ඇඩි අවධානමක් වන නිසා යල කන්නය වගාකිරීමේ අපේක්ශාවන් ගොවීන්ට නැති තරමය. පරංගියවාඩිය මධ්‍ය වාරි ජලාශය හැරුනු විට අනෙකුත් වැව් වන ජල කළමනාකරණය හුරු කිරීම අභියෝගයකි.

#### 4.7.7. ඇළ වේලි නඩත්තුව සිදුනොවිම

වැව හා වාරි පද්ධතිය නඩත්තුව නිසියාකාරව සිදු නොවීම ගැටළුවක්ව පවතී. පරංගියවාඩිය මධ්‍ය වාරි ජලාශයේ ඇලවේලි යම් මට්ටමකින් නඩත්තු වුවත් දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය මගින් පුනරුත්ථාපණය කරන ලද නිකවැව හා කලුවාවල වැව් වල ඇලවේලි වල ප්‍රමිතිය පිළිබඳව විවේචනයන් ඇත. කලුවාවල වැවේ ඇලවේලි පද්ධතිය පමණක් ව්‍යාපෘතිය මගින් පුනරුත්ථාපනය කල අතර ඒහි පවතින අඩුපාඩු හේතුවෙන් ඇලවේලි කඩත්තුව දුෂ්කර වී ඇත.

### 4.7.8. ගොවි සංවිධානවල ක්‍රියාකාරිත්වය දූර්වල තත්ත්වයේ පැවතිම.

මෙම ඒල්ලංගාවේ ගොවි සංවිධාන දෙක යම් මට්ටමකින් ක්‍රියාත්මක වුනත් ඔවුනට පැවරි ඇති කාර්යභාර්ය නිසියාකාරව හදුනාගෙන නොමැත. ගොවිජන සේවා දෙපාර්තමේන්තුව මඟින් සිදුකරන මැදිහත්වීම හැරුණුවිට ජල කලමනාකරණය මෙන්ම අරමුදල් ගොඩනගාගෙන වාරි පද්ධතිය නඩත්තු කර පවත්වාගෙන යාමටත් සාමාජිකයන්ගේ සුබසිද්ධිය සඳහා නායකත්වය ලබාදිමට හැකි පරිදි ගොවි සංවිධාන ශක්තිමත් වී නොමැත.

### 4.7.9. වන සත්ව හානිය

වන අලි ගැටළුව ඉහතින් විස්තර කරන ලද අතර ඊට අමතරව මොනරුන්ගෙන් සිදුවන හානිය හා රිලවුන්ගෙන් වගා කටයුතු සඳහා වන හානිය උග්‍ර ගැටළුවක්ව පවතී.

| අංක | උග්‍ර ගැටලුව | විෂය පථය |
|---|---|---|
| 1 | නිකවැව දකුණු සෙරොව් ඇලවේලි (ව්‍යාපෘතිය මගින් පුනරුත්ථාපනය කරන ලද) වලින් ජලය උතුරා යෑම නිසා ජල නාස්තිය සිදුවීම. | වැව පුනරුත්ථපනය හා ජල කළමනාකරණය |
| 2 | වැව උඩහවැව වාන තාවකාලිකව ලී දඬුවලින් සකස් කල ඒකක් වීම නිසා ජලය රඳවා ගැනීම දුෂ්කර වීම | ජල කළමනාකරණය |
| 3 | කලුවාවල වම් සොරෙව්වේ මුල සිට මීටර 80 පමණ දුරකට ඇල වගුරු බිමක් හරහා දිවෙන නිසා ජලය කුඹුරු දක්වා ගෙන යාම දුස්කර වී තිබීම | ජල කළමනාකරණය |
| 4 | පරංගියවාඩිය හා කලුවාවල ජලබස්නා ඇලවල් හරස් කර සකස් කර ඇති අමුණු විනාශව පැවතීම හෝ ඒවා තාවකාලිකව සකස් කර තිබීම නිසා නඩත්තුව අපහසු වීම. | ජල කළමනාකරණය |
| 5 | පරංගියවාඩිය වාන් වතුර කලුවාවල වැවේ වාන හරහා ගලායාම නිසා පහල වී වගාබිම් නිතර විනාශයට පත්වීම. | වගා හානි |
| 6 | කලුවාවල වැව ඇලවේලි පුනරුත්ථාපනය නිසි ප්‍රමිතියෙන් සිදුනොවීම නිසා කෙටිකලකින් පද්ධතිය විනාශ වී තිබීම | ජල කළමනාකරණය |
| 7 | නිකවැව දක්වා දිවෙන මාර්ග පද්ධතිය දැඩි අබලන් තත්වයේ පැවතීම | ප්‍රවේශ මාර්ග |
| 8 | වැව උඩහවැව වැව් බැම්මේ දකුණුපස කොටසේ බැම්ම දුරුවලව පැවතීම | වැව පුනරුත්ථපනය |
| 9 | නිකවැව දක්වා දිවෙන මාර්ගය අද්දර කසල බැහැර කරන ස්ථාන පැවතීම හා ඒවා පරංගියවාඩිය වැවට ඉහලින් උස්බිම් වීම නිසා පාරිසරික ගැටලු ඇතිවීම. | පාරිසරික |
| 10 | පුරාවිද්‍යාත්මක වටිනාකම් සහිත විහාර හා දාගැබ් නටඹුන් සහා ගල්ලෙන් හා සොහොන් නිධන් සොරුන් විසින් විනාශ කර තිබීම | පුරාවිද්‍යාත්මක |
| 11 | සත්ව දඩයම යහමින් සිදුවීම | පාරිසරික |
| 12 | වන අලි තර්ජනය | සමාජ ආරක්ෂණය |

## 5. එල්ලංගා පද්ධතිය තුළ දැනටමත් CSIA ව්‍යාපෘතිය මගින් සිදුවන ඉදිකිරීම් කටයුතු සහා ක්‍රියාකාරකම්

දේශගුණික සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය මගින් නබඩවැව එල්ලංගාවේ ගොවීන් සංවිධානය කොට එම සංවිධාන ශක්තිමත් කර, ප්‍රතිලාභීන්ගේ හා අදාල රාජ්‍ය නිළධාරීන්ගේ ක්‍රියාකාරී දායකත්වය ඇතිව දේශගුණික සුහුරු කෘෂිකාර්මික වත් පිළිවෙත් ප්‍රචලිත කර කෘෂිකාර්මික ඵලදායීතාවය ඉහළ නැංවීම හා දේශගුණික වෙනස්වීම්වලට මුහුණදීමේ ශක්තිය ගොවීන් තුළ ඇති කිරීම සඳහා සිදුකර ඇති ව්‍යාපෘති මැදිහත්වීම් පිළිබඳව විස්තර පහත දැක්වේ.

### 5.1 ඉදිකිරීම් කටයුතු

මෙම එල්ලංගාවේ CSIA ව්‍යාපෘතිය මගින් 2021/2022 වර්ශයේදී කලුවාවල වැවේ වාරි පද්ධතිය හා කෘෂි මාර්ගයක් සහා වැව උඩහවැව පුනරුත්ථාපනය කරන ලද අතර 2023/2024 වර්ශයන්හීදී නිකවැව හා කුඩාවැව පුනරුත්ථාපනය කරන ලදී. නමුත් 2021/2022 වර්ශයන්වල ආර්ථිකයේ ඇතිවුන අවපාතයන් හේතුවෙන් කලුවාවල වැවේ වාරි පද්ධතිය හා කෘෂි මාර්ගයේ පුනරුත්ථාපන කටයුතු අපේක්ෂිත මට්ටමින් සිදුනොවුනු අතර ඒ පිළිබඳව ගොවීන්ගේ මැසිවිලි නිතර ඉදිරිපත් වේ. මීට අමතරව කලුවාවල වැවට පහලින් වර්ග මීටර 1200 ප්‍රමාණයේ කොන්ක්‍රීට් කමතක්ද ව්‍යාපෘතිය මගින් ඉදිකර ඇත.

CSIA ව්‍යාපෘතිය ආරම්භවීමට වසර 3 ට පමණ පෙර කලුවාවල වැව ප්‍රතිසංස්කරණය කර තිබුනු අතර පරංගියවාඩිය මධ්‍ය වාරි ජලාශයේ වාරි පද්ධතිය පුනරුත්ථාපනය කල යුතු මට්ටමේ පැවතියත් CSIA ව්‍යාපෘතිය විසින් සුලු වාරිමාර්ග පුනරුත්ථාපණය පමණක් සිදුකරන නිසා ඒ පිළිබඳව අවධානයට ලක් නොකරන ලදී.

ඒ අනුව මෙම ඒල්ලංගාවේ බ්‍රහ්මණයාගම වැව පමණක් CSIA ව්‍යාපෘතිය යටතේ පුනරුත්ථාපණය සඳහා ඉතිරිව ඇති අතර ඒය 2025 වර්ශයේදී පුනරුත්ථාපණය සඳහා තෝරාගෙන ඇත.

| අං | වැවේ නම | කරන ලද අලුත්වැඩියා කටයුතු | ඇස්තමේන්තු වටිනාකම රු.මිලි. | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| 01 | කුඩා වැව | • වැව් බැම්ම ප්‍රතිසංස්කරණය කිරීම (383 m)<br>• වාන් ඇල සුද්ධ කිරීම (75m)<br>• වම් සොරොව්ව, දකුණු සොරොව්ව අලුතින් ඉදිකිරීම<br>• සොරොව් ඇලවල් පිළිසකර කිරීම. (870 m)<br>• නාන තොටුපලක් ඉදිකිරීම<br>• රොන් මඩ ඉවත් කිරීම (2000m$^3$) | | 100% |
| 02 | කලුවාවල වැව | • වැව් බැම්ම ප්‍රතිසංස්කරණය කිරීම (350 m)<br>• වාන් ඇල සුද්ධ කිරීම (100m)<br>• වම් සොරොව්ව, දකුණු සොරොව්ව අලුතින් ඉදිකිරීම<br>• සොරොව් ඇලවල් පිළිසකර කිරීම. (750 m)<br>• නාන තොටුපලක් ඉදිකිරීම<br>• කෘෂිපාර ඉදිකිරීම (670m)<br>• රොන් මඩ ඉවත් කිරීම. (6000m$^3$) | | 100% |
| 03 | වැව උඩහවැව | • වැව් බැම්ම ප්‍රතිසංස්කරණය කිරීම (350 m)<br>• වාන් නිර්මිතය කොන්ක්‍රීට් කිරීම (10 m)<br>• සොරොව්ව අලුතින් ඉදිකිරීම<br>• සොරොව් ඇලවල් පිළිසකර කිරීම. (450 m)<br>• කෘෂිපාර ඉදිකිරීම (800m) | | 100% |

| | | | | |
|---|---|---|---|---|
| 04 | නිකවැව | • වැව් බැම්ම ප්‍රතිසංස්කරණය කිරීම (800 m)<br>• වම් සොරොව්ව, දකුණු සොරොව්ව අලුතින් ඉදිකිරීම<br>• සොරොව් ඇලවල් පිළිසකර කිරීම. (1300 m)<br>• නාන තොටුපලක් ඉදිකිරීම<br>• කෘෂිපාර ඉදිකිරීම (970m)<br>• රොන් මඩ ඉවත් කිරීම. ($4000m^3$) | | 100% |
| 05 | කලුවාවල කෘෂි මාර්ගය | • | | 100% |
| | මුළු එකතුව | | **174.87** | |

# 6. පරංගියවාඩිය එල්ලංගා කළමනාකරණ සැලැස්ම

## 6.1 මූලික පරමාර්ථ

6.1.1 පරංගියවාඩිය එල්ලංගාවේ පවතින වැව් හා ඊට අදාල භූමියේ තිරසාර පැවැත්ම සහතික වන අයුරින් එක් පද්ධතියක් ලෙස සාමූහිකව කටයුතු කිරීම.

### 6.1.2 අරමුණු

i. දේශගුණ සුහුරු ආකල්ප හා භාවිතයන් වෙත ගොවීන් යොමු කිරීම.
ii. ජලාධාර ප්‍රදේශය, වැව හා පෝශක ප්‍රදේශය එක් පද්ධතියක් ලෙස ක්‍රියාත්මක කිරීම.
iii. එල්ලංගා පද්ධතිය තුළ සිදුවන පාරිසරික හානිය අවම කිරීම.
iv. එල්ලංගාව පැවති පාරිසරික පද්ධතිය නැවත ගොඩනැගීම.
v. වගා තීව්‍රතාවය (Crop Intensity) ඉහළ දැමීම.
vi. පාංශුඛාදනය අවම කිරීම හා රොන්මඩ තැන්පත් වීම වලකාලීම.
vii. ජල කළමනාකරණය විධිමත් කිරීම.
viii. එල්ලංගාව කළමනාකරණය සඳහා ශක්තිමත් සංවිධාන ව්‍යුහයක් ගොඩනැගීම හා එහි තිරසාර පැවැත්ම තහවුරු කිරීම.
ix. අලි මිනිස් ගැටුම අවම කිරීමට දායක වීම.

## 6.2 එල්ලංගා පද්ධති කළමණාකරණ සැලැස්ම

එල්ලංගා කළමනාකරණ කමිටුවේ මූලික අරමුණ වනුයේ එල්ලංගාව ආරක්ෂා කිරීම සඳහා තිරසාර ලෙස පවත්වාගෙන යාම සඳහා උපාය මාර්ගගත මැදිහත්වීම් හඳුනාගෙන ඒ සඳහා අවශ්‍ය වඩාත් උචිත ක්‍රියාමාර්ග ගැනීමය. මේ සඳහා එල්ලංගා කළමනාකරණ කමිටුවේ මූලික වගකීම වනුයේ සියලුම පාර්ශව එකතු කරගෙන එල්ලංගාවේ සියලුම සම්පත් මනාව කළමනාකරණය හා එල්ලංගාව ආරක්ෂා කිරීමය. මෙම කාර්ය ඉටු කිරීම පහසු කරවීම සඳහා එල්ලංගා පැතිකඩක් සහ කළමනාකරණ සැලැස්මක් සකස් කරනු ලබයි.

මේ සඳහා එල්ලංගා කළමනාකරණ කමිටුවේ සියලුම පාර්ශව එකතු වී එල්ලංගාවේ හරස්කඩ චාරිකාව සිදු කර ප්‍රාථමික දත්ත එකතු කරනු ලබන අතර එම දත්ත සහ ද්විතික මූලාශ්‍ර මගින් එල්ලංගාව පිළිබඳ එකතු කරගන්නා දත්ත පදනම් කරගෙන එල්ලංගා පැතිකඩ සහ එල්ලංගා කළමනාකරණ සැලැස්ම සකස් කරනු ලබයි.

පරංගියවාඩිය එල්ලංගාවේ හරස්කඩ චාරිකාව 2024 මාර්තු 27 දින පවත්වනු ලැබූ අතර එහිදී එල්ලංගාවේ පවතින සමාජ, ආර්ථික, භූගෝලීය, කෘෂිකාර්මික,ජල විද්‍යාත්මක,පාරිසරික ගැටළු ඒවායේ ප්‍රමාණයන් එම ගැටළු වල ස්ථානීය පිහිටීම, ඒවාට සොයන විසඳුම පිළිබඳ තොරතුරු එකතු කර ගන්නා ලදී.

මෙම හරස්කඩ චාරිකාව තුළින් හඳුනා ගත් ගැටළු හා යෝජනා සමාලෝචනය කර වඩාත් උග්‍ර ගැටළු හඳුනා ගන්නා ලද අතර, එම ගැටළු විසඳීම සඳහා දීර්ඝ කාලීන, මධ්‍ය කාලීන හා කෙටි කාලීන ක්‍රියාකාරකම් හා කාල වකවානු ඇතුලත් නබඩ වැව එල්ලංගා කළමනාකරණ සැලැස්ම සකස් කරන ලදී.

## ක්‍රියාකාරී සැලැස්ම - පරංගියවාඩිය එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටුව

| No | උග්‍ර ගැටලුව | වසදුම | විසඳුම ඉදිරිපත් කිරීමේ වගකිවයුතු සමාජිකයා | | දල ඇස්තමේ: රු.මි. | 2025 | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | ප්‍රධාන | සම්බන්ධිකරණය | | ජන | පෙබ | මාර් | අප්‍රේ | මැයි | ජුනි |
| 1 | වැව් ඉස්මත්තේ ගොඩ බෝග වගාව සඳහා අවිධිමත් බිම් සැකසීම නිසා පාංශු ඛාදනය ඉහලයාම තුලින් නිරන්තරයෙන් සිදුවන පස නිසරුවීම. | වැව ඉස්මත්තේ කන්න වගාවන් සිදු කරන සියලු ගොඩ ඉඩම් බහුවාර්ශික බෝග වගාවට පරිවර්තනය කිරීම | | | | | | | | | |
| 1.1 | | සමීක්ෂණයක් මගින් ඉඩම් හඳුනාගැනීම, ඔවුන් දැනුවත් කිරීම හා අවශ්‍යතා ලේඛන සකස් කිරීම | කෘ.උපදේ/ දේ.සු.කෘ.වි. හා ආ.සං.හැ.ව.වි - CSIAP | ආ.සං.හැ.ව.වි.- CSIAP | 0.05 | | | | | | |
| 1.2 | | පැල මිලදීගැනීම | ප්‍රසම්පාදන නිලධාරි | ආ.සං.හැ.ව.වි - CSIAP | 0.05 | | | | | | |
| 1.3 | | පාංශුඛාදන වැටි යෙදීම සඳහා ඇස්තමේන්තු සැකසීම හා වැටි යෙදීම | කෘ.උපදේ/ තාක්ෂණ නිලධාරි | දේ.සු.කෘ.වි. CSIAP | 0.05 | | | | | | |
| 1.4 | | අවශ්‍ය අවස්ථාවලදී වගාලිං සඳහා මූල්‍ය සහාය ලබාදීම | දේ.සු.කෘ.වි. හා ආ.සං.හැ.ව.වි - CSIAP | | 1.00 | | | | | | |
| 2 | වැව් රක්ෂිත අනිතිකව අත්පත් කරගෙන තිබීම | වැව් රක්ෂිත මායිම් ගල් යොදා සළකුණු කිරීම | | | | | | | | | |
| 2.1 | | නිතියානුකුල මැණුම් නියෝගයක් මගින් මායිම් තහවුරු කිරීම | ගො.ජ.ප්‍රා.නි. - පරංගියවාඩිය | ආ.සං.හැ.ව.වි - CSIAP | 0.50 | | | | | | |
| 2.2 | | මායිම් ගල් යොදා වැව් මායිම් සලකුණු කිරීම | අදාල ගො.සං හා කෘ.ප.නි.ස | ජ.ක.වි - CSIAP | 1.00 | | | | | | |

Page 1

| No | උග්‍ර ගැටලුව | වසඳුම | විසඳුම ඉදිරිපත් කිරීමේ වගකිවයුතු සමාජිකයා | | දල ඇස්තමේ: රු.මි. | 2025 | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | ප්‍රධාන | සම්බන්ධීකරණය | | ජන | පෙබ | මාර් | අප්‍රේ | මැයි | ජුනි |
| 3 | මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් වැව් ආශ්‍රිත පරිසර පද්ධතිය විනාශවීම නිසා වැව්වලට රොන්මඩ තැන්පත්වීම, ලවනතාවය ඉහල යාම, වාශ්පීකරණය ඉහල යාම හා ජලය අපිරිසිදු වීම | | | | | | | | | | |
| | 3.1 | ප්‍රජා සහභාගීත්වය සහිතව පරිසර පද්ධතීන් නැවත ස්ථාපනය කිරීම | ගො.සං./ පරිසර නිලධාරි - CSIAP | ජ.ක.වි - CSIAP | 0.50 | | ▬ | ▬ | ▬ | | |
| | 3.2 | පරංගියවාඩිය වැව ඉහත්තෑවේ නිකවැව ප්‍රවේශ මාර්ගය අද්දර ඇති කසල බැහැර කරන ස්ථානය පිරිසිදු කර පුවරු යොදා සංරක්ෂණය කිරීම. | ප.සං.නිලධාරි හා කෘ.ප.නි.ස | ගො.ජ.ප්‍රා.නි. - පරංගියවාඩිය/ ආ.සං.හැ.වි.වි - CSIAP | 0.03 | | | ▬ | ▬ | | |
| 4 | වාරි නිර්මිත (අමුණු කීපයක්ද සහිතව) දුර්වල වීම නිසා කාර්යක්ෂම ජල කළමනාකරණයක් කිරීමට නොහැකි වීම හා ජලය ප්‍රමාණවත් නොවීම. | | | | | | | | | | |
| 4.1 | නිකවැව දකුණු සෙරොව් ඇලවේලි (ව්‍යාපෘතිය මගින් පුනරුත්ථාපනය කරන ලද) වලින් ජලය උතුරා යෑම නිසා ජල නාස්තිය සිදුවීම. | ඇලවේල්ල නිසි පරිදි ගැඹුර වැඩිකර පිලිසකර කිරීම | ගො.ජ.සං.දෙ./ ජල කළ.වි, - CSIAP | ආ.සං.හැ.වි.වි.- CSIAP | 2.00 | | | ▬ | ▬ | | |
| 4.2 | වැව උඩහවැව වාන තාවකාලිකව ලී දඩුවලින් සකස් කල එකක් වීම නිසා ජලය රඳවා ගැනීම දුෂ්කර වීම | වාන සකස් කිරීම | ගො.ජ.සං.දෙ./ ජල කළ.වි, - CSIAP | ආ.සං.හැ.වි.වි.- CSIAP | 2.00 | | | | ▬ | | |

Page 2

| No | උග්‍ර ගැටලුව | විසඳුම | විසඳුම ඉදිරිපත් කිරීමේ වගකිවයුතු සමාජිකයා | | දල ඇස්තමේ: රු.මි. | 2025 | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | ප්‍රධාන | සම්බන්ධීකරණ ය | | ජන | පෙබ | මාර් | අප්‍රේ | මැයි | ජුනි |
| 4.3 | කලුවාවල වම් සොරෙව්වේ මුල සිට මීටර 80 පමණ දුරකට ඇල වගුරු බිමක් හරහා දිවෙන නිසා ජලය කුඹුරු දක්වා ගෙන යාම දුෂ්කර වී තිබීම | කොන්ක්‍රීට් ඇලක් සකස් කර සෙරොව්වෙන් නිකුත් කරන ජලය සෘජුව ඇලට සම්බන්ධ කිරීම | ගො.ජ.සං.දෙ./ ජල කළ.වි, - CSIAP | ආ.සං.හැ.ව.වි.- CSIAP | 3.00 | | | | | | |
| 4.4 | පරංගියවාඩිය හා කලුවාවල ජලබස්නා ඇලවල් හරස් කර සකස් කර ඇති අමුණු විනාශව පැවතීම හෝ ඒවා තාවකාලිකව සකස් කර තිබීම නිසා නඩත්තුව අපහසු වීම. | තාවකාලිකව සකස් කර ඇති අමුණු 3 ස්ථිර අමුණු ලෙස සකස් කිරීම | ගො.ජ.සං.දෙ./ ජල කළ.වි, - CSIAP | ආ.සං.හැ.ව.වි.- CSIAP | 6.00 | | | | | | |
| 4.5 | පරංගියවාඩිය වාන් වතුර කලුවාවල වැවේ වාන හරහා ගලායාම නිසා පහල වී වගාබිම් නිතර විනාශයට පත්වීම. | කලුවාවල වාන් මට්ටමට මි.මී. 1000 පමණ ගැඹුරින් මාර්ලය අසල දොරවල් සහිතව නිර්මිතයක් ඉදිකර කලුවාවල වැඩි ජලය බ්‍රහ්මණයාගම වැවට ලබාගැනීම | ගො.ජ.සං.දෙ./ ජල කළ.වි, - CSIAP | ආ.සං.හැ.ව.වි.- CSIAP | 4.00 | | | | | | |
| 4.6 | වැව උඩහවැව වැව් බැම්මේ දකුණුපස කොටසේ බැම්ම දුරුවලව පැවතීම | බැම්ම පස් යොදා පිළිසකර කිරීම | ගො.ජ.සං.දෙ./ ජල කළ.වි, - CSIAP | ආ.සං.හැ.ව.වි.- CSIAP | 0.30 | | | | | | |
| 4.7 | කලුවාවල වැව ඇලවේලි පුනරුත්ථාපනය නිසි ප්‍රමිතියෙන් සිදුනොවීම නිසා කෙටිකලකින් පද්ධතිය විනාශ වී තිබීම | ඇලවේලි නැවත ගොවීන්ගේ ශ්‍රම දායකත්වය ලබාගෙන පිළිසකර කිරීම | ගො.ජ.සං.දෙ./ ජල කළ.වි, - CSIAP | ආ.සං.හැ.ව.වි.- CSIAP | 4.00 | | | | | | |
| 4.8 | නිකවැව දක්වා දිවෙන මාර්ග පද්ධතිය දැඩි අබලන් තත්වයේ පැවතීම | මාර්ගය පිළිසකර කිරීම | ගො.ජ.සං.දෙ./ ජල කළ.වි, - CSIAP | ආ.සං.හැ.ව.වි.- CSIAP | 2.00 | | | | | | |
| | | **එකතුව** | | | **26.48** | | | | | | |

Page 3

## 07. ඇමුණුම්

ඇමුණුම් 01 - ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් එල්ලංගා කලමණාකරන කමිටු පිහිටුවීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති 2023.08.03 දිනැති අංක 6/ 2023 දරන චක්‍ර ලේඛය

**ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව**
**கமநல அபிவிருத்தித் திணைக்களம்**
**DEPARTMENT OF AGRARIAN DEVELOPMENT**

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | 7/3/9/CMC/2023 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2023.08. 03 |

චක්‍රලේඛ අංකය - 06/2023

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් සහ ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

<u>එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු පිහිටුවීම හා පවත්වා ගෙන යාම.</u>

**<u>Cascade Management Committee (CMC) Establishment & Continuity</u>**

රට අභ්‍යන්තරයේ සිට මුහුදට ගලා බසින ප්‍රධාන ගංගා (Rivers) තෘතියික ජල මාර්ග ලෙසත්, එම ප්‍රධාන ගංගා වලට එකතුවන අතු ගංගා (Tributarite) ද්විතීක ජල මාර්ග ලෙසත්, එම අතු ගංගා වලට ජලය සපයන කුඩා ජල මාර්ග (Small water ways) ප්‍රාථමික ජල මාර්ග ලෙසත් හැඳින්වේ. ග්‍රාමීය වැව් හා අමුණු වැඩි ප්‍රමාණයක් ප්‍රාථමික ජල් මාර්ග හරහා ඉදිකර ඇති අතර භූමිය මතුපිට ජලය රඳවා කර පහළට ගලා යාමට සැලැස්වීමට සකස් කර ඇති වැව් ද මීට ඇතුළත් වේ.

02. මෙරට අභ්‍යන්තරයේ පවතින ප්‍රාථමික ජල මාර්ගයක් හෝ ප්‍රාථමික ජල මාර්ග පාලයක පිහිටා ඇති, ජල විද්‍යාත්මක විශයෙන් එකට බැඳුණු කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ වැව් පද්ධති හෝ වැව් හා අමුණු පද්ධති හෝ අමුණු පද්ධති වලින් සමන්විත, මධ්‍යම ප්‍රමාණයේ ජල පෝෂක ප්‍රදේශයක් (Meso-catchment) එල්ලංගා පද්ධතිය ලෙස හැඳින්වේ.

03. ශ්‍රී ලංකාවේ එල්ලංගා පද්ධති 1166 ක් දැනට හඳුනාගෙන ඇත. මෙම එල්ලංගා පද්ධති ආශ්‍රිතව භූ විද්‍යාත්මක, ජල විද්‍යාත්මක, පරිසර විද්‍යාත්මක සහ සමාජ ආර්ථික ප්‍රගමණය උදෙසා සම්පත් භාවිතය කාර්යක්ෂමව හා තිරසරව පවත්වාගෙන යාම ඉලක්ක කරගනිමින් 1968 අංක 48 දරන වාරිමාර්ග (සංශෝධන) පනත මගින් සංශෝධිත 1946 අංක 32 දරන වාරිමාර්ග ආඥා පනතේ 1 (අ) 1, 2, 3, 4 වගන්ති ප්‍රකාරව ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් වෙත පැවරී ඇති බලතල අනුව සහ උක්ත පනත යටතේ පවත්වනු ලබන දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවේදී වාරි කර්මාන්ත ආශ්‍රිත වී වගාව ඇතුළු කෘෂිකර්මයට බලපාන හෝ අනුෂාංගික සියලු කරුණු සම්බන්ධව කටයුතු කිරීමට උක්ත පනතෙන් ඔබ වෙත පැවරී ඇති බලතල අනුව එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු [Cascade Management Committee (CMC)] පිහිටුවීම හා පවත්වාගෙන යාම සම්බන්ධයෙන් කෘෂිකර්ම කමිටුවේදී සමාලෝචනය කරන ලෙසත් ඊට පහත සඳහන් කරුණු මාර්ගෝපදේශ විශයෙන් යොදාගන්නා ලෙසත් කාරුණිකව දන්වා සිටිමි.

<u>3.1. එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු පිහිටුවීමේ පරමාර්ථ</u>

i. එල්ලංගාවක පිහිටි සියලු ස්වාභාවික සම්පත්, එනම් පස, ජලය, වන සම්පත, ජෛව පද්ධති, අමුණු හා වාරිමාර්ග පද්ධති කළමනාකරණය කිරීම සඳහා ප්‍රතිලාභීන් සහ අදාළ රාජ්‍ය නිලධාරීන් ඒකාබද්ධ ප්‍රවේශයකින් කටයුතු කිරීම සඳහා ආයතනික ව්‍යුහයක් සකස් කිරීම.

ii. වාරි කෘෂිකර්මය, පශු සම්පත් කටයුතු සහ විවිධ පිවර කර්මාන්තය, සඳහා ජලය සැපයීම, වන සම්පත හා වන ජීවී පද්ධතිය තුලනාත්මකව පවත්වාගෙන යාම, භූගත ජල මට්ටම ප්‍රශස්ත ලෙස පවත්වාගෙන යාම, මෙහිනු වගාව ඇතුළු ගෘහස්ථ ජල පරිභෝජනයන් විධිමත් ලෙස කළමනාකරණය කිරීම.

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, අංක 42, ශ්‍රීමත් මාර්කස් ප්‍රනාන්දු මාවත, තැ. පෙ. 537, කොළඹ 07.
கமநல அபிவிருத்தித் திணைக்களம், இல. 42, சேர் மார்கஸ் பெர்னாண்டோ மாவத்தை, த. பெ. 537, கொழும்பு 07.

iii. කෘෂිකාර්මික කටයුතු සඳහා ජලය භාවිතා කරන්නන් ඇතුළුව එල්ලංගා පද්ධතිය නඩත්තු කිරීම සඳහා අනෙකුත් පරිශීලකයන්ගේ සහ පාර්ශවකරුවන්ගේ දායකත්වය ලබාගැනීම.

## 3.2. එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු පිහිටුවීමේ අරමුණු

i. එල්ලංගා පද්ධති කළමනාකරණය හා තිරසර පැවැත්ම සඳහා නීතිමය පිළිගැනීමක් සහිත ආයතනික ව්‍යුහයක් ඇති කිරීම.
ii. එක් එක් එල්ලංගා පද්ධති වලට අදාළව එහි ක්‍රියාකාරීත්වයට හා තිරසර පැවැත්මට අදාළ වන ගැටළු හා යෝජිත විසඳුම් ඒකාබද්ධ ප්‍රවේශයකින් යුක්තව සාකච්ඡා කර නීතිමය වශයෙන් පිළිගත් ක්‍රමවේදයක් ඇති කිරීම.
iii. එල්ලංගා පද්ධතිය තුළ පිහිටි වාරි කෘෂිකාර්මික, ජල කළමනාකරණ, පාරිසරික, සමාජ ආර්ථික හා භූ විද්‍යාත්මක සාධක පද්ධතියේ මනා ක්‍රියාකාරීත්වය සඳහා අඛණ්ඩව හා සක්‍රියව පවත්වාගෙන යාමට ක්‍රමවේදයක් ඇති කිරීම.
iv. එල්ලංගා පද්ධතියේ සංවර්ධන කටයුතු වලදී, මුළු පද්ධතියට සිදුවන හායනයන් වලක්වා ගනිමින් අවශ්‍යතා තහවුරු කිරීම, ජල සම්පත් කාර්යක්ෂමව පරිහරණය සඳහා වගා කන්න පදනම් කර ගනිමින් සැලසුම් සකස් කිරීම.
v. එල්ලංගා පද්ධතිය සඳහා ඒකාබද්ධ කෘෂිකාර්මික නිෂ්පාදන සැලැස්මක් සකස් කිරීම හා එම සැලැස්මේ ක්‍රියාත්මක තත්ත්වය පසුවිපරම කිරීම.
vi. එල්ලංගා පද්ධතියක පැවතිය යුතු අංගෝපාංග ප්‍රතිස්ථාපනය සඳහා අවශ්‍ය කටයුතු කිරීම.
vii. එල්ලංගා පද්ධති හා බැඳුනු සමාජ ආර්ථික සම්බන්ධතා ආරක්ෂා කිරීම හා ඒ පිළිබඳව පාර්ශවකරුවන් දැනුවත් කිරීම

## 3.3. එල්ලංගා පද්ධති කලමනාකරණ කමිටුවේ කාර්යභාරය

i. එල්ලංගා පද්ධතිය සඳහා වන සැලසුම් සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පසුවිපරම් කිරීම.
ii. එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු සාමාජිකයන් විසින් ඉදිරිපත් කරනු ලබන ගැටලු, යෝජනා සහ සැලසුම් සඳහා විසඳුම් ලබාදීම සහ විසඳිය නොහැකි ගැටලු අදාළ වන පරිදි ප්‍රාදේශිය / දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව වෙත යොමු කර විසඳා ගැනීම.
iii. එල්ලංගා පද්ධති කලමනාකරණයට අදාල වාර්තාවක් අවස්ථානුකූලව ප්‍රාදේශිය / දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව වෙත ඉදිරිපත් කිරීම.
iv. ග්‍රාමීය වැව් එල්ලංගාවන් තුළ පිහිටි සියලුම ජල මූලාශ්‍ර හා ජල පාරිභෝගිකයින් එක්ව එල්ලංගාව අයත් මධ්‍යම ජල පෝෂක ප්‍රදේශය (Meso-Catchment) සඳහා ඒකාබද්ධ කෘෂිකාර්මික සැලැස්මක් පිළියෙල කොට ක්‍රියාත්මක කිරීම.
v. එල්ලංගාවක් තුළ කටයුතු කරන සියලුම ජල පාරිභෝගිකයන්ගේ අවශ්‍යතා අනුව ජල පෝෂක ප්‍රදේශය තුළ පවතින ස්වභාවික සම්පත් කළමනාකරණයට අදාළ තීරණ ගැනීම හා ක්‍රියාත්මක කිරීම.
vi. ස්වභාවික ආපදා, ව්‍යසන හා හානිකර මානව ක්‍රියාකාරකම් අවම කරගැනීමට හැකිවන පරිදි සියලු ජල මූලාශ්‍ර කළමනාකරණය කිරීම.
vii. එල්ලංගාව තුළ පිහිටි සියලු ජල මූලාශ්‍ර ආශ්‍රිත ජල පාරිභෝගිකයන් අතර කාර්යක්ෂම තොරතුරු සන්නිවේදන ක්‍රමයක් ස්ථාපිත කිරීම.
viii. එල්ලංගාව තුළ ඇති පරිසර පද්ධති වලට අදාළ යෙදවුම් හා නිමවුම් ප්‍රශස්ත ලෙස කළමනාකරණය සඳහා විධිමත් ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම.
ix. පවතින හා ඉදිරියේදී ඇතිවිය හැකි බවට අනාවැකි පල කරන දේශගුණික විචලනයන් සඳහා යෝග්‍ය වූ දේශගුණික සුහුරු උපායමාර්ගික සැලසුම් ක්‍රියාවට නැංවීම සහ ජල පාරිභෝගිකයන් එවැනි දේශගුණික අනුගත වීම් වලට හුරු කිරීම.
x. එල්ලංගා පද්ධතිය තුළ ජල පාරිභෝගිකයන් අතර දැනුම, ආකල්ප, කුසලතාවයන් සහ සම්පත් ඵලදායී ලෙස හුවමාරු කරගැනීම.
xi. ජල පාරිභෝගියන්ගේ ඉඩම්, ජලය හා පරිසර පද්ධතිවල ඵලදායිතාවය ඉහළ නැංවීමට කටයුතු කිරීම.

xii. කෘෂිකර්මයට හා ජල පරිභෝජනයට අදාළ වන පරිසර පද්ධති හා සම්බන්ධ සාම්ප්‍රදායික නීති හා පනවන ලද නීති බලාත්මක කිරීමට අවශ්‍ය සහය ලබා දීම.

xiii. ඉඩම් හිමි ගොවීන්ගේ හා බුක්තිකරුවන්ගේ රැස්වීම (වගා කන්න රැස්වීම) පැවැත්වීම සඳහා අවශ්‍ය මූලික තීරණ ගැනීමට ගොවීන්ට සහාය වීම, ඊට අදාල සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම සහ පසුවිපරම් කිරීම.

xiv. එල්ලංගා පද්ධති බල ප්‍රදේශය තුළ සියලු ජල මූලාශ්‍ර සහ ඊට අනුබද්ධ අනිකුත් පරිසර පද්ධති වල තිරසර බව සඳහා අදාල රාජ්‍ය ආයතනවල මඟ පෙන්වීම හා උපදෙස් අනුගමනය කරමින් සංරක්ෂණය කරවීමට ක්‍රියාමාර්ග ගැනීම.

xv. එල්ලංගා පද්ධතියට හානිකරන පාර්ශවයන්ට එරෙහිව නීතිමය පියවර ගැනීමට අවශ්‍ය කටයුතු කිරීම.

xvi. එල්ලංගා පද්ධතියේ සැම සංවර්ධන ක්‍රියාවලියකදීම ඒ සඳහා ක්‍රියාකාරී ලෙස දායකත්වය ලබාදීම හා ප්‍රගති සමාලෝචනය කිරීම.

xvii. එල්ලංගා පද්ධතියේ වාරි කර්මාන්ත වල කන්න රැස්වීම් තීරණ ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය පසුවිපරම් කිරීම.

xviii. එල්ලංගා පද්ධතියේ වාරි කර්මාන්ත වල මෙහෙයුම් හා නඩත්තු වැඩසටහන පසුවිපරම් කිරීම.

## 3.4. එල්ලංගා පද්ධති කලමණාකරණ කමිටුවේ සංයුතිය

### 3.4.1 ප්‍රාදේශීය මට්ටම

මෙම කමිටුව අදාල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ පහත නිලධරයන්ගෙන් සමන්විත වේ.

i. ප්‍රාදේශීය ලේකම්
ii. ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරි
iii. කෘෂිකර්ම උපදේශක
iv. පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් ඉංජිනේරු / තාක්ෂණික නිලධාරි
v. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් ප්‍රාදේශීය ඉංජිනේරු / තාක්ෂණික නිලධාරි
vi. කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර
vii. ග්‍රාම නිලධාරි
viii. සමෘද්ධි සංවර්ධන නිලධාරි
ix. ආර්ථික සංවර්ධන නිලධාරි
x. ඉඩම් පරිහරණ හා ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
xi. පළාත් ධීවර දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
xii. ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ නියෝජිතයෙකු
xiii. පරිසර අධිකාරියේ නියෝජිතයෙකු
xiv. පොලිස් පරිසර ඒකකයේ නියෝජිතයෙකු
xv. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
xvi. කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ නියෝජිතයෙකු
xvii. වාරි මාර්ග ඉංජිනේරු/තාක්ෂණ නිලධාරි
xviii. වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
xix. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
xx. භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශයේ නියෝජිතයෙකු
xxi. ජාතික ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලයේ නියෝජිතයෙකු
xxii. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
xxiii. සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
xxiv. පළාත් පාලන ආයතන නියෝජනය කරමින් බලයලත් නිලධරයකු
xxv. ගොවි සංවිධාන, කාන්තා ගොවි සංවිධාන, නිෂ්පාදන ගොවි සංවිධාන නියෝජනය කරමින් එක් එක් ගොවි සංවිධානයේ සභාපති හෝ ලේකම්
xxvi. ප්‍රජා ජල සංවිධානයක නියෝජිතයෙක්

**xxvii.** වෙනත් ප්‍රජා සංවිධාන හා පරිසර සංවිධාන නියෝජනය කරමින් එක් සංවිධානයකින් එක් නියෝජිතයෙකු

3.4.2.<u>දිස්ත්‍රික් මට්ටම</u>

මෙම කමිටුව අදාල දිස්ත්‍රික්කයේ පහත නිලධරයන්ගෙන් සමන්විත වේ.

i. දිසාපති හෝ දිස්ත්‍රික් ලේකම්
ii. ප්‍රාදේශීය ලේකම්
iii. ගොවිජන සංවර්ධන නියෝජ්‍ය / සහකාර කොමසාරිස්
iv. පළාත් පාලන ආයතන නියෝජනය කරමින් පළාත් පාලන සහකාර කොමසාරිස් හෝ නියෝජිතයෙකු
v. දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂක
vi. පළාත් හා අන්තර් පළාත් නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂකවරුන්
vii. වාරි මාර්ග අධ්‍යක්ෂක හෝ ප්‍රධාන ඉංජිනේරු
viii. පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් නියෝජ්‍ය අධ්‍යක්ෂක හෝ නියෝජිතයෙකු
ix. ඉඩම් පරිහරණ හා ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂක හෝ දිස්ත්‍රික් භාර නිලධාරී
x. පළාත් ධීවර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක හෝ නියෝජිතයෙකු
xi. ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ සහකාර අධ්‍යක්ෂක හෝ දිස්ත්‍රික් භාර නිලධාරී
xii. පරිසර අධිකාරියේ දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂක හෝ දිස්ත්‍රික් භාර නිලධාරී
xiii. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂක හෝ නියෝජිතයෙකු
xiv. කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ සහකාර අධ්‍යක්ෂක හෝ නියෝජිතයෙකු
xv. වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂක හෝ දිස්ත්‍රික් භාර නිලධාරී
xvi. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ දිසා වන නිලධාරී හෝ නියෝජිතයෙකු
xvii. ජාතික ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලයේ දිස්ත්‍රික් භාර නිලධාරී හෝ ඉංජිනේරු
xviii. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂක හෝ දිස්ත්‍රික් භාර නිලධාරී
xix. භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශයේ නියෝජිතයෙකු
xx. ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී
xxi. පොලිස් පරිසර ඒකකයේ ස්ථාන භාර නිලධාරී
xxii. සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
xxiii. දිස්ත්‍රික් ගොවි සංවිධාන බලමණ්ඩලය නියෝජනය කරමින් සභාපති / ලේකම් හෝ නියෝජිතයෙකු
xxiv. ප්‍රජා ජල සංවිධාන භාර නිලධාරී හෝ දිස්ත්‍රික් නියෝජිතයෙකු
xxv. වෙනත් ප්‍රජා සංවිධාන හා පරිසර සංවිධාන වල දිස්ත්‍රික් මට්ටම නියෝජනය කරමින් එක් සංවිධානයකින් එක් නියෝජිතයෙකු

***සැ:යු :-*** ***එල්ලංගා පද්ධති බලප්‍රදේශ සීමාව තුළ අදාළ ආයතනයේ බල ප්‍රදේශ එකකට වැඩි ගණනක් පවතින අවස්ථාවක දී එම එක් එක් බල ප්‍රදේශය නියෝජනය කරමින් ඉහත අනුව බලයලත් නිලධාරීන් සහභාගී විය යුතුය.***

**<u>3.5. එල්ලංගා පද්ධති කලමණාකරණ කමිටුවක නිලධාරී මණ්ඩලය - ප්‍රාදේශීය මට්ටම</u>**

i. එල්ලංගා පද්ධතියට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස එකකට වැඩි ගණනක් පවතින අවස්ථාවක දී සහභාගී වන සෑම ප්‍රාදේශීය ලේකම්වරයෙක්ම කමිටුවේ සම සභාපති ලෙස නිල වශයෙන් කටයුතු කළ යුතුය.

ii. එල්ලංගා පද්ධතියට අදාල ගොවිජන සේවා බල ප්‍රදේශයේ ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරි කමිටුවේ ලේකම් ලෙස නිල වශයෙන් කටයුතු කළ යුතුය. එල්ලංගා පද්ධතියට ගොවිජන සේවා බල ප්‍රදේශ එකකට වැඩි ගණනක් පවතින අවස්ථාවන්හි දී වැඩි පෝෂිත අක්කර ගණනක් පවතින බල ප්‍රදේශයේ ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරි ලේකම් ලෙස කටයුතු කළ යුතුය.

iii. කමිටුවේ සභාපතිවරයාගේ උපදෙස් පරිදි ලේකම්වරයා විසින් රැස්වීම් කැඳවීම සිදු කළ යුතුය.

**<u>3.6. එල්ලංගා පද්ධති කලමණාකරණ කමිටුවක නිලධාරී මණ්ඩලය - දිස්ත්‍රික් මට්ටම</u>**

i. එල්ලංගා පද්ධතියට දිස්ත්‍රික් එකකට වැඩි ගණනක් පවතින අවස්ථාවක දී සහභාගී වන සෑම දිස්ත්‍රික් ලේකම්වරයෙක්ම කමිටුවේ සම සභාපති ලෙස නිල වශයෙන් කටයුතු කළ යුතුය.

ii. එල්ලංගා පද්ධතියට අදාළ දිස්ත්‍රික් නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරුන් කමිටුවේ ලේකම් ලෙස නිල වශයෙන් කටයුතු කළ යුතුය. එල්ලංගා පද්ධතියට ගොවිජන සේවා බල ප්‍රදේශ එකකට වැඩි ගණනක් පවතින අවස්ථාවන්හි දී වැඩි පෝෂිත අක්කර ගණනක් පවතින දිස්ත්‍රික් නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරුන් ලේකම් ලෙස කටයුතු කළ යුතුය.

iii. කමිටුවේ සභාපතිවරයාගේ උපදෙස් පරිදි ලේකම්වරයා විසින් රැස්වීම් කැඳවීම සිදු කළ යුතුය.

04. ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තයේ තිරසර බව රඳා පවතින ප්‍රධාන අංගයක් වන ජෛව පද්ධති කළමනාකරණය සඳහා එල්ලංගා වාරිමාර්ග කළමනාකරණය විධිමත් කිරීම සඳහා පිහිටුවනු ලබන එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු [Cascade Management Committee (CMC)] තුළින් අපේක්ෂිත කාර්යභාරය ඉටුකරගැනීම සඳහා ඒකාබද්ධ ප්‍රවේශයකින් කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කරමි.

ඒ.එච්.එම්.එල්.අබේරත්න
ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්

පිටපත් :-

i. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශීය කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
ii. ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය
iii. සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්
iv. විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය
v. පොලිස්පති, ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව
vi. අධ්‍යක්ෂ ජනරාල්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
vii. අධ්‍යක්ෂ ජනරාල්, වාරිමාර්ග දෙපාර්තමේන්තුව
viii. අධ්‍යක්ෂ ජනරාල්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
ix. අධ්‍යක්ෂ ජනරාල්, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
x. වන සංරක්ෂක ජනරාල්, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

xi. අධ්‍යක්ෂ ජනරාල්, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
xii. අධ්‍යක්ෂ ජනරාල්, ඉඩම් පරිහරණ හා ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව
xiii. අධ්‍යක්ෂ ජනරාල්, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
xiv. අධ්‍යක්ෂ ජනරාල්, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව
xv. අධ්‍යක්ෂ ජනරාල්, ජලජීවී වගා සංවර්ධන අධිකාරිය
xvi. අධ්‍යක්ෂ ජනරාල්, මධ්‍යම පරිසර අධිකාරිය
xvii. අධ්‍යක්ෂ ජනරාල්, භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශය
xviii. සභාපති, කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය
xix. සමාන්‍යාධිකාරී, ජාතික ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලය
xx. සියලුම පළාත් ලේකම් වරුන්, පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය
xxi. ලේකම්, පළාත් වාරිමාර්ග අමාත්‍යාංශය
xxii. සියලුම පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂකවරුන්, පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
xxiii. සියලුම පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂකවරුන්, පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
xxiv. ව්‍යාපෘති අධ්‍යක්ෂකවරුන් - CSIAP/ CRIWMP/ SARP
xxv. සියලුම ගොවිජන සංවර්ධන නියෝජ්‍ය/සහකාර කොමසාරිස් වරුන්

(කාරුණික දැනගැනීමට සහ අවශ්‍ය කටයුතු සඳහා)

6

## ඇමුනුම් 2:

## එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු පිහිටුවීම පිළිබඳ කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කල ලිපිය

කෘෂිකර්ම අමාත්‍යාංශය
கமத்தொழில் அமைச்சு
Ministry of Agriculture

80/5 ,"ගොවිජන මන්දිරය", රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
80/5, "கொவிஜன மந்திரய",ரஜமல்வத்தை ஒழுங்கை,பத்தரமுல்லை, இலங்கை.
80/5 ,"Govijana Mandiraya", Rajamalwatta Lane, Battaramulla, Sri Lanka.

2.07. 21

මගේ අංකය. / எனது இல. / My No. 8/1/1/5/CSIAP/Cascade Mgt.
ඔබේ අංකය. / உமது இல. / Your No.
දිනය. / திகதி. / Date. 202

[illegible] ප්‍රාදේශීය [illegible]
මලය, මඩකලපුව,
දිස්ත්‍රික් ලේකම්/අනුරාධපුර, පොලොන්නරුව, මුලතිව්, කිලිනොච්චිය, වවුනියාව, ත්‍රිකුණා
අම්පාර, කුරුණෑගල, මොනරාගල, හම්බන්තොට,
කොමසාරිස් ජනරාල්, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව,
[illegible]
අධ්‍යක්ෂ ජනරාල්, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව,
අධ්‍යක්ෂ ජනරාල්, වාරි මාර්ග දෙපාර්තමේන්තුව,
අධ්‍යක්ෂ ජනරාල්, භූ විද්‍යා හා පතල් කැනීම් කාර්යාංශය,
සභාපති, ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය.

**ාකරණ කමිටු පිහිටුවීම** **දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය යටතේ එල්ලංගා පද්ධති කළම**

කළමනාකරණය සඳහා, හැකි සෑම
ාරයට වාරිමාර්ග ඉදිකර ඇති, කිසියම් ජල
ලෙස හඳුන්වනු ලබයි. මෙවැනි එල්ලංගා
ූ ආයතන හා ප්‍රතිලාභීන් එක්ව ඒකාබද්ධ
ියේ එම සංකල්පයෙන් බැහැරව එක් එක්
ාරන බව පෙනේ. මේ නිසා පද්ධතියේ පිහිටි පොදු
ාශ්‍රිත පරිසර පද්ධතිය ක්‍රමානුකූලව විනාශයට පත්

උපරිම කාර්යක්ෂමතාවයකින් යුක්තව ජලය පරිහරණය කිරීම හා සම්පත්
විටම එක වැවකින් අනෙක් වැවට ජලය ලබා ගත හැකි වන ආකා
ද්‍රෝනියක එකිනෙකට සම්බන්ධිත වැව් පද්ධතියක් එල්ලංගා
පද්ධතියක් එම පරිපාලන බල ප්‍රදේශය තුල කටයුතු කරන සියලු
ප්‍රවේශයකින් යුක්තව කළමනාකරණය කල යුතු වුවද, වර්තමාන
ආයතන විසින් වෙන් වෙන්ව විවිධ සංවර්ධන කටයුතු සිදු ක
සම්පත් හායනයට ලක් වූ අතර එහි ප්‍රතිපලයක් ලෙස වැව් ඒ
විය.

ාධාර මත ක්‍රියාත්මක කරනු ලබන දේශගුණ සුහුරු වාරි
ා සියලුම සංවර්ධන කටයුතු එල්ලංගා පද්ධති මූලික කර
ම ප්‍රවේශය උක්ත ව්‍යාපෘතිය මගින් නැවත හඳුන්වාදීමට
ා සම්පත් කළමනාකරණය සඳහා මෙන්ම එල්ලාංගාවක
ාදා ගැනීම ඉතාමත් වැදගත් වන බව නිරීක්ෂණය කරමි. එබැවින්
ිකර්ම ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වන එල්ලංගා පද්ධතිවලට
ානම් කරගෙන දිවයිනේ අනෙකුත් ප්‍රදේශ වලට ද ව්‍යාප්ත කිරීමට

කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් ලෝක බැංකු ණය අ
කෘෂිකර්ම ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කරනු ලබ
ගනිමින් සිදුකිරීමට කටයුතු සැලසුම් කර ඇත. මෙ
කටයුතු කරනු ලැබුවද සියලුම වාරි කර්මාන්ත ආශ්‍රි
තිරසාර පැවැත්ම සඳහා ද මෙම ප්‍රවේශය යො
මෙම සංකල්පය දේශගුණික සුහුරු වාරි කෘෂි
හඳුන්වා දී ඒ තුලින් ලබාගන්නා අත්දැකීම් පද
මෙම අමාත්‍යාංශය විසින් යෝජනා කෙරේ.

ාභාවික සම්පත්, එනම් පස, ජලය, වන සම්පත්, ඉඩම්, ඒකාබද්ධ
ාය කිරීම සඳහා ප්‍රතිලාභීන්ගෙන් සහ අදාළ රාජ්‍ය නිලධාරීන්ගෙන්
රණ කමිටු පිහිටුවීමට ව්‍යාපෘතිය අපේක්ෂා කරයි. මෙම එල්ලංගා පද්ධති
[illegible]

තවද, එල්ලාංගාවක පිහිටි සියලු ස්
ප්‍රවේශයකින් යුක්තව කළමනාකරණ
සමන්විත එල්ලංගා පද්ධති කළමනාක
[illegible]

2034340 කාර්යාලය දුරකථන தொலைபேசி Telephone - 011-2034300
ary@agrimin.gov.lk அலுவலகம் ඊ-මේල් மின்னஞ்சல் e-mail - info@agrimin.gov.lk
11-2863497 Office ෆැක්ස් தொலைநகல் Fax - 011-2868910

ලේකම් දුරකථන தொலைபேசி Telephone - 011-
செயலாளர் ඊ-මේල් மின்னஞ்சல் e-mail - secret
Secretary ෆැක්ස් தொலைநகல் Fax - 0

I. බල ප්‍රදේශයේ සියලුම ආයතන හා ප්‍රතිලාභීන් එක්ව ඒකාබද්ධ ප්‍රවේශයකින් යුක්තව එල්ලාංගාවේ සම්පත් කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය තීරණ ගැනීම, එම තීරණ ක්‍රියාත්මක කිරීමේ තත්වය පසු විපරම් කිරීම හා ඒ අනුව අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කිරීම

II. බල ප්‍රදේශයේ සම්පත් පරිහරණය කරනු ලබන විවිධ පාර්ශව අතර සහජීවනය ගොඩ නැගීම.

III. පද්ධතියේ සිදුවන සම්පත් හායනය වළක්වා ගැනීමට කටයුතු කිරීම

IV. පද්ධතියේ ජල සම්පත් කාර්යක්ෂම පරිහරණය සඳහා සෑම කන්නයකම [illegible] පැවැත්වීම.

V. බල ප්‍රදේශය සඳහා කෘෂිකර්ම නිෂ්පාදන සැලැස්මක් සැකසීම හා එම සැලැස්ම ක්‍රියාත්මක තත්වය පසු විපරම් කිරීම.

VI. [illegible]

VII. වැව් මට්ටමින් ක්‍රියාත්මක වාරිමාර්ග නඩත්තු කටයුතු වල තත්වය පසු විපරම් කිරීම.

VIII. ජල ධාරා ප්‍රදේශ කළමනාකරණය සඳහා වැඩසටහන් හඳුන්වා දීම හා ඒ පිළිබඳ පසුවිපර

IX. මාසිකව පැවැත්වෙන ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටුවට වාර්තාවක් ඉදිරිපත් කිරීම.

එබැවින් එල්ලංගා පද්ධතිය තුලට අයත් බල ප්‍රදේශයේ සියලු රාජ්‍ය හා පෞද්ගලික ඇ
එල්ලංගා පද්ධති කළමනාකරණයට දායක කරවා ගැනීම සඳහා අවස්ථානුකූලව
නියෝජිතයන්ගෙන් සමන්විත එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටුවක් පිහිට වීමට තී

I. බල ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්ගේ නියෝජිතයෙකු

II. ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී

III. බල ප්‍රදේශයේ අන්තර් පළාත් හෝ පළාත් කෘෂිකර්ම දෙපාර් ලබන කෘෂිකර්ම උපදේශකවරු

IV. පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව නියෝජනය කරමින්

V. බල ප්‍රදේශයේ වාරි මාර්ග ඉංජිනේරුගේ නියෝජිතයකු ( ගැනෙන වැව් බල ප්‍රදේශයට අයත් නම්)

VI. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව නියෝජනය කරමි

VII. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව නියෝජනය ක

VIII. භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යංශයේ නියෝජිත

IX. ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩල නියෙ

X. පළාත් පාලන ආයතන (ප්‍රාදේශීය සභා) නියෝජන

XI. බල ප්‍රදේශයේ පිහිටි ගොවි සංවිධාන නි අයෙකු බැගින් (සභාපති හෝ ලේකම් යන

XII. බල ප්‍රදේශයේ පිහිටි ග්‍රාමීය කමිටු නියෝජ බැගින්

XIII. බල ප්‍රදේශයේ පිහිටි අනෙකුත් ප්‍රජා

ඒ අනුව, දේශගුණික සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘ
එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු සාමාජික
[illegible] නිලධාරීන සහභාගී කරවීමට අවශ්‍ය කටයුතු
ලබාදෙන ලෙස ඔබ දෙපාර්තමේන්තුවේ නිල

එම්. බී රෝහන පුෂ්පකුමාර්
ලේකම්
කෘෂිකර්ම අමාත්‍යාංශය

පිටපත : ව්‍යාපෘති අධ්‍යක්ෂ, දෙ

ු
:සවමක
කිරීමේ
ම් කිරීම.

ායතන සහ ප්‍රතිලාභීන්
පහත ආයතන වල
ීරණය කර ඇත.

ර්තමේන්තුවල සේවය කරනු

තාක්ෂණික නිලධාරියකු
වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතට

න් නියෝජිතයකු
රමින් නියෝජිතයකු
යකු
යෝජිතයකු
ය කරමින් නියෝජිතයකු
යෝජනය කරමින් එක් ගොවි සංවිධානයකින් එක්
දෙදෙනාගෙන් එක් අයෙකු)
ජනය කරමින් එක් කමිටුවකින් එක් නියෝජිතයකු

සංවිධාන නියෝජනය කරමින් එක් අයෙකු

තිය යටතේ එල්ලංගා පද්ධති මට්ටමින් පිහිටුවන ලබන
ින් ලෙස නම් කර ඇති ඔබ දෙපාර්තමේන්තුවේ අදාල
ු සිදු කරන ලෙසිති, මෙම කමිටු පිහිටුවම සඳහා අවශ්‍ය සහය
ධාරීන් දැනුවත් කරන ලෙසත් කාරුණිකව දන්වමි.

ේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය

**ඇමුණුම් අංක 03 - හරස්කඩ චාරිකාව සඳහා සහභාගී වූ හවුල්කාර ආයතනවල ලේඛණය**

1. හොරොව්පොතින ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
2. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
3. පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
4. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
5. ජාතික ජලජ ජීවී සංවර්ධන අධිකාරිය
6. සියඹලෑව ගොවි සංවිධානය
7. පට්ටියාවල ගොවි සංවිධානය
8. ඇටඋරුලෑව ගොවි සංවිධානය
9. නබඩවැව ගොවි සංවිධානය
10. ඉහලවැව ගොවි සංවිධානය
11. හොරනක්කාරයාගම ගොවි සංවිධානය
12. නාම්බාකඩ ගොවි සංවිධානය

**ඇමුණුම් අංක 04 - හොරොව්පොතාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2024 ඔක්. 22 වන දින පැවති එල්ලංගා කලමනාකරණ සැලැස්මට ඇතුලත් කිරීමට යෝජිත විසඳුම් පත්‍රිකා ඉදිරිපත් කිරීමේ සැසිය සඳහා සහභාගි වූ හවුල්කාර ආයතනවල ලේඛණය**

1. හොරොව්පොතින ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
2. පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
3. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
4. ජාතික ජලජ ජීවී සංවර්ධන අධිකාරිය
5. ප්‍රජා පොලිස් ඒකකය
6. වන සංරක්ෂණ දෙපාරතමේන්තුව
7. සියඹලෑව ගොවි සංවිධානය
8. පට්ටියාවල ගොවි සංවිධානය
9. ඇටඋරුලෑව ගොවි සංවිධානය
10. නබඩවැව ගොවි සංවිධානය
11. ඉහලවැව ගොවි සංවිධානය
12. හොරනක්කාරයාගම ගොවි සංවිධානය
13. නාම්බාකඩ ගොවි සංවිධානය